
DLB
DEVELOPMENT LOTTERIES
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
5
6
4
2024
වාර්ෂික වාර්තාව
ප්‍රගතියේ ශක්තිය,
වර්ධනයට කැපවීම



# ප්‍රගතියේ ශක්තිය, වර්ධනයට කැපවීම

පෙර නොවූ විරූ අභියෝග හමුවේ,
නව්‍යකරණය සහ අනුවර්තනය
වීමේ හැකියාව තුළින්
සංවර්ධන ලොතරැයි මණ්ඩලය
සාර්ථකව බාධක ජයගෙන ඇති අතර,
ස්වකීය උපාය මාර්ග අරමුණු
සාක්ෂාත් කර ගනිමින් විශිෂ්ටත්වය,
වර්ධනය සහ දිගු කාලීන තිරසර භාවය
සඳහා ඇති කැපවීම ශක්තිමත් කරගෙන ඇත.
2024 මූල්‍ය වර්ෂයේ අප ලබාගත් ජයග්‍රහණ
අපගේ ඔරොත්තු දීමේ හැකියාව,
නව්‍යකරණය,ප්‍රගතියේ ශක්තිය හා
වර්ධනයට කැපවීම පිළිබඳ තොරතුරු
අපි සාඩම්බරයෙන් ඉදිරිපත් කරමු.

# අන්තර්ගතය

ආයතනික තොරතුරු ..... 04
අපගේ දැක්ම සහ මෙහෙවර ..... 05
අපගේ ඉතිහාසයෙන් බිඳක් ..... 06
වැදගත් සංධිස්ථාන ..... 08
ප්‍රධාන මූල්‍ය තොරතුරු ..... 10
සභාපතිතුමාගේ පණිවුඩය සහ ප්‍රගති වාර්තාව 2024 ..... 12
අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය ..... 15
අධ්‍යක්ෂ මණ්ඩලය - 2024 ..... 17
වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය ..... 18
සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අධ්‍යක්ෂවරුන්ගේ පැතිකඩ 2024 ..... 19
කළමනාකරණ කණ්ඩායම ..... 26
කණිෂ්ඨ කළමනාකරුවන් ..... 27
මෙහෙයුම් සමාලෝචනය ..... 29
නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය ..... 33
තිරසාරභාවය පිළිබඳ වාර්තාව ..... 39
2024.12.31 දිනට අනුමත සේවක සංඛ්‍යා තත්වය ..... 49
ආයතනික පාලනය ..... 51
අවදානම් කළමනාකරණ වාර්තාව ..... 54
විගණන කමිටු වාර්තාව ..... 55

# මූල්‍ය වාර්තාව

ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව ..... 57
විගණක වාර්තාව 2024 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග ..... 70
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය ..... 85
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 86
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ..... 87
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ..... 88
ගිණුම්කරණ ප්‍රතිපත්ති ..... 89
කාණ්ඩ වාර්තාව ..... 94
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ..... 95
දස අවුරුදු සාරාංශය ..... 108
සංවිධාන සටහන ..... 109

# ආයතනික තොරතුරු

**මණ්ඩලයේ නම**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**නෛතික ස්වරූපය**
මෙම මණ්ඩලය 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත නැමති පාර්ලිමේන්තු පනත යටතේ සංස්ථාගත කර ඇත.

**ආරම්භ කළ දිනය**
1983 ජනවාරි 19

**ලියාපදිංචි කාර්යාලය**
අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යුනියන් පෙදෙස, කොළඹ 2

**දුරකථන අංක**
0112 333 546-8, 0114 824 824

**ෆැක්ස්**
0112 333 545

**විද්‍යුත් තැපෑල**
info@dlb.lk

**වෙබ් අඩවිය**
www.dlb.lk

**බදුගෙවන්නා හඳුනා ගැනීමේ අංකය**
409089844

**වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය**

| | |
|---|---|
| නීතිඥ හේමන්ත ස්වර්ණතිලක මහතා | - සභාපති/ප්‍රධාන විධායක නිලධාරී. |
| ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා | - ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්, අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය. |
| ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙනවිය | - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය. |
| ඒ. චානක්‍ය ලියනගේ මහතා | - අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය. |
| පී.ඒ.සී.කේ. කුමාර මහතා | - ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ, භාරකාර මණ්ඩල සාමාජික. අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය. |

**විගණක**
විගණකාධිපති

**බැංකුකරුවන්**
මහජන බැංකුව, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව

# අපගේ දැක්ම සහ මෙහෙවර

## දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම වාසනාව උදා කිරීමේ රාජ්‍ය ආයතනය බවට පත්වීම.

## මෙහෙවර

නවීන තාක්ෂණය යොදා ගනිමින්, නව්‍යතාවයෙන් යුතු ආකර්ෂණීය ලොතරැයිපත් ඉදිරිපත් කරමින් විශ්වාසය තහවුරු කරන අතරතුර සෑම කල්හිම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් සපුරාලීම.

# අභිමතාර්ථ

- වෙළඳපොළ කොටස වැඩි කර ගැනීම.
- ජනාධිපති අරමුදලට ලබා දෙනු ලබන දායකත්වය උපරිම කිරීම.
- නවීන තාක්ෂණය අත්කර ගැනීම සහ ඵලදායී ලෙස උපයෝගී කර ගැනීම.
- පාර්ශවකරුවන්ගේ අපේක්ෂාවන් ඉටු කිරීම.

# අපගේ මූලික සාරධර්ම

| | |
|---|---|
| **සුපිලිපන්බව** | අප විසින් ඉදිරිපත් කරනු ලබන ලොතරැයි සහ අප ව්‍යාපාර කටයුතුවල නිරත වන ආකාරය සාධාරණ, අවංක සහ විශ්වාසනීය වේ. |
| **සුභවාදී ආකල්පය** | ලොතරැයි ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී ඔවුන් හට මුහුණපෑමට සිදුවන සෑම අභියෝගයකටම සුභවාදී එළඹුමක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ පවතී. |
| **ප්‍රතිඵලදායක බව** | ස්වකීය කාර්යභාරයන් පිළිබඳව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් තුළ මනා විශ්වාසයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීම සඳහා නිසි අවධානයකින් යුතුව කටයුතු කරති. |
| **නව්‍යතාවය** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් ව්‍යාපාරික සංවර්ධනය සඳහා වන අදහස් සොයා යමින් තරගකාරී වෙළඳපොල වෙනස්වීම් හමුවේ කඩිනමින් ප්‍රතිචාර දක්වති. |
| **කණ්ඩායම් හැඟීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි ගෞරවය සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරාගැනීමෙහි ලා එකාවන්ව කටයුතු කරති. |
| **විශිෂ්ඨත්වය කරා නැඹුරුවීම** | සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සේවකයන් අඛණ්ඩවම සිය සේවා තත්ත්වයන් උපරිම මට්ටම කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති. |

# අපගේ ඉතිහාසයෙන් බිඳක් ...

රටේ ජනතාවට බලාපොරොත්තු ගෙන දෙන සංවර්ධන ලොතරැයි මණ්ඩලය 1983 වර්ෂයේදී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය යන නමින් ස්ථාපනය කරන ලදී. විවිධ අභියෝග මධ්‍යයේ උසස් අධ්‍යාපනයට යොමුවන සිසු දරුදැරියන්ට දැඩි අවශ්‍යතාවයක් වී ඇති මූල්‍ය සහයෝගය සපයා දීම සඳහා ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත අරමුදල් උත්පාදනය කර දීම එය පිහිටුවීමෙහි ප්‍රමුඛතම අරමුණ විය.

එම අරමුණ ඉටුකර ගැනීමට අමතරව, විවිධ මූල්‍ය හා සමාජ සංවර්ධන වැඩසටහන් වලට අරමුදල් සපයා දීමේ ස්ථිර ආදායම් මාර්ගයක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව ආචාර්ය වික්‍රම වීරසූරිය මහතා ක්ෂණික ලොතරැයි යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා පෞද්ගලික හා රාජ්‍ය ආයතන ගණනාවක සහාය ඉල්ලා සිටියේය.

එම යෝජනවාට යහපත් ප්‍රතිචාර දක්වමින් එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා වූ ජේ.ආර්. ජයවර්ධන මහතා ඒ සඳහා රුපියල් මිලියන 2.2 ක මුදලක් වෙන් කර දුන් අතර, ගරු ලලිත් ඇතුලත්මුදලි මහතා ද මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලෙන් ඒ හා සමාන මුදලක් දායක කළේය.

එහි ප්‍රතිඵලයක් ලෙස, අරමුදලෙහි ස්ථාවර බව සහතික කර ගැනීම සඳහා "සංවර්ධන ලොතරැයිය" යනුවෙන් නම් කරන ලද මුල්ම ලොතරැයිපත වෙළඳ පොළට හඳුන්වා දෙන ලදී. එම සියලු ප්‍රයත්නයන්හි ප්‍රතිඵලය ලෙස ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට අරමුදල් සපයාදීමේ අරමුණ ඇතිව සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය විධිමත් ලෙස ස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිට ම විශිෂ්ඨ සාර්ථකත්වයක් අත්කර ගත් සංවර්ධන ලොතරැයි මණ්ඩලය, පළමු වර්ෂය තුළ දී ස්වකීය ආර්ථික ඉලක්ක සාක්ෂාත් කරගනිමින්, ඉන් පසු කාලසීමාවන් පුරා අඛණ්ඩව සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේ ය. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත අඛණ්ඩව ප්‍රේෂණය කර ඇත. ඒ අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි ලාභයෙන් විශාල කොටසක් ජනාධිපති අරමුදලට දායක කර ඇති අතර ජනාධිපති අරමුදල ඉන් 50% ක් මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලට වෙන් කර දෙයි.

1993 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය 'සංවර්ධන ලොතරැයි භාරය' යනුවෙන් නාමකරණය කර ප්‍රතිව්‍යුහගත කරන ලදී. පසුව, 1997 අගෝස්තු 12 වැනි දින එය පාර්ලිමේන්තු පනතක් මගින් 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' ලෙස යළි ස්ථාපනය කරන ලදී.

'සංවර්ධන ලොතරැයිය' නමින් හඳුන්වන ලද පළමු ක්ෂණික ලොතරැයිපත රු.10/= ක් වූ මුදලකට දිවයින පුරා අලෙවි කරන ලද අතර, එය පැය 24 ක් ඇතුළත 'සුපිරි ජයමළු' ජයග්‍රාහකයින් දෙදෙනෙකු බිහිකරමින්, ලොතරැයි පාර්භෝගිකයින් ආකර්ෂණය කර ගනිමින්, ක්ෂණික ලොතරැයි ක්‍රමයේ ජනප්‍රියත්වය වැඩිකිරීමට මඟ පෑදුවේය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය පළමුවරට ශනිදා වාසනාව නමින් සෙනසුරාදා දිනවල පමණක් දිනුම් ඇදීම සිදුකරන ලද ලොතරැයි වැඩසටහනක් ජාතික රූපවාහිනිය ඔස්සේ විකාශනය කිරීමට පුරෝගාමී වූ අතර එය මෙරට ලොතරැයි ඉතිහාසයේ ඉතා වැදගත් සංධිස්ථානයක් විය. එහි ජනප්‍රියත්වය හේතුවෙන් එය සතියේ දින හතේදී ම දිනුම් අදින ලොතරැයිය බවට පරිවර්තනය විය.

ඊට අමතරව ක්‍ෂණික ලොතරැයි වලින් ජයග්‍රහණය හිමිනොවූ ටිකට්පත් සඳහා සහන ලබාදීමේ අරමුණ ඇතිව 1998 ජනවාරි 25 වන දින වාසනා චක්‍රය නැමැති විශේෂිත දිනුම් ඇදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලද අතර ඉරිදා දිනවලදී රූපවාහිනිය ඔස්සේ විකාශණය කරන ලදී. එයට හිමිවූ ඉහළ ජනප්‍රියත්වය හේතුවෙන් 1998 වසරේදී අඟහරුවාදා සහ සිකුරාදා දිනවල දිනුම් අදින ලද 'සංවර්ධන වාසනාව' නමැති දෙවන ලොතරැයිය හඳුන්වා දුන් අතර, එය අඟහරුවාදා සහ සිකුරාදා දිනවල දිනුම් ඇදීම් සිදුකර විකාශනය කරන ලදි.

එම ලොතරැයිපත කෙරෙහි ඇති ජනතා ප්‍රසාදය හේතුවෙන් 2015 වර්ෂයේදී ලග්න 12 පදනම් කරගනිමින් එය 'ලග්න වාසනාව'ලෙස නැවත නම්කර වෙළඳපොලට හඳුන්වා දුන් අතර මේ වන විට සතියේ දින හතේදීම දිනුම් අදිනු ලබන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වඩාත් ආකර්ශනියම ලොතරැයිය බවට පත්වී ඇත.

එමෙන්ම, 2004 වර්ෂයේ දී රුපියල් මිලියන 10 ක ආරම්භක සුපිරි ජයමල්ලක් සමග, සඳුදා සහ බ්‍රහස්පතින්දා දිනවල දිනුම් අදින ලද "ජයෝදා" නම් ලොතරැයිය හඳුන්වා දීම ලොතරැයි ඉතිහාසයේ තවත් වැදගත් සංධිස්ථානයක් විය. විශේෂයෙන් ම, ජයග්‍රාහකයින්ට රුපියල් මිලියන 10 ක ත්‍යාගය හෝ රුපියල් මිලියන 10 ට අධික වටිනාකමකින් යුතු නිවසක් තෝරා ගැනීමට අවස්ථා හිමිකර දීම ශ්‍රී ලංකා ලොතරැයි ඉතිහාසයේ සුවිශේෂී සංධිස්ථානයක් විය.

2009 අප්‍රේල් 10 වැනි දින සංවර්ධන ලොතරැයි මණ්ඩලය බ්‍රහස්පතින්දා සහ ඉරිදා දිනවල දිනුම් අදින "ජන ජය" ලොතරැයිය හඳුන්වා දුන්නේ ය. සුපිරි ත්‍යාගය දිනා ගැනීම සඳහා සුපිරි අංකය අංක 64 අතරින් තෝරා ගනු ලබන ජයග්‍රාහී අංක 04 සමග තවත් යන්ත්‍රයකින් තෝරා ගනු ලබන සුපිරි අංකය ගැලපිය යුතුය. මෙහි සුපිරි ජයමල්ල රුපියල් මිලියන 2.5 කි.

2012 ජූලි 11 වන දින, ඒ වන විට මෙරට ලොතරැයි ඉතිහාසයේ විශාලතම සුපිරි ත්‍යාග මුදල වූ රුපියල් කෝටි 03 ක සුපිරි ජයමල්ලකින් ආරම්භ වන "සුපර් බෝල්" ලොතරැයිය හඳුන්වා දීම තවත් ඓතිහාසික සංධිස්ථානයක් විය. අද වන විට එය දිනපතාම දිනුම් අදිනු ලබන ලොතරැයියක් ලෙස ජනප්‍රිය වී ඇත.

2016 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය නව ලොතරැයි කිහිපයක් හඳුන්වා දුන් අතර, 2016 මැයි 14 වැනි දින ආරම්භ කළ, මිලියන 5.6 ක ලොතරැයි අලෙවියක් වාර්තා කළ 'ලක්ෂපති' ලොතරැයිය සහ 2016 අප්‍රේල් 8 වැනි දින ආරම්භ කළ, මිලියන 4.4 ක ලොතරැයි අලෙවියක් වාර්තා කළ "කෝටිපති ශනිදා" ලොතරැයිය එයට ඇතුළත් වේ. මුදල් ත්‍යාග තුනක් පිරිනමමින් "සංවර්ධන වාසනාව" 2016 දෙසැම්බර් 12 වැනි දින වෙළඳපොලට හඳුන්වාදෙන ලදී. එයට අමතරව, 2017 අගෝස්තු 31 වැනි දින හඳුන්වා දෙන ලද "අද කෝටිපති" ලොතරැයිය සතියේ දින හතේදී ම දිනුම් අදිනු ලබන පළමු ලොතරැයිය ලෙස ඉතිහාසගත විය.

තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය නවීන තාක්ෂණය වැළඳ ගනිමින්, 2020 වර්ෂයේදී "DLB Sweep App" යෙදුම හඳුන්වා දුන් අතර, එමගින් පාර්භෝගිකයින්ට ඔවුන්ගේ ස්මාර්ට් දුරකථනය හරහා ලොතරැයි පත් මිලදී ගැනීමේ අවස්ථාව විවර කරදෙන ලදි. මෙය ලොතරැයි කර්මාන්තයේ නව යුගයක් සනිටුහන් කළ අතර, වෙළඳපොළෙහි නව කොටසක් ඉලක්ක කරමින් දකුණු ආසියාවේ ප්‍රථම ඩිජිටල් ලොතරැයිය වන "සසිරි" ලොතරැයිය හඳුන්වා දෙන ලදි.

සසිරි ලොතරැයියේ ඩිජිටල් ලොතරැයි දිනුම් ඇදීමේ මෙහෙයුම් පද්ධතියට 2021 වර්ෂයේ දී ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මානය (NBQSA IT සම්මානය) හිමි විය.

ලොතරැයි නවීකරණයේ තවත් මානයන් සොයා යන්නට යුහුසුළු වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2021 වර්ෂයේ දී ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහනකට නව මුහුණුවරක් හා රිද්මයක් එක්කරන්නේ පැරණි දිනුම් ඇදීමේ වැඩසටහන් ආකෘතිය නිමා කරමිනි.

එමෙන් ම, 2021 වර්ෂයේ දී, සියලු ම දිනුම් ඇදීම් කාර්යක්ෂම කර විකාශය කරන ලද "DLB Lottery Show" හඳුන්වා දීම මගින් සහ මාර්තු 1 වෙනි දින ඒ සඳහා ම වෙන්වූ YouTube නාලිකාවක් දියත් කිරීම මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය දිනුම් ඇදීමේ ක්‍රමයේ විප්ලවීය වෙනසක් සිදු කළේ ය.

2021 දෙසැම්බර් 2 වැනි දින, "කෝටිපති කප්රුක" ලොතරැයිය "කප්රුක" ලෙස නැවත නම් කර, රුපියල් මිලියන 120 ක ආරම්භක සුපිරි ත්‍යාගයක් සමග දෛනික දිනුම් ඇදීම ආරම්භ කිරීම සංවර්ධන ලොතරැයි මණ්ඩල ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කළේ ය.

2022 සැප්තැම්බර් 9 වෙනි දින, උතුරු සහ නැගෙනහිර පළාත්වල පාරිභෝගිකයන් ඉලක්ක කර ගනිමින් වාසනාව සංකේතවත් කරන ලොතරැයියක් වන "වාලම්පුරි" ලොතරැයිය හඳුන්වා දෙන ලදී. එහි අතිමහත් ජනප්‍රියතාවයක් ලබා ගැනීම හේතුවෙන් එය දිවයින පුරා ව්‍යාප්ත කරන ලදී.

අලෙවි නියෝජිතයන්ගේ සහ බෙදාහරින්නන්ගේ දිගුකාලීන ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන් සහ රජයේ ප්‍රතිපත්තියට සහ මුදල් අමාත්‍යාංශයේ මග පෙන්වීමට අනුව, 2023 ජූලි 6 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන ලොතරැයි ටිකට්පතක මිල රු. 20 සිට රු. 40 දක්වා ඉහළ නංවන ලදී.

තව තවත් මිලියනපතියන් බිහි කිරීම සඳහා සහ අවස්ථා පුළුල් කිරීම සඳහා 2023 නොවැම්බර් 9 වන දින "සුපිරි ධන සම්පත" ලොතරැයිය හඳුන්වාදෙන ලදී. එහි ආරම්භක දිනුම් ඇදීමේ දී ටිකට්පත් මිලියන 1.6 ක් අලෙවියක් වාර්තා වූ අතර, එමගින් දෛනික ටිකට්පත් අලෙවිය මිලියන 1.9 සිට මිලියන 2.2 දක්වා ඉහළ ගියේය.

2024 වර්ෂයේ ප්‍රවර්ධන උපාය මාර්ගයේ කොටසක් ලෙස, රුපියල් 200,000 ක ත්‍යාග වැඩිම සංඛ්‍යාවක් ලබාදීම සඳහා ප්‍රසිද්ධියක් ඉසිලූ "සසිරි" ලොතරැයිය, 2024 නොවැම්බර් 2 වන දින සිට සෙනසුරාදා දිනයේත්, නොවැම්බර් 7 වන දින සිට බ්‍රහස්පතින්දා දිනයේත් දිනුම් ඇදීම එකතු කරමින් සතියකට දිනුම් ඇදීම් දින පහක් දක්වා පුළුල් කරන ලදී.

ආරම්භයේ සිට ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල සහ මහපොළ භාරකාර අරමුදල සඳහා අරමුදල් රැස් කිරීමේ ද්විත්ව මෙහෙවරට කැපවී සිටියි. පසුගිය වසර 41ක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඒ සඳහා රුපියල් බිලියන 44.6 ට අධික දායකත්වයක් ලබා දී ඇති අතර, ශ්‍රී ලාංකිකයින්ට රුපියල් 40 ක ලොතරැයි පතකින් තම වාසනාව උරගා බැලීමේ අවස්ථාව ද සපයා දී ඇත.

තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශ්‍රී ලාංකිකයින් 22,500 කට අධික පිරිසකට ස්වයං රැකියා අවස්ථා සපයා දෙමින්, ඔවුන්ට ආර්ථික ස්ථාවරත්වය ළඟා කර ගැනීමේ හැකියාව ලබා දෙයි. එයට අමතරව, පුද්ගලයින් 100,000 ට අධික සංඛ්‍යාවකගේ ජීවන තත්ත්වය නගාසිටුවීමට සහයෝගය දක්වමින් ඔවුන්ගේ පෞද්ගලික හා ආර්ථික සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ද ලබා දෙනු ලැබේ.

# වැදගත් සංධිස්ථාන

**1983**

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ක්ෂණික දිනුම් ලොතරැයියක් හඳුන්වා දෙන ලදී.

**1987**

මෙරට පළමු රූපවාහිනී දිනුම් ඇදීම වන 'ශනිදා වාසනාව ලොතරැයිය' හඳුන්වාදීම.

**1993**

'සංවර්ධන ලොතරැයි මධ්‍යස්ථානය' 'සංවර්ධන ලොතරැයි භාරය' බවට පරිවර්තනය වීම.

**1997**

'සංවර්ධන ලොතරැයි භාරය' 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ රජයට හිමි සංස්ථාපිත ආයතනයක් ලෙස 'සංවර්ධන ලොතරැයි මණ්ඩලය' නමින් ස්ථාපනය කිරීම.

- රුපියල් බිලියන 2 ක සමස්ත පිරිවැටුම් මට්ටමක් ළඟා කරගන්නා ලදී.

**1998**

ජයග්‍රහණ හිමි නොවූ ක්ෂණික/සුරන ලොතරැයි පත් සඳහා 'වසනා චක්‍රය' රූපවාහිනී දිනුම් ඇදීම නැවත දියත් කිරීම.

- ප්‍රථම ත්‍යාගය ලෙස සුපිරි සුඛෝපභෝගී මෝටර් රථයක් පිරිනමමින් රු. 100 ක මුදලකට අලෙවි කරන 'වින්ඩෝස්' සහ 'යුරේකා' ක්ෂණික ලොතරැයි සමග 'සංවර්ධන වාසනා ලොතරැයිය' හඳුන්වා දෙන ලදී.

**1999**

වර්ෂ 2000 දී එල්ල වන තාක්ෂණික අභියෝගයන්ට මුහුණ දීම පිණිස ලෝක බැංකුවේ සහාය ඇතිව පරිගණක පද්ධතිය යාවත්කාලීන කරන ලදී.

**2004**

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලද පුරෝගාමී අංගයක් වන මුදල් ත්‍යාගයක් හෝ නිවසක් යන විකල්ප සහිතව 'ජයෝදා' ලොතරැයිය දියත් කරන ලදී.

- රුපියල් බිලියන 3 ක සමස්ත පිරිවැටුමක් ළඟා කරගන්නා ලදී.

**2008**

2008 අංක 356 ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මාවත, කොළඹ 02 හි පිහිටි සංවර්ධන ලොතරැයි මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ල වෙත මණ්ඩලය රැගෙන යන ලදී. රු. බිලියන 5ක සමස්ත පිරිවැටුමක් අත්කර ගන්නා ලදී.

**2010**

සුපිරි ජයමල්ලක් සමග 'ජන ජය' දිනුම් අදින ලොතරැයිය හඳුන්වා දීම.

**2011**

'නියත ජය' දිනුම් අදින ලොතරැයිය ආරම්භ කිරීම.

**2012**

රුපියල් මිලියන 30 ක සුපර් ජයමල්ල සමග 'සුපර් බෝල්' දිනුම් අදින ලොතරැයිය' හඳුන්වා දීම.

**2013**

ඉහළම වටිනාකම සහිත ජයමල්ලක් පිරිනමන ‘හයිවේ ඩ්‍රීම්’ ලොතරැයිය හඳුන්වා දීම.

**2014**

කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ලොතරැයි අලෙවි කිරීමේ ක්‍රමය ආරම්භ කරන ලදි.

**2016**

‘සංවර්ධන ලක්ෂපති’, ‘කෝටිපති ශනිදා’ සහ ‘සංවර්ධන වාසනව’ යන ලොතරැයි ආරම්භ කිරීම.

**2017**

‘අද කෝටිපති’ ලොතරැයිය හඳුන්වා දීම.

**2018**

IVR සහ කෙටි පණිවුඩ සේවාව ඔස්සේ ප්‍රතිඵල දැනුම්දීමේ ක්‍රමවේදය දියත් කරන ලදි.

**2019**

'DLB Sweep App’ යෙදුම දියත් කිරීම.

**2020**

‘සසිරි’ ඊ-ලොතරැයිය හඳුන්වා දීම.

**2021**

ශ්‍රී ලංකාවේ ලොතරැයි ව්‍යාපාරයේ රු.මි. 120 ක් වූ ඉහළම වටිනාකම සහිත සුපිරි ජයමල්ල පිරිනමමින් ‘කප්රුක’ ලොතරැයිය නැවත හඳුන්වා දීම.

**2022**

‘වාලම්පුරි’ ලොතරැයිය හඳුන්වා දීම.

**2023**

‘සුපිරි ධන සම්පත’ ලොතරැයිය හඳුන්වා දීම.

- ලොතරැයියක මිල රු.20 සිට රු.40 දක්වා වැඩි කිරීම.

**2024**

ආදායම රු.බි. 30.3 ට ළඟා විය.

# ප්‍රධාන මූල්‍ය තොරතුරු

### එකතු කළ අගයමත බදු පසු ආදායම (රු.මි)




### බදු පෙර ලාභය (රු.මි)




### ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය (රු.මි)




### ආදායම් බදු (රු.මි)




### රජය වෙත ලබා දුන් මුළු ප්‍රේෂණ (රු.මි)




### මුළු වත්කම් (රු.මි)



| | දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය | |
|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | **2024** | **2023** |
| ආදායම | 28,880,477,301 | 25,442,131,713 |
| දළ ලාභය | 11,435,403,517 | 10,017,436,178 |
| බදු පෙර ලාභය | 4,197,090,255 | 3,516,296,477 |
| බදු වියදම් | 111,163,568 | (106,210,247) |
| ශුද්ධ ලාභය | 4,078,417,348 | 5,265,256,062 |
| ජනාධිපති අරමුදලට ලබා දුන් දායකත්වය | **4,085,926,687** | **3,622,506,725** |

| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**<br>**වත්කම්** | | |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 2,774,930,577 | 2,718,047,956 |
| ස්ථාවර තැන්පතු | 1,222,751,286 | 1,710,213,172 |
| තොග | 54,221,755 | 56,720,455 |
| වෙළඳ ණය ගැතියෝ සහ ලැබිය යුතු වෙනත් | 195,633,999 | 207,964,715 |
| පෙර ගෙවීම් සහ තැන්පතු | 9,494,998 | 4,748,286 |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | 1,196,185,002 | 767,981,019 |
| **මුළු වත්කම්** | **5,453,217,617** | **5,465,675,603** |

| **වගකීම්** | | |
|---|---|---|
| සේවක ප්‍රතිලාභ වගකීම් | 13,363,119 | 9,081,293 |
| අලෙවිනියෝජිත සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ගෙවිය යුතු තැන්පතු | 40,985,881 | 39,875,881 |
| ගෙවිය යුතු ණය වවුචර් | 148,086,860 | 167,800,730 |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 833,301,365 | 690,726,582 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | 193,438,687 | 682,730,725 |
| ගෙවිය යුතු ත්‍යාග | 1,611,749,784 | 1,456,785,350 |

| **හිමිකම්** | | |
|---|---|---|
| ජනාධිපති අරමුදල | 2,200,000 | 2,200,000 |
| මහපොල භාර අරමුදල | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | 340,232,474 | 139,106,256 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | 2,267,659,447 | 2,268,909,427 |
| සේවක ප්‍රතිලාභ සැලැස්ම නැවත මිනුම් කිරීමේ ලාභය/අලාභය | - | 6,259,359 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | **5,453,217,617** | **5,465,675,603** |

| **ලාභදායිතා අනුපාතය** | | |
|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය | 15% | 14% |
| දළ ලාභ අනුපාතය | 40% | 39% |

| **ද්‍රවශීලතා අනුපාතය** | | |
|---|---|---|
| ජංගම වත්කම් අනුපාතය | 1 : 1.03 | 1 : 1.19 |
| ද්‍රවශීලී වත්කම් අනුපාතය | 1 : 1.01 | 1 : 1.16 |

# සභාපතිතුමාගේ පණිවිඩය සහ 2024 වර්ෂයේ ප්‍රගති වාර්තාව



"පෙර නොවූ විරූ අභියෝග හමුවේ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශිෂ්ට ඔරොත්තු දීමේ හැකියාවක් සහ කැපවීමක් පෙන්නුම් කරමින් ස්වකීය උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස අඛණ්ඩව ඉදිරියට ගමන් කරමින් සිටියි."

නව්‍යකරණය සහ අනුවර්තනය වීමේ හැකියාව තුළින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය සාර්ථකව බාධක ජයගෙන ඇති අතර, විශිෂ්ටත්වය, වර්ධනය සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා ඇති ස්වකීය කැපවීම ශක්තිමත් කරගෙන ඇත. 2024 වර්ෂයේ දී අපගේ ආදායම සහ ජනාධිපති අරමුදලට ලබා දෙන ලද දායකත්වය වාර්තාගත ඉහළම අගයන් වීම තුළින් අපගේ මෙම කැපවීම පිළිබිඹු වන අතර, එම වර්ෂයේ දී උපයා ගත් ආදායම රු.මි. 28,880 ක් ද, ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට ලබා දෙන ලද දායකත්වය රු.මි. 4,086 ක් ද විය. මෙම වාර්තාව ඔස්සේ 2024 මූල්‍ය වර්ෂයේ අප ලබාගත් ජයග්‍රහණයන්, අපගේ ඔරොත්තු දීමේ හැකියාව. නව්‍යකරණය, ප්‍රගතියේ ශක්තිය හා වර්ධනයට කැපවීම පිළිබඳ තොරතුරු අපි සාඩම්බරයෙන් හුවමාරු කර ගනිමු.

| | 2024 (රු.මි.) | 2023 (රු.මි.) | වර්ධනය % |
|---|---|---|---|
| ආදායම | 28,880 | 25,442 | 14% |
| ත්‍යාග ගෙවීම | 15,701 | 13,451 | 17% |
| දළ ලාභය | 11,435 | 10,017 | 14% |
| බදු පෙර ලාභය | 4,197 | 3,516 | 19% |
| බදු පසු ලාභය | 4,086 | 3,623 | 13% |

2024 මූල්‍ය වර්ෂය තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරමින් විශාල මූල්‍ය සාර්ථකත්වයක් අත්කර ගත්තේ ය.

- **ආදායම් වර්ධනය:** සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2023 වර්ෂයේ දී රුපියල් මිලියන 25,442 ක් වූ ස්වකීය ආදායම 2024 වර්ෂයේ දී රුපියල් මිලියන 28,880 ක් දක්වා ඉහළ නංවා ගනිමින් 14% ක වර්ධනයක් වාර්තා කළේ ය. මෙම වර්ධනය අපගේ ආදායම් උත්පාදන උපාය මාර්ගවල ඵලදායීත්වය අවධාරණය කරයි.
- **ත්‍යාග ගෙවීම්:** සංවර්ධන ලොතරැයි මණ්ඩලය ත්‍යාග ගෙවීම් 17% ක ප්‍රමාණයකින් වැඩි කර, අපගේ විශ්වාසවන්ත පාරිභෝගිකයන්ට රුපියල් මිලියන 15,701 ක් ලබා දෙමින්, ඔවුන්ගේ අත්දැකීම් සහ සහභාගීත්වය තවදුරටත් වැඩිදියුණු කළේය.
- **දළ ලාභය:** දළ ලාභය රු.මි. 11,435 දක්වා 14% ක ප්‍රමාණයකින් වැඩිවීම අපගේ මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය සහ පිරිවැය කළමනාකරණ ක්‍රියාමාර්ගවල ඵලදායීත්වය ඉස්මතු කරයි.
- **බදු පෙර ලාභය:** වෙනස් වෙමින් පවතින වෙළඳපොළ තත්ත්වයන් මධ්‍යයෙහි අපගේ මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින් අපගේ බදු පෙර ලාභය රු.මි. 4,197 දක්වා 19% ක ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත.
- **බදු පසු ලාභය:** බදු පසු ලාභය රු.මි. 4,086 ක් දක්වා 13% ක ප්‍රමාණයකින් වර්ධනය වීම අපගේ පාර්ශ්වකරුවන්ට වටිනාකමක් ලබා දීම සහ මූල්‍ය තිරසාරභාවය පවත්වා ගැනීම සඳහා අප තුළ ඇති කැපවීම ශක්තිමත් කරයි.

මෙම ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනය සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩ සාර්ථකත්වයක් අත්කර ගත හැකි තත්ත්වයක ස්ථානගත කරන අතර, එය අප සේවය කරන ප්‍රජාවන් සඳහා වටිනාකමක් ජනනය කිරීම පිණිස අප තුළ ඇති කැපවීම ශක්තිමත් කරයි.

### අපගේ ජයග්‍රහණ

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මූලික ම මෙහෙවර වන්නේ ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා ආදායම් උත්පාදනය කිරීම යි. 2024 වර්ෂයේ දී එම අරමුදල් සඳහා අපගේ දායකත්වය රු.මි. 4,086 ක් වූ අතර, එය පෙර වර්ෂයට වඩා 13% ක වැඩිවීමකි. මෙම ජයග්‍රහණය මගින් වැදගත් සමාජ වැඩසටහන් සඳහා සහාය වීමට සහ ජාතියට අර්ථාන්විත බලපෑමක් ඇති කිරීමට අප තුළ ඇති නොසැලෙන කැපවීම අවධාරණය කෙරෙයි.

### මෙහෙයුම් සමාලෝචනය

අපගේ වසර 41 ක ඉතිහාසය තුළ ලබා ගත් ඉහළ ම ආදායම අත්කර 2024 වර්ෂය සංවර්ධන ලොතරැයි මණ්ඩලය සඳහා ඓතිහාසික සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. මූල්‍ය සාර්ථකත්වයට අමතරව, අපගේ ලොතරැයි සඳහා පිරිනමන ත්‍යාග වැඩි කිරීම මගින් සහ පාරිභෝගික සහභාගීත්වය වැඩිදියුණු කිරීම මගින් අපි ශ්‍රී ලංකා සමාජයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත්තෙමු.

### ත්‍යාග ව්‍යුහයන් වැඩිදියුණු කිරීම

අපි පාරිභෝගික වටිනාකම වැඩි කිරීම සඳහා, මිල ගැළපීම් සිදු කිරීමෙන් අනතුරුව, 2023 දෙසැම්බර් 11 වැනි දින සිට සෙකන්ඩ් චාන්ස් විශේෂ දිනුම් ඇදීම නැවත ආරම්භ කළෙමු. පාරිභෝගිකයන්ගේ සහ අලෙවි නියෝජිතයන්ගේ ප්‍රතිපෝෂණ සැලකිල්ලට ගනිමින් අපි ප්‍රධාන දිනුම් ඇදීමෙන් පසුව පහත සඳහන් වැඩිදියුණු කළ මුදල් ත්‍යාග පිරිනමන සෙකන්ඩ් චාන්ස් විශේෂ දිනුම් ඇදීම 2024 මාර්තු 25 වන දින සිට නැවත හඳුන්වා දුන්නෙමු.

අද කෝටිපති, කප්රුක, සුපර් බෝල් සහ සුපිරි ධන සම්පත යන ලොතරැයි සඳහා රු. 100,000 අමතර ත්‍යාගද, ලග්න වාසනා ලොතරැයි ටිකට්පත් සඳහා රු. 50,000 අමතර ත්‍යාගද විශාල ගණනක් ලබාදෙන ලදි.

## අලෙවිකරණයෙහි විශේෂ අවස්ථා

### මිල ගැළපීම සහ අලෙවිය කෙරෙහි බලපෑම

මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුගමනය කරමින්, 2023 ජූලි 6 වන දින ලොතරැයි ටිකට්පත් වල මිල රු. 20 සිට රු. 40 දක්වා වැඩි කරන ලදී. මෙය මුල දී අලෙවියෙහි පහත වැටීමකට හේතු වූ නමුත් 2024 අවසානය වන විට එහි ශක්තිමත් ප්‍රකෘතිමත් වීමක් දක්නට ලැබුණු අතර එය අපගේ වෙළඳපොළේ ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරනු ලබයි.

### නව ලොතරැයිපත් සහ දිනුම් ඇදීමේ වාර ගණන වැඩි කිරීම

වෙළඳපොළේ රු. 200,000 ක ඉහළම ත්‍යාගය පිරිනමන සසිරි ලොතරැයියේ ජනප්‍රියත්වය වැඩි කිරීම සඳහා අපි දිනුම් ඇදීමේ කාලසටහන සංශෝධනය කළ අතර, ඒ අනුව සතියකට දිනුම් අදින වාර ගණන වාර තුනේ සිට පහ දක්වා වැඩි කළෙමු.

### අලෙවි ප්‍රවර්ධන සහ දිරි දීමනා

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් (Second Chance) දෙවැනි දිනුම් ඇදීම්, Mini Draw සහ විශේෂ දිනුම් ඇදීම් ඇතුළු ප්‍රවර්ධන ක්‍රියාමාර්ග මාලාවක් හඳුන්වා දුන් අතර, එමගින් ටික පත් අලෙවිය සහ පාරිභෝගික සහභාගීත්වය සාර්ථකව ඉහළ ගියේ ය.

### වෙළඳපොල පුළුල් කිරීම සහ සහාය වැඩසටහන්

අපි අපගේ බෙදාහරින්නන්ගේ ජාලය පුළුල් කරමින් අපගේ අලෙවි නියෝජිතයින්ට සහාය වීම සඳහා පහත සඳහන් වැඩසටහන් ඇතුළු වැඩසටහන් රාශියක් හඳුන්වා දුන්නෙමු.

- ආපදාවලින් පීඩාවට පත් අලෙවි නියෝජිතයින් සඳහා මූල්‍ය ආධාර ලබාදීම.
- නව ලොතරැයි අලෙවිසැල් පිහිටුවීම.
- අලෙවි නියෝජිතයින්ගේ දරුවන් සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට අනුග්‍රහය දැක්වීම.

### සමාජ සත්කාර සහ ප්‍රජා සහභාගීත්වය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රජා සංවර්ධනය සඳහා අප තුළ ඇති කැපවීම පෙන්නුම් කරමින් ආයතනික සමාජ වගකීම්, සංස්කෘතික උත්සව සහ අධ්‍යාපනික වැඩසටහන් සඳහා සහාය දැක්වීමට කැපවී සිටියි.

### නවෝත්පාදන වැඩසටහන් සහ සේවකයින් පිළිගැනීමට ලක්කිරීම

- ජංගම දුරකථනය ඔස්සේ ලොතරැයිපත් ඇණවුම් කිරීමේ ක්‍රමය හඳුන්වාදීම.
- නියෝජිතයින් දිරිමත් කිරීම සඳහා අලෙවි කුටිවලට ත්‍යාග පිරිනැමීමේ වැඩසටහන් දියත් කිරීම.

- දීර්ඝ කාලයක් සේවය කරන සහ විශ්‍රාම යන සේවකයින් ඇගයීමට ලක්කිරීමේ වැඩසටහන් දියත් කිරීම.

## ඉදිරි දැක්ම

අඛණ්ඩ නව්‍යකරණය සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම් සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැපවී සිටියි. අනාගතය සඳහා වන ප්‍රධාන උපායමාර්ගික වැඩසටහන් වලට පහත සඳහන් වැඩසටහන් ඇතුළත් වේ:

**ඩිජිටල් පරිවර්තනය:**
ඩිජිටල් ලොතරැයි ක්‍රමයක් සමග මාර්ගගත ටිකට්පත් අලෙවිය පුළුල් කිරීම.

**ජාල ප්‍රතිසංවිධානය:**
කාර්යක්ෂමතාවය සඳහා අපගේ බෙදාහරින්නන්ගේ ජාලය ප්‍රශස්ත කිරීම.

**ආපදා ප්‍රතිසාධන පද්ධතිය:**
ව්‍යාපාර අඛණ්ඩතාවය සඳහා තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය ශක්තිමත් කිරීම.

**දිවයින පුරා ක්‍රියාත්මක කරන වෙළඳ නාම ප්‍රවර්ධන වැඩසටහන:**
සියලුම අලෙවිසැල්වල වෙළඳ නාමකරණය ප්‍රමිතිකරණය කිරීම.

**නවීන ලොතරැයි සාප්පු ව්‍යාපෘතිය:**
වඩාත් නවීන තාක්‍ෂණික ක්‍රමවේද ඔස්සේ ලොතරැයි මිලදී ගැනීමට පාරිභෝගිකයින්ට ඇති අවස්ථාව වැඩි දියුණු කිරීම.

**නව වෙබ් අඩවිය සහ මාර්ගගත විකුණුම් වේදිකාව:**
වෙළඳපොළ පුළුල් කිරීම සඳහා පාරිභෝගිකයන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු කිරීම.

**පාරිභෝගික සේවා වැඩිදියුණු කිරීම්**
වඩා හොඳ පාරිභෝගික අත්දැකීමක් සඳහා සේවා ක්ෂේත්‍ර ප්‍රතිසංවිධානය කිරීම.

මෙම වැඩසටහන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ඉදිරි දියුණුවට මග පෙන්වනු ඇති අතර, එමගින් අපි පාරිභෝගික අපේක්ෂාවන් ඉක්මවා යමින් සමාජය මත ඇතිකරන අපගේ ධනාත්මක බලපෑම අඛණ්ඩව පවත්වා ගන්නා බව සහතික කරන්නෙමු.

## සමාප්ති සටහන

අප වෙත ලබා දෙන නොසැලෙන සහයෝගය වෙනුවෙන් මම අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමියට, ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාට, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාට සහ භාණ්ඩාගාර ලේකම්තුමාට මාගේ හෘදයාංගම කෘතඥතාවය පුද කරමි. අපගේ ගමන සාර්ථක කර ගැනීමට උපකාරී වූ මග පෙන්වීම ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩලයට ද මාගේ කෘතඥතාව පළ කරමි.

අපගේ සාර්ථකත්වයට ඉතා වැදගත් දායකත්වයක් ලබා දෙන අපගේ වටිනා හවුල්කරුවන් වන දිනුම් ඇදීමේ විනිසුරුවරුන්, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලේ කණ්ඩායම, බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන්, අලෙවි නියෝජිතයන්, අලෙවි සහායකයින්, බැංකුකරුවන් සහ සේවා සපයන්නන් යන සියලු දෙනාට මාගේ විශේෂ ස්තූතිය පිරිනමමි.

අලෙවිකරණ, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන සියලු ම අංශවල සේවය කරන අපගේ සේවක කණ්ඩායම වෙහෙස මහන්සියෙන් කටයුතු කිරීම සහ ඔවුන්ගේ කැපවීම සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ජයග්‍රහණවල පදනම වේ. එබැවින් මා, කළමණාකාරීත්වය ඇතුලු සේවක කණ්ඩායමේ සියලු දෙනාට මාගේ ස්තූතිය පිරිනමමි. අපගේ පාරිභෝගිකයන්ගේ විශ්වාසය සහ ළැදිකම අපව අඛණ්ඩව ම දිරිමත් කරන බැවින් අපගේ සියලු ම පාරිභෝගිකයන්ට ද මාගේ කෘතඥතාවය පළ කරමි. අපගේ සාර්ථකත්වයට ඉවහල් වූ නායකත්වය සහ උපායමාර්ගික මග පෙන්වීම ලබාදුන් අපගේ සාමාන්‍යාධිකාරීතුමාට විශේෂ ස්තූතිය පිරිනමමි.

අවසාන වශයෙන්, අපගේ මෙහෙයුම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා සපයා දෙන වටිනා අධීක්ෂණය වෙනුවෙන් මම විගණකාධිපති දෙපාර්තමේන්තුවට ස්තූතිය පුදකරමි.

අපි ඉදිරියට යන විට, එළඹෙන වර්ෂ වලදී මෙයටත් වඩා විශාල ජයග්‍රහණ ලබා ගැනීම සඳහා වේදිකාව සකස් කර ගනිමින්, විශිෂ්ඨත්වය, නවකරණය සහ සමාජ බලපෑම සඳහා අප තුළ ඇති ස්ථිරසාර කැපවීම අපි අඛණ්ඩව පවත්වා ගන්නෙමු.



**නීතිඥ හේමන්ත ස්වර්ණතිලක**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

# අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාලෝචනය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සතුටින් ඉදිරිපත් කර සිටිමි.

## ප්‍රධාන ක්‍රියාකාරකම්

ජනාධිපති අරමුදල සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා ආදායම් උත්පාදනය කිරීම මණ්ඩලයේ ප්‍රධාන ක්‍රියාකාරකම වේ.

## වර්ෂයේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම

2024 වර්ෂයේ දී සක්‍රීය ආර්ථික පසුබිමක් තුළ ගමන් කරමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදලට රු.මි. 4,086 ක සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් අතර, එය 2023 වර්ෂයට සාපේක්ෂව 13% ක ප්‍රශංසනීය වර්ධනයක් සනිටුහන් කළේය. තවද, සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු.බි. 28.8 ක ආකර්ෂණීය පිරිවැටුමක් අත්කර ගත් අතර, එය පෙර වර්ෂයේ පිරිවැටුම වූ රු.බි. 25.4 ට වඩා 14% ක කැපී පෙනෙන ඉහළ යාමකි.

## ආයතනික සමාජ වගකීම්

අපගේ ආයතනික සමාජ වගකීම් වැඩසටහන් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ මෙහෙයුම් සමාලෝචනය කොටසේ දක්වා ඇත.

## මූල්‍ය වාර්තාකරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මණ්ඩලයේ කටයුතු පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මක් පිළිබිඹු කරන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි නියමයන්ට අනුකූලව සකස් කර ඇති බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති.

## විගණකගේ වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ සහ 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 14(3) වන වගන්තියේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව විගණකාධිපතිවරයා සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ විගණකවරයා වේ. 2024 දෙසැම්බර් 31 වන දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ අංක 57 සිට 69 දක්වා වන පිටුවල ඉදිරිපත් කර ඇත.

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

මණ්ඩලය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (LKAs) අනුකූලව ස්වකීය මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති 89-93 පිටුවල දක්වා ඇත. සමාලෝචනයට භාජනය කළ වර්ෂය තුළ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු ප්‍රමාණාත්මක වෙනසක් සිදුවී නොමැත.

## මණ්ඩලය සමග ඇති කර ගෙන තිබෙන ගිවිසුම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ බැඳියාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලය සමග ඇති කර ගෙන තිබෙන කිසිදු ගිවිසුමක් හෝ යෝජිත ගිවිසුමක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ට සෘජු හෝ වක්‍ර බැඳියාවක් නොමැත.

## විගණන කමිටුව

පාලක මණ්ඩලයේ උප කමිටුවක් ලෙස විගණන කමිටුව ආයතනයේ පාලනය සහ අවදානම් කළමනාකරණ පද්ධති සමාලෝචනය කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් නිරීක්ෂණය කිරීම සහ අභ්‍යන්තර විගණනයේ සහ ව්‍යවස්ථාපිත විගණනයේ කාර්යයන් අධීක්ෂණය කිරීම සම්බන්ධ සමස්ත වගකීම දරයි. විගණන කමිටුවේ වාර්තාව 55 පිටුව තුළ දක්වා ඇත.

## නීති සහ නියමයන්ට අනුකූල වීම

තමන්ගේ උපරිම දැනුමේ සහ විශ්වාසයේ හැටියට තමන් මණ්ඩලයේ නීති සහ නියමයන්ට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නිරත වී නොමැති බව අධ්‍යක්ෂවරු තහවුරු කරති.

## ව්‍යවස්ථාපිත ගෙවීම්

ජනාධිපති අරමුදල වෙත ගෙවිය යුතු මුදල්, රජයේ බදු සහ සේවක අර්ථසාධක අරමුදලට, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට සහ පාර්තෝෂිකයට අදාළ දායක මුදල් යන සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත වේලාවට ගෙවා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

## ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සිදුවීම්

මූල්‍ය වර්ෂයේ අවසානය සහ මෙම වාර්තාවේ දිනය අතර කාල පරතරය තුළ ගැළපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය කරන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් සිදුවී නොමැති බව අධ්‍යක්ෂවරුන්ගේ මතය වේ.

## අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලයේ මෙහෙයුම් අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා මණ්ඩලය සතු සම්පත් ප්‍රමාණවත් බව අධ්‍යක්ෂවරු විශ්වාස කරති. එබැවින්, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී අඛණ්ඩ පැවැත්ම පදනම යොදාගෙන ඇත

## ස්තූතිය

අප වෙත ලබා දෙන නොසැලෙන සහයෝගය වෙනුවෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමියට, ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාට, මුදල් හා ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමාට සහ භාණ්ඩාගාර ලේකම්තුමාට අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මාගේ හෘදයාංගම කෘතඥතාවය පුද කරමි.

එමෙන් ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රගතිය අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා උපකාරී වූ උපායමාර්ගික මගපෙන්වීම සපයා දීම සහ කැපවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයින්ට ද මාගේ කෘතඥතාවය පළ කරමි.

අපගේ සාර්ථකත්වයට ඉතා වැදගත් දායකත්වයක් ලබා දෙන අපගේ වටිනා හවුල්කරුවන් වන දිනුම් ඇදීමේ විනිසුරුවරුන්, ජනාධිපති අරමුදලේ කාර්ය මණ්ඩලය, මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලේ කණ්ඩායම, බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන්, අලෙවි නියෝජිතයන්, අලෙවි සහායකයින්, මාධ්‍ය හවුල්කරුවන්, බැංකුකරුවන් සහ සේවා සපයන්නන් යන සියලු දෙනාට අපගේ අවංක ස්තූතිය පිරිනමන්නෙමු. ඔවුන්ගේ නොසැලෙන දායකත්වය අපගේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා අතිශය වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇත.

අලෙවිකරණ, මූල්‍ය, තොරතුරු තාක්ෂණ, ප්‍රසම්පාදන, විකුණුම්, පරිපාලන සහ අභ්‍යන්තර විගණන යන සියලු ම දෙපාර්තමේන්තුවල සේවය කරන අපගේ කැපවූ සේවක කණ්ඩායම වෙහෙස මහන්සියෙන් කටයුතු කිරීම සහ ඔවුන්ගේ කැපවීම සංවර්ධන ලොතරැයි මණ්ඩලියෙහි ජයග්‍රහණවල පදනම වේ. එබැවින් අපි කළමණාකාරීත්වය ඇතුලු සේවක කණ්ඩායමේ සියලු දෙනාට අපගේ ස්තුතිය පිරිනමන්නෙමු.

අවසාන වශයෙන්, අපගේ මෙහෙයුම්වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා සපයා දෙන වටිනා අධීක්ෂණය වෙනුවෙන් මම විගණකාධිපති දෙපාර්තමේන්තුවට ස්තූතිය පුදකරමි.

අපට තවත් ඉහළ ජයග්‍රහණ අත්කර ගැනීම සඳහා අපගේ පාරිභෝගිකයන්ගේ විශ්වාසය සහ ළැදිකම අපව අඛණ්ඩව ම දිරිමත් කරන බැවින් අපගේ සියලු ම පාරිභෝගිකයන්ට ද අපගේ දැඩි කෘතඥතාවය පළ කරන්නෙමු.



**ඒ. චානක්‍ය ලියනගේ මහතා**
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය

# අධ්‍යක්ෂ මණ්ඩලය - 2024

## 2024 ජනවාරි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

**අජිත් ගුණරත්න නාරගල මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී,
2021.12.16 දින සිට බලපැවැත්වෙන පරිදි

**ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා**
ලේකම්,
වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
2023.09.27 දින සිට බලපැවැත්වෙන පරිදි

**ඩබ්ලිව්.ඒ. සරත් කුමාර මහතා**
ලේකම්, ජනාධිපති අරමුදල,
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්, මුදල් අමාත්‍යාංශය,
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය - 2022.08.22 දින සිට

**කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය**
අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
2021.06.28 දින සිට බලපැවැත්වෙන පරිදි

**ජෙනට් ජයවර්ධන මහත්මිය**
(නීතිඥ),
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය,
2020.01.15 දින සිට

## 2024 සැප්තැම්බර් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා අධ්‍යක්ෂ මණ්ඩලය

**නීතිඥ හේමන්ත ස්වර්ණතිලක මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී
2024.09.26 වන දින සිට බලපැවැත්වෙන පරිදි

**ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙනවිය**
අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන
අමාත්‍යාංශය. කොළඹ 01
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2024.10.21 වන දින සිට බලපැවැත්වෙන පරිදි

**ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා**
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2024.12.11 වන දින සිට බලපැවැත්වෙන පරිදි

**ඒ. චානක්‍ය ලියනගේ මහතා**
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය
2024.10.07 වන දින සිට බලපැවැත්වෙන පරිදි

# වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය



**නීතිඥ හේමන්ත ස්වර්ණතිලක මහතා**
සභාපති/ප්‍රධාන විධායක නිලධාරී.
2024.09.26 වන දින සිට බලපැවැත්වෙන පරිදි



**පී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා**
ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්.
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය.
2024.12.11 වන දින සිට බලපැවැත්වෙන පරිදි



**ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙනවිය**
අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.
කොළඹ 01
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය.
2024.10.21 වන දින සිට බලපැවැත්වෙන පරිදි



**ඒ. චානක්‍ය ලියනගේ මහතා**
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය.
2024.10.07 වන දින සිට බලපැවැත්වෙන පරිදි



**පී.ඒ.සී.කේ. කුමාර මහතා**
ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ,
භාරකාර මණ්ඩල සාමාජික.
අධ්‍යක්ෂ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය.
2025.01.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි

# අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ පැතිකඩ

**නීතිඥ එම්.ආර්. හේමන්ත ස්වර්ණතිලක මහතා** 2024.09.26 වන දින සිට



**සභාපති/ප්‍රධාන විධායක නිලධාරී**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සම්පූර්ණ නම** : හේමන්ත ස්වර්ණතිලක

**වර්තමාන තනතුර** : සභාපති/ප්‍රධාන විධායක නිලධාරී

**අධ්‍යාපන සුදුසුකම්**

**අධ්‍යාපන** : ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී (විශේෂ) උපාධිය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
මූල්‍ය ව්‍යාපාර පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය, කැලණිය විශ්ව විද්‍යාලය
වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA).

**කුසලතා සහ පළපුරුද්ද**

**වෘත්තීය** : නීතිඥ
: ප්‍රසිද්ධ නොතාරිස්, සමාගම් ලේකම්, දිවුරුම් කොමසාරිස්
: සාමාජික - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (රාජ්‍ය අංශය) (CPFA)
: සාමාජික - වරලත් රාජ්‍ය මූල්‍ය හා ගණකාධිකරණ ආයතනය (ලන්ඩන්) (CIPFA)

**වෙනත් තනතුරු/පත්වීම්** :

**පෙර පත්වීම්** :

: අධ්‍යක්ෂ - මුදල්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
: අධ්‍යක්ෂ - දූත මණ්ඩල ගිණුම්, විදේශ කටයුතු අමාත්‍යාංශය
: Head of Chancery and Chargé d'affaires - ශ්‍රී ලංකා තානාපති කාර්යාලය, යැංගොං, මියැන්මාරය
: අධ්‍යක්ෂ (අමාත්‍යාංශයේ නිරීක්ෂක)- ලංකා හොස්පිට්ල් ලිමිටඩ් සහ ලංකා හොස්පිට්ල් ඩයග්නොස්ටික්ස් ලිමිටඩ්
: අධ්‍යක්ෂ - උඩරට උරුමය ආරක්ෂා කිරීම සඳහා වන අන්තර් ව්‍යවස්ථාපිත මණ්ඩලය
: ප්‍රධාන මූල්‍ය නිලධාරී - රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යාංශය
: අධ්‍යක්ෂ ජනරාල් (ගිණුම් සහ මුදල්) - සෞඛ්‍ය අමාත්‍යාංශය
: ප්‍රධාන මූල්‍ය නිලධාරී - සෞඛ්‍ය අමාත්‍යාංශය
: ප්‍රධාන මූල්‍ය නිලධාරී - අධ්‍යාපන අමාත්‍යාංශය

**ජී.එම්.ආර්.ඩී. අපොන්සු මහතා** 2024.12.11 වන දින සිට

**ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (මූල්‍ය සහ ආර්ථික කටයුතු)**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය



**සම්පූර්ණ නම** : ගෝනිය මාලිමගේ රසල් ඩේවිඩ්සන් අපොන්සු

**වර්තමාන තනතුර** : ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (මූල්‍ය සහ ආර්ථික කටයුතු)

**අධ්‍යාපන සුදුසුකම්**

**අධ්‍යාපන**

: ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාපති උපාධිය (2008-2009) - ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය.

: ජාත්‍යන්තර සහ සංවර්ධන ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2007-2008)- ඕස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය.

: සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (2004-2005) සංවර්ධන ආර්ථික විද්‍යා ආයතනය උසස් පාසල, චිබා, ජපානය.

: භෞතික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (2002-2004), කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව.

: විද්‍යාවේදී (භෞතික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය) (1990-1994), රුහුණු විශ්ව විද්‍යාලය, මාතර, ශ්‍රී ලංකාව.

**කුසලතා සහ පළපුරුද්ද**

**වෘත්තීය**

: ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් (මුදල් හා ආර්ථික කටයුතු), ජනාධිපති ලේකම් කාර්යාලය, 2024 සැප්තැම්බර් සිට මේ දක්වා.

: අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව (NPD), 2024 අගෝස්තු සිට 2024 සැප්තැම්බර් දක්වා.

: අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව (DPMM), 2024 ජූනි සිට 2024 අගෝස්තු දක්වා.

: ජ්‍යෙෂ්ඨ උපදේශක - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), 2024 ජනවාරි සිට 2024 ජූනි දක්වා.

: අධ්‍යක්ෂ (සැලසුම්)- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, 2012 ජනවාරි සිට 2024 ජනවාරි දක්වා.

: ව්‍යාපෘති අධ්‍යක්ෂ (වැඩබලන) - නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම් ව්‍යාපෘතිය - 2022 ජනවාරි සිට 2024 ජනවාරි දක්වා.

: අධ්‍යක්ෂ (වැ.බ.) - ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය. 2017 මැයි 20 සිට 2018 ජනවාරි දක්වා (අධ්‍යක්ෂ - සැලසුම්) තනතුරට අමතරව).

: නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (සැලසුම් සහ ක්‍රියාත්මක කිරීමේ සහය), උසස් අධ්‍යාපනහ පුළුල් කිරීම හා සංවර්ධනය කඩිනම් කිරීමේ ව්‍යාපෘතිය AHEAD (ලෝක බැංකු අරමුදල්) 2017 සැප්තැම්බර් සිට 2020 සැප්තැම්බර් දක්වා අර්ධකාලීන පදනම මත (අධ්‍යක්ෂ (සැලසුම්) තනතුරට අමතරව)

: සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය- 2010 මැයි සිට 2012 ජනවාරි දක්වා.

: සහකාර අධ්‍යක්ෂ - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2009 පෙබරවාරි- මැයි 2010.

: සහකාර අධ්‍යක්ෂ - සංවර්ධන මුදල් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2006 අගෝස්තු-2009 පෙබරවාරි.

: සහකාර අධ්‍යක්ෂ - ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2004 ජුනි-2006 අගෝස්තු.

: සහකාර අධ්‍යක්ෂ - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 2002 ජනවාරි - 2004 ජුනි.

: බදු නිලධාරී - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය, 1998 නොවැම්බර් - 2002 ජනවාරි.

**වෙනත් පත්වීම් / තනතුරු**

: භෞතික විද්‍යා සහාය කථිකාචාර්ය - භෞතික විද්‍යා දෙපාර්තමේන්තුව, රුහුණු විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 1995 පෙබරවාරි - 1998 නොවැම්බර්.

: කථිකාචාර්ය (අර්ධ කාලීන) - කළමනාකරණ සහ විද්‍යා ආයතනය (IMS), නුගේගොඩ, ශ්‍රී ලංකාව, 2005-2007 සහ 2010.

: කථිකාචාර්ය - මානව සම්පත් අභිවර්ධන ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2014 සිට.

: බාහිර කථිකාචාර්ය - මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2006.

: බාහිර කථිකාචාර්ය - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA)- 2009, 2010, 2020.

: ජ්‍යෙෂ්ඨ උපදේශක (අනුයුක්ත පදනම) - ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) - 2024 ජනවාරි සිට.

: බාහිර කථිකාචාර්ය - ඇගයීම් මධ්‍යස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, 2024 ජනවාරි සිට.

**පෙර පත්වීම්**

: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිජන පර්යේෂණ හා පුහුණු ආයතනය (HARTI), ශ්‍රී ලංකාව, 2006.

: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- පරමාණුක බලශක්ති අධිකාරිය, ශ්‍රී ලංකාව, 2009.

: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික- පශ්චාත් උපාධි විද්‍යා ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, 2013 සිට 2022 දක්වා.

: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - ශ්‍රී ලංකා පේෂකර්ම ආයතනය, 2014.

: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ආයතනය, කැලණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව, 2015 සිට 2019 දක්වා.

: ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කවුන්සිලයේ ස්ථාවර කමිටු සාමාජික 2017 සිට 2024 දක්වා.

: අධ්‍යයන මණ්ඩල සාමාජික, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, 2021 සිට 2024 දක්වා.

: පාලක මණ්ඩලය සාමාජික - ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය, 2023 සිට 2024 දක්වා.

: කළමනාකරණ මණ්ඩලයේ සාමාජික- ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලයේ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය, 2023 සිට 2004 දක්වා.

: වෘත්තීය සාමාජිකත්වය, ශ්‍රී ලංකා ඇගයීම් සංගමයේ සාමාජික, 2021 සිට.

: කවුන්සිල සාමාජික, කැලණිය විශ්ව විද්‍යාලය 2025 සිට.

**ඩී.සී.ඩබ්ලිව්. හපුගොඩ මෙනවිය** 2024.10.21 වන දින සිට



**අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය. කොළඹ 01

| | | |
|---|---|---|
| **සම්පූර්ණ නම** | : | දීපිකා ක්‍රිෂාන්ති වික්‍රමරත්න හපුගොඩ |
| **වර්තමාන තනතුර** | : | අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ආයතනික කටයුතු, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |

**අධ්‍යාපන සුදුසුකම්**

**අධ්‍යාපන** : 2022: රාජ්‍ය ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ උසස් සහතිකය මෙට්‍රොපොලිටන් කැම්පස් (කලින් මිලෝදා මූල්‍ය අධ්‍යයන විද්‍යාපීඨය).

: 2004: ශාස්ත්‍රපති උපාධිය (ජාත්‍යන්තර සංවර්ධනය)
දකුණු ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය, ඇඩිලේඩ්, ඕස්ට්‍රේලියාව

: 2001: සංවර්ධන අධ්‍යයන පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් පිළිබඳ, උසස් අධ්‍යාපන ආයතනය, ටෝකියෝ, ජපානය.

: 2000: ආර්ථික සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව
කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

: 1998: උප ජාතික මට්ටමේ සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

: 1992 : විද්‍යාවේදී. රාජ්‍ය පරිපාලන (විශේෂ) උපාධිය, (දෙවන පන්තියේ පහළ සාමාර්ථය) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, කොළඹ, ශ්‍රී ලංකාව.

**වෘත්තීය** : ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ බලපත්‍රලාභී සහතිකය ලබා ඇති අතර වෘත්තීය 1 කොටස විභාගය සමත් වී ඇත.

**කුසලතා සහ පළපුරුද්ද**

**සේවා පළපුරුද්ද**

1994 මැයි 2 වන දින ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයට පත්වී රජයේ සේවයට බැඳුණු අතර වසර 30 ට අධික පළපුරුද්දක් ඇත.

: 1994 මැයි - 1999 පෙබරවාරි: සහකාර අධ්‍යක්ෂ - සැලසුම්, මැදුම්බර, තෙල්දෙණිය සහ කන්දෙකැටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල,

: 1999 පෙබරවාරි - 2002 මැයි: සහකාර අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

: 2002 මැයි - 2004 මැයි: වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

: 2004 මැයි - 2008 මාර්තු: නියෝජ්‍ය අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

: 2008 මාර්තු - 2010 දෙසැම්බර්: අධ්‍යක්ෂ, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

: 2011 ජනවාරි - 2013 මැයි: අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

: 2013 මැයි - 2020 දෙසැම්බර්: අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල්, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව

: 2021 ජනවාරි සිට මේ දක්වා: අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, මුදල් අමාත්‍යාංශය

**වෙනත් සේවා පළපුරුද්ද**

: 1989 ජනවාරි සිට 1989 නොවැම්බර්: පුහුණුලාභී ගිණුම් ලිපිකරු, සී/ස සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම, මහනුවර

: 1989 දෙසැම්බර් සිට 1991 නොවැම්බර් දක්වා:ගිණුම් ලිපිකරු - අනියම්, ශ්‍රී ලංකා මහ බැංකුව

: 1992 සිට 1994 අප්‍රේල් දක්වා: විගණන පුහුණුලාභී, Burah Hathy & Co., වරලත් ගණකාධිකාරී (වර්තමාන BDO)

**වෙනත් පත්වීම්/තනතුරු**

: ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, සී/ස ලංකා ගල් අඟුරු (පුද්ගලික) සමාගම සහ සී/ස ජාතික ලුණු සමාගම.

: පෙර පත්වීම් - පශ්චාත් උපාධි විද්‍යා ආයතනය, ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය, ජය බහාලුම් පර්යන්තය, රාජ්‍ය ඖෂධ සංස්ථාව, ජාතික ප්‍රවාහන කොමිෂන් සභාව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව.

**වාස්තු විද්‍යාඥ ඒ. චානක්‍ය ලියනගේ මහතා** 2024.10.07 වන දින සිට



**අධ්‍යක්ෂ**
සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සම්පූර්ණ නම** : වාස්තු විද්‍යාඥ අර්ජන්මල් චානක්‍ය ලියනගේ
**වර්තමාන තනතුර** : වරලත් වාස්තු විද්‍යාඥ / ව්‍යාපෘති කළමනාකරු

**අධ්‍යාපන සුදුසුකම්**

**අධ්‍යාපන** : පශ්චාත් උපාධි ඩිප්ලෝමාව (ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය), මොරටුව විශ්වවිද්‍යාලය, 1996
: M.Sc (වාස්තු විද්‍යා) උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලය, 1988
: බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයන්ගේ රාජකීය ආයතනය, ලන්ඩන්, I වෙනි කොටස, 1980
: විද්‍යාවේදී (B.E.) උපාධිය, මොරටුව විශ්වවිද්‍යාලය, 1980
: අධි තාක්ෂණික කෘෂි ව්‍යවසායකත්වය පිළිබඳ උසස් ඩිප්ලෝමාව, 2023
: රාජකීය වරලත් මිනින්දෝරු ආයතනයේ (RICS) වරලත් සාමාජික - ලියාපදිංචි අංකය: 6753300-2017

**වෘත්තීය** : ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලයේ සහකාර වෘත්තික - 2013
: ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ (IPMSL) ආශ්‍රිත සාමාජික - 2012
: ශ්‍රී ලංකා ව්‍යාපෘති කළමනාකරුවන්ගේ ආයතනයේ (SLAPM) ආයතනික සාමාජික - 2012
: ශ්‍රී ලංකා පාරිසරික වෘත්තිකයන්ගේ ආයතනයේ වරලත් සාමාජික -2011
: වෘත්තීය සංගම් සංවිධානයේ මධ්‍යස්ථාන යාවජීව (OPA)සාමාජික - ලියාපදිංචි අංකය: 724-1999)
: බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාඥයන්ගේ රාජකීය ආයතනයේ වරලත් සාමාජික (ලියාපදිංචි අංකය: 6862362) - 1991
: ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයන්ගේ ආයතනයේ වරලත් සාමාජික -1990

**කුසලතා සහ පළපුරුද්ද**

**සේවා පළපුරුද්ද:** **1990 සිට මේ දක්වා**

සේවායෝජක : M/S ඩිසයින් කන්සල්ටන්ට්, බත්තරමුල්ල
දරන ලද තනතුර : ප්‍රධාන වාස්තු විද්‍යාඥ / ව්‍යාපෘති කළමනාකරු / හරිත උපදේශක (තනි හිමිකරු)

**2003 ජනවාරි සිට 2003 දෙසැම්බර් දක්වා**
සේවායෝජක : Diar Consult-Dubai (U.A.E)
දරන ලද තනතුර : ව්‍යාපෘති කළමනාකරු (ප්‍රධාන කාර්යාලය)

**1992 නොවැම්බර් සිට 1997 සැප්තැම්බර් දක්වා**
සේවායෝජක : නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය, කොළඹ. (ICTAD) (වර්තමාන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය)
දරන ලද තනතුර : සහකාර අධ්‍යක්ෂ

**1989 මැයි සිට 1992 නොවැම්බර් දක්වා**
සේවායෝජක : නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය, (CHPB) පැලවත්ත
දරන ලද තනතුර : සහකාර අධ්‍යක්ෂ

**1983 ඔක්තෝබර් සිට - 1989 මැයි දක්වා**
සේවායෝජක : මහවැලි ඉංජිනේරු සහ ඉදිකිරීම් ආයතනයේ මහවැලි වාස්තු විද්‍යා ඒකකය. (MAU-MECA)
දරන ලද තනතුර : ව්‍යාපෘති වාස්තු විද්‍යාඥ

**2002 සැප්තැම්බර් සිට - 2002 නොවැම්බර් දක්වා**
සේවායෝජක : RMJM - ඩුබායි - එක්සත් අරාබි එමීර් රාජ්‍යය
දරන ලද තනතුර : වාස්තු විද්‍යාඥ

**1983 පෙබරවාරි සිට - 1983 ඔක්තෝබර් දක්වා**
සේවායෝජක : සෝමස්කන්දරාජා කන්දයියා
දරන ලද තනතුර : ව්‍යාපෘති වාස්තු විද්‍යාඥ

**1980 ජුනි සිට - 1983 පෙබරවාරි දක්වා**
සේවායෝජක : ඉංජිනියරිං කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම
දරන ලද තනතුර : වාස්තු විද්‍යාඥ

**1979 අගෝස්තු සිට - 1980 ජුනි දක්වා**

සේවායෝජක : ටානියා සහ සුරේන් වික්‍රමසිංහ වාස්තු විද්‍යාඥයෝ
දරන ලද තනතුර : සහකාර වාස්තු විද්‍යාඥ

**වෙනත් සේවා පළපුරුද්ද**

: JABIC විසින් අරමුදල් සපයන ලද, මහනුවර අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියේ ජාතික වාස්තු විද්‍යාඥ ලෙස සේවය කිරීම - 2009.

: ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සපයන ලද යාපනය - කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය සඳහා ජාතික වාස්තු විද්‍යාඥ ලෙස සේවය කිරීම

: මන්නාරම දිස්ත්‍රික් සංචාරක සංවර්ධන වැඩසටහනේ ප්‍රධාන සංචාරක ව්‍යාපාර සැලැස්මේ තාක්ෂණික යෝජනාව සකස් කිරීම සඳහා ජාතික වාස්තු විද්‍යාඥ ලෙස සේවය කිරීම, TMS සඳහා IFC තේරීම් අංක 1120495-2013

**විදේශ පුහුණුව**

: දකුණු කොරියාවේ ඉන්චොන් හි ඉදිකිරීම් තාක්ෂණ ආයතනයේ ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ මාස 3 ක පාඨමාලාවක් හැදෑරීම - 1984.

: ජපානයේ දින හතක අධ්‍යයන චාරිකාව - 1984.

: ඉන්දුනීසියාවේ ජකර්තා නුවර පැවති ජාත්‍යන්තර HABINET සම්මන්ත්‍රණයකට සහභාගී වීම - 1990.

: සිංගප්පූරුවේ අධ්‍යයන චාරිකාව - 1990.

: එක්සත් රාජධානියේ ස්ලෝ විශ්වවිද්‍යාලයේ පුහුණු කළමනාකරණය පිළිබඳ පරිගණක යෙදුම් පාඨමාලාව හැදෑරීම -1992.

: ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද එක් සතියක කටාර් සංචාරයට සහභාගී වීම - 2008.

: එක්සත් රාජධානියේ ස්ලෝ විශ්වවිද්‍යාලයේ පැවති පුහුණු කළමනාකරුවන්ගේ පුහුණුකරු ත්‍රෛමාසික පාඨමාලාව හැදෑරීම - 1992.

: මැලේසියාවේ "පැනසොනික්" VRF වායු සමීකරණ නිෂ්පාදන කර්මාන්ත ශාලාව සහ පැනසොනික් පරිසර ජාතික මධ්‍යස්ථානය නැරඹීම - 2011

: ඉන්දියාවේ අහමදාබාද් හි පිහිටි සීතල දාම ශීතාගාර නැරඹීම - 2017

**දේශීය පුහුණුව**

: සතියක ඉදිකිරීම් කළමනාකරණ පාඨමාලාවක් හැදෑරීම. (M.E.C.A.)

: ලෝක කම්කරු සංවිධානය/එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් පවත්වන ලද නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ බාහිර කාර්ය මණ්ඩලය සඳහා පවත්වන ලද පුහුණු ක්‍රමවේදය පිළිබඳ වැඩමුළු මාලාවකට සහභාගී වීම - 1989.

: TMC විසින් පවත්වන ලද ISO 9001:2000 පිළිබඳ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය සාර්ථකව නිම කිරීම - 2003

: මූලික පරිගණක භාෂා පාඨමාලාව (කොළඹ විශ්වවිද්‍යාලය)

: ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ දී (NBRO) පරිගණක ආධාරක නිර්මාණය (CAD) පාඨමාලාවක් හැදෑරීම.

: මධ්‍යම පරිසර අධිකාරියේ දී ශ්‍රී ලංකා පරිසර වෘත්තිකයන්ගේ ආයතනය විසින් පවත්වන ලද පරිසර බලපෑම් ඇගයීම් (IEE/EIA) වාර්තා සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන හැදෑරීම.

**වෙනත් පත්වීම්/තනතුරු**

: ලංකා විදුලිබල පුද්ගලික සමාගම සඳහා ස්මාර්ට් ග්‍රිඩ් දත්ත කළමනාකරණ මධ්‍යස්ථානයේ සැලසුම් සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ව්‍යාපෘති උපදේශක.

**මෙයට පෙර පත්වීම්/තනතුරු**

: පැලවත්ත ජාතික විභාග මධ්‍යස්ථානය සඳහා උපදේශකයින් ප්‍රසම්පාදනය කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජික.

: පැලවත්ත CETRAC ගොඩනැගිල්ල සඳහා කොන්ත්‍රාත්කරුවන් ප්‍රසම්පාදනය කිරීම සඳහා වූ තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජික.

: පැලවත්ත නිවාස සැලසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථාන (CHPB) ගොඩනැගිල්ලේ සැලසුම් සහ ඉදිකිරීම් අධීක්ෂණය සඳහා ව්‍යාපෘති උපදේශක - 1992.

: අතහැර දමන ලද ව්‍යාපෘති හතරක් සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ විමර්ශන කමිටුවේ සභාපති සහ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සඳහා නැගෙනහිර සහ දකුණු පළාත් සඳහා ව්‍යාපෘති කළමනාකරු - 2016-2020.

: ශ්‍රී ලංකා ප්‍රසම්පාදන කොමිසමේ සමාලෝචක, 2018-2019.

**පී.ඒ.සී.කේ. කුමාර මහතා** 2025.01.28 වන දින සිට



**අධ්‍යක්ෂ**

අධ්‍යක්ෂ - සංවර්ධන ලොතරැයි මණ්ඩලය

| | | |
|---|---|---|
| **සම්පූර්ණ නම** | : | පේදුරුකේ අතුකෝරාලලාගේ චන්දන කුමුදු කුමාර |
| **වර්තමාන තනතුර** | : | ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ, භාරකාර මණ්ඩල සාමාජික |

**අධ්‍යාපන සුදුසුකම්, කුසලතා සහ පළපුරුද්ද**

| | | |
|---|---|---|
| **අධ්‍යාපන** | : | B.B. Mgt (Acc) විශේෂ උපාධිය (දෙවන පංතිය ඉහළ සාමාර්ථය) - කැලණිය විශ්වවිද්‍යාලය<br>අවසාන මට්ටම 1 වෙනි විභාගය - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය<br>යාවජීව සාමාජික - AAT ශ්‍රී ලංකා |
| **වෘත්තීය** | : | බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 19 ට අධික පළපුරුද්ද. |
| | : | මූල්‍ය ගිණුම්කරණය, විගණනය සහ බදුකරණය පිළිබඳ වසර 5 ට අධික පළපුරුද්ද. |
| | : | කැලණිය විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කර ඇත. |

# කළමනාකරණ කණ්ඩායම

**කළමනාකරණ කණ්ඩායම - 2024.12.31 දිනට**



01

**නීතිඥ හේමන්ත ස්වර්ණතිලක මහතා**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී



02

**ඩබ්ලිව්.කේ.ඒ. අනුර ජයරත්න මහතා**
සාමාන්‍යාධිකාරී



03

**ඩී.ඩී.සී. දම්මින්ද මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි)



04

**ජේ.ඒ.ටී. කසුන් ජයසූරිය මහතා**
වැ.බ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)



05

**නිශාන් පෙරේරා මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)



06

**එස්.එම්.ඒ.ඩබ්ලිව්. උදය කුමාර මහතා**
අභ්‍යන්තර විගණක



07

**ආචාර්ය අසංකා එස් ගුණසිංහ මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි)



08

**කේ.ආර්. ප්‍රසාද් රණසිංහ මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(මානව සම්පත් සහ පරිපාලන)



09

**පී.ඩී.යූ. මලින්ත මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන)



10

**සී.සී. අයිලප්පෙරුම මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)



11

**එම්.බී.එම්.එන්.කේ. බලගල්ල මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්)

# කණිෂ්ඨ කළමනාකරුවන්



01

**ඊ.ඩී.අයි.එන්.එස්. අබේරත්න මහතා**
පරිපාලන නිලධාරී



02

**සී.එන්. තෙවරප්පෙරුම මහත්මිය**
මානව සම්පත් නිලධාරී



03

**එන්.වී. ඉන්දික උපුල් මහතා**
ගිණුම් නිලධාරී



04

**පී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය**
අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී



05

**බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා**
ප්‍රසම්පාදන නිලධාරී



06

**ආර්.ඩී.සී. රාජපක්ෂ මහත්මිය**
ගිණුම් නිලධාරී



07

**අයි.ඩී. පත්ම කුමාරසිරි මහතා**
කලාප කළමනාකරු



08

**පී.ඒ.ආර්.එස්. රණතුංග මහතා**
කලාප කළමනාකරු



09

**එම්.කේ.ඒ.අයි. කමල්සිරි මහතා**
කලාප කළමනාකරු



10

**ඩී.එම්.බී.එල්. මහින්ද මහතා**
කලාප කළමනාකරු



11

**එම්.එල්. ගෞරී කෞශල්‍යා මහත්මිය**
කලාප කළමනාකරු



12

**එම්.ඒ.එල්.එන්. ගුණසේකර මහත්මිය**
ගිණුම් නිලධාරී



13

**ආර්.ඒ.ඩබ්ලිව්.පී. රූපසිංහ මහත්මිය**
ගිණුම් නිලධාරී



14

**යූ.පී. ඉලේපෙරුම මහතා**
පද්ධති විශ්ලේෂක



15

**මේජර්. ජේ.එම්.ඩී.ඒ. ක්‍රිෂාන්ත මහතා**
ප්‍රධාන ආරක්ෂක නිලධාරී



16

**ආර්.ඒ. සුනිල් රත්නායක මහතා**
කලාප කළමනාකරු



17

**ආර්.එම්.යූ.එස්. කුමාර මහතා**
කලාප කළමනාකරු



18

**බී.පී. ගෝකුල ප්‍රනාන්දු මහතා**
ප්‍රවාහන නිලධාරී



19

**සී.ජේ.බී. ජයවර්ධන මහතා**
කලාප කළමනාකරු

# මෙහෙයුම් සමාලෝචනය

### 2024 වර්ෂයේ අලෙවිකරණ මෙහෙයුම් සම්බන්ධ විශේෂ කරුණු

2024 වර්ෂය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වසර 41 ක ඉතිහාසය තුළ මේ දක්වා වාර්තාගත ඉහළ ම ආදායම අත්කර ගනිමින් කැපී පෙනෙන සන්ධිස්ථානයක් සනිටුහන් කළේ ය. එක් වර්ෂයක් තුළ මෙතරම් පෙර නොවූ විරූ ආදායමක් උපයා ගැනීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය ආයතනයක් ලෙස අත්කර ගත් කැපී පෙනෙන ජයග්‍රහණයකි. ශ්‍රී ලාංකික ලොතරැයි පාරිභෝගිකයන්ගේ ජීවිත පරිවර්තනය කරමින් සහ රට පුරා අතිවිශාල ජයග්‍රාහකයින් සංඛ්‍යාවක් බිහි කරමින්, මණ්ඩලය වාර්තාගත ආදායමක් උපයා ගත්තා පමණක් නොව, රටට ද ඉමහත් දායකත්වයක් ලබා දී ඇත. මෙම සාර්ථකත්වය සැබවින් ම වාසනාවකට වඩා ජයග්‍රහණයකි.

ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන අරමුදලට මූල්‍ය දායකත්වය සපයන ශ්‍රී ලංකාවේ එකම ආයතනය ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලය අඛණ්ඩව සැලකිය යුතු බලපෑමක් ඇති කරයි. එයට අමතරව, 2024 වර්ෂය අතිවිශාල සාර්ථකත්වයක් අත්කර ගත් වර්ෂයක් වන අතර, එය බොහෝ මිලියනපතියන්, කෝටිපතියන් සහ තවත් දහස් ගණනක් ත්‍යාගලාභීන් බිහි කළ, මණ්ඩලයේ ඉතිහාසයේ සැබවින් ම ජයග්‍රාහී වර්ෂයක් බවට පත් විය.

2024 වර්ෂයේ මෙම සාර්ථක ගමනේ දී අත්කර ගත් ප්‍රධාන සන්ධිස්ථාන පහත සඳහන් පරිදි දැක්විය හැකිය:

### ප්‍රවර්ධන වැඩසටහන් සහ ත්‍යාග ව්‍යුහයේ වෙනස්වීම්

2023 වර්ෂයේ අග භාගයේදී, ලොතරැයි ටිකට්පත් මිල ඉහළ යාමෙන් පසුව සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි ටිකට්පත් හරහා පිරිනමන ත්‍යාග මුදල වැඩි කිරීමේ අරමුණු ඇතිව 2023 දෙසැම්බර් 11 වන දින "සෙකන්ඩ් චාන්ස්" නැමති විශේෂ දිනුම් ඇදීම නැවත හඳුන්වා දුන්නේ ය. මෙම දිනුම් ඇදීම හරහා අද කෝටිපති, සුපර් බෝල්, ශනිදා සහ සුපිරි ධන සම්පත යන ලොතරැයි ටිකට්පත් සඳහා රු. 100,000 ක මුදල් ත්‍යාග සහ ලග්න වාසනාව ලොතරැයි ටිකට්පත් සඳහා රු. 50,000 ක මුදල් ත්‍යාග පිරිනමන ලදී. පසුව, 2023 දෙසැම්බර් 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ජයෝදා ලොතරැයි ටිකට්පත් මඟින් "සෙකන්ඩ් චාන්ස්" විශේෂ දිනුම් ඇදීම් මාලාව හරහා රු. 50,000 ක මුදල් ත්‍යාග පිරිනමන ලද අතර එය 2024 පෙබරවාරි 8 වන දින අවසන් විය.

පාරිභෝගිකයින්ගේ සහ අලෙවි නියෝජිතයන්ගේ ඉල්ලීම්වලට ප්‍රතිචාර වශයෙන්, සංවර්ධන ලොතරැයි මණ්ඩලය 2024 මාර්තු 25 වන දින සිට ප්‍රධාන දිනුම් ඇදීමෙන් පසුව 'සෙකන්ඩ් චාන්ස්' විශේෂ දිනුම් ඇදීම නැවත හඳුන්වා දීම මඟින් ලොතරැයි ටිකට්පත් හරහා පිරිනමන ත්‍යාග මුදල් වැඩි කළේ ය. මෙමගින් අද කෝටිපති, කප්රුක, සුපර් බෝල් සහ සුපිරි ධන සම්පත් ලොතරැයි ටිකට්පත් සඳහා රු. 100,000 ක මුදල් ත්‍යාග මෙන්ම ලග්න වාසනාව ලොතරැයි ටිකට්පත් සඳහා රු. 50,000 ක මුදල් ත්‍යාග ලබා දෙන ලදී. 2024 ජූනි 3 වන දින සිට බලපැවැත්වෙන පරිදි කප්රුක, සුපර් බෝල්, සසිරි සහ ජයෝදා ලොතරැයි ටිකට්පත් සඳහා පවත්වන ලද 'සෙකන්ඩ් චාන්ස්' විශේෂ දිනුම් ඇදීම් මාලාව අවසන් කරන ලදී.

### i. ලග්න වාසනා

"ඔබ දිනවන ධන යෝගය", "ලග්න වාසනා" ලොතරැයියේ "සුපිරි ධන යෝගය" නමින් විශේෂ දිනුම් ඇදීමක් 2024 මාර්තු 27 වන බදාදා දින පවත්වන ලදී. මෙම දිනුම් ඇදීම සඳහා ලොතරැයි ටිකට්පත් මිලියන 2.17 ක් අලෙවි වූ අතර, පාරිභෝගිකයන්ට ලබා දෙන ලද මුළු මුදල් ත්‍යාග මුදල රු. 46,736,680 ක් විය.

තවද, "ලග්න වාසනා" වෙළඳපොළේ ප්‍රමුඛතම ලොතරැයියක් ලෙස ස්ථාපිත කිරීමේ අරමුණ ඇතිව, 2024 සැප්තැම්බර් 12 වන බ්‍රහස්පතින්දා දින "සුපිරි ධන යෝගය" නමින් තවත් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම අවස්ථාවේදී, ලොතරැයි ටිකට්පත් මිලියන 2 ක් අලෙවි වූ අතර, රු. 47,080,120 ක මුදලක් ත්‍යාග ලෙස මහජනතාවට බෙදා දෙන ලදී.

වෙළඳපොළේ වැඩිම ත්‍යාග සංඛ්‍යාවක් පිරිනමන ලොතරැයිය ලෙස ප්‍රසිද්ධියක් උසුලන "ලග්න වාසනා" ලොතරැයිය සඳහා 2024 දෙසැම්බර් 17 වන අඟහරුවාදා "සුපිරි ධන යෝගය" නමින් ම හැඳින්වූ තවත් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම දිනුම් ඇදීමේදී ද ලොතරැයි ටිකට්පත් මිලියන 2 ක් අලෙවි වූ අතර, රු. 48,572,730 ක මුදලක් ත්‍යාග ලෙස පාරිභෝගිකයින්ට ලබා දෙන ලදී.

### ii. අද කෝටිපති

'අද කෝටිපති' ලොතරැයි ටිකට්පත් මිලදී ගන්නා පාරිභෝගිකයින් සඳහා ත්‍යාග අවස්ථා වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව, 2024 නොවැම්බර් 28 වන බ්‍රහස්පතින්දා 'අද විශේෂ කෝටිපති' නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම විශේෂ දිනුම් ඇදීමේ දී ලොතරැයි ටිකට්පත් මිලියන 1.46 ක් අලෙවි වූ අතර, සැලකිය යුතු ජයග්‍රාහකයින් සංඛ්‍යාවකට රු. 110,012,377 ක ත්‍යාග මුදල් සාර්ථකව ප්‍රදානය කරන ලදී.

### iii. කප්රුක

සිතාගත නොහැකි තරමට සිහින සැබෑ කරන 'කප්රුක' ලොතරැයියේ මෙගා සුපිරි ජයමළු ප්‍රවර්ධනය කිරීම සඳහා, 2024 අප්‍රේල් 8 වන සඳුදා 'කප්රුක පවර් ප්ලේ' නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම දිනුම් ඇදීම හරහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් රු. 6,000,000 ක් වටිනා මෝටර් රථයක් සහ රු. 18,841,300 ක මුදල් ත්‍යාග ප්‍රදානය කරන ලදී.

කප්රුක ලොතරැයිය සඳහා ඇති ඉහළ ඉල්ලුම සපුරාලීමේ සහ එහි වෙළඳපොළ පැවැත්ම තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණු ඇතිව, 2024 දෙසැම්බර් 31 වන අඟහරුවාදා දින 'කප්රුක පවර් ප්ලේ' නමින් තවත් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම දිනුම් ඇදීමේදී ලොතරැයි ටිකට්පත් මිලියන 2.4 ක වාර්තාගත අලෙවියක් සිදු වූ අතර පාරිභෝගිකයින්ට රු. 47,857,864 ක මුදල් ත්‍යාග ලබා දෙන ලදී.

### iv. ශනිදා

'ශනිදා' ලොතරැයිය වෙළඳපොළේ ඉමහත් ජනප්‍රියත්වයක් අත්කර ගෙනඇත; එබැවින්, එහි වර්ධනය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව, 2024 ජූනි 28 වන බ්‍රහස්පතින්දා 'දිනුම් ෂුවර්' නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම දිනුම් ඇදීමේ දී ලොතරැයි ටිකට්පත් මිලියන 1.2 ක් අලෙවි විය. මෙම දිනුම් ඇදීම හරහා, රු. 100,000 බැගින් වූ මුදල් ත්‍යාග 14 ක් සහ රු. 50,000 බැගින් වූ මුදල් ත්‍යාග 12 ක් පිරිනමන ලද අතර, මුළු ත්‍යාග මුදල් රු. 23,659,000 ක් පාරිභෝගිකයින්ට බෙදා දෙන ලදී

### v. සුපිරි ධන සම්පත

2023 අග භාගයේදී වෙළඳපොළට හඳුන්වා දෙන ලද, මිලියන ගණනක ජයග්‍රහණ ගෙන දෙන "සුපිරි ධන සම්පත" ලොතරැයිය ජනප්‍රිය කිරීම සඳහා, 2024 ජනවාරි 31 වන බදාදා "ලකී බෝනස්" නමින් විශේෂ දිනුම් ඇදීමක් පවත්වන ලදී. මෙම දිනුම් ඇදීම සඳහා ලොතරැයි ටිකට්පත් මිලියන 1.1 ක් අලෙවි විය. මෙම දිනුම් ඇදීම හරහා ලොතරැයි පාරිභෝගිකයන් අතර රු. 28,899,600 ක මුළු මුදල් ත්‍යාග ප්‍රමාණයක් බෙදා දෙන ලදී.

### vi. සසිරි

වෙළඳපොළේ රුපියල් ලක්ෂ දෙකේ ත්‍යාග වැඩිම ගණනක් ලබා දෙන ලොතරැයිය ලෙස ජනප්‍රියත්වයට පත්ව ඇති 'සසිරි' ලොතරැයිය ප්‍රවර්ධනය කිරීම සඳහා, සතියකට දිනුම් ඇදීමේ වාර ගණන පහක් දක්වා වැඩි කිරීමෙන් එහි දිනුම් ඇදීමේ කාලසටහන සංශෝධනය කරන ලදී. ඒ අනුව, දිනුම් ඇදීම සඳහා නොවැම්බර් 2 වන දින සිට සෙනසුරාදා දිනය ද, නොවැම්බර් 7 වන දින සිට බ්‍රහස්පතින්දා දිනය ද එකතු කරන ලදී.

### 2024 වර්ෂයේ දී පිරිනමන ලද සුපිරි ත්‍යාග සහ අනෙකුත් ත්‍යාග

2024 වර්ෂයේ දී, පළමු, දෙවන, තෙවන සහ අනෙකුත් ත්‍යාග ලෙස පාර්භෝගිකයින්ට රු.බි. 15.3 ක මුදලක් පිරිනමන ලදී. එයට සුපිරි ත්‍යාග 33 ක්, මිලියනයේ ත්‍යාග 6 ක් සහ මිලියන දෙක (2,000,000) බැගින් වූ ත්‍යාග 387 ක් ඇතුළත් විය.

- **අද කෝටිපති**

අද කෝටිපති ලොතරැයි ටිකට් පත මගින් සුපිරි ත්‍යාග 2 ක්, රුපියල් මිලියන දෙකක ත්‍යාග 91 ක් සහ රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,985 ක් පිරිනමන ලදී. 2024 වර්ෂයේ දී පාර්භෝගිකයන් අතර බෙදා දෙන ලද මුළු ත්‍යාග මුදල රු. 2,305,918,601.60 කි.

- **ලග්න වාසනාව**

2024 වර්ෂයේ දී, සුපිරි ත්‍යාග 21 ක් (සුපිරි ධන යෝග) සහ රුපියල් මිලියනයේ ත්‍යාග 316 ක් ඇතුළුව රු. 3,922,378,656.40 ක් පාර්භෝගිකයින්ට ත්‍යාග ලෙස බෙදා දෙන ලදී.

- **සුපර් බෝල්**

2024 වර්ෂයේ දී, ලොතරැයි ලොවේ පෙරළිකාරයා ලෙස නම්කරන ලද සුපර් බෝල් ලොතරැයි ටිකට්පත හරහා රු. 102,540,384.00 ක් වටිනා සුපිරි ත්‍යාග පිරිනමන ලදී. එයට අමතරව, රුපියල් මිලියන දෙකක ත්‍යාග 70 ක් සහ රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,039 ක් බෙදා දෙන ලදී. පාර්භෝගිකයන් අතර බෙදා දෙන ලද මුළු ත්‍යාග මුදල රු. 1,553,706,904.00 ක් විය.

- **ශනිදා**

2024 වර්ෂයේ දී, ශනිදා ලොතරැයිය පාර්භෝගිකයින්ට රු. 2,127,251,184.80 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කළේය. මෙම මුදලට රුපියල් මිලියන දෙකක ත්‍යාග 76 ක් සහ රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,792 ක් ඇතුළත් විය.

- **කප්රුක**

දැවැන්ත සුපිරි ජයමල්ලක් සහ කෝටිපති ත්‍යාග රාශියක් සහිත කප්රුක ලොතරැයිය හරහා 2024 වර්ෂයේ දී මුළු ත්‍යාග මුදල ලෙස රු. 3,219,859,284 ක් පිරිනමන ලදී. මෙම මුදලට මිලියන 6 ක් වටිනා සුපිරි ත්‍යාගයක් සහ රුපියල් මිලියන දෙකක ත්‍යාග 145 ක් ඇතුළත් විය. තවද, ප්‍රධාන ජයමලුවලට අමතරව රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,706 ක් එයට ඇතුළත් විය.

- **ජයෝදා**

2024 වර්ෂයේ දී, ජයෝදා ලොතරැයිය රු. 286,917,080 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කළේ ය. මෙම මුදලට රුපියල් මිලියන දෙකක ත්‍යාග 22 ක් සහ රුපියල් ලක්ෂයේ ත්‍යාග 188 ක් ඇතුළත් විය.

- **සසිරි**

2024 වර්ෂයේ දී, සසිරි ලොතරැයිය මගින් රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,262 ක් ඇතුළුව රු. 462,439,800 ක ත්‍යාග මුදලක් ප්‍රදානය කළේය.

- **සුපිරි ධන සම්පත**

සුපිරි ධන සම්පත ලොතරැයිය මගින් රු. 32,430,256 ක්, රු. 24,237,704 ක් සහ රු. 23,477,052.14 ක් වටිනා සුපිරි ජයමළු 3 ක් ලබා දෙන ලදී. එයට අමතරව, එය 2024 වර්ෂයේ දී පාර්භෝගිකයින්ට ලක්ෂ විසිපහක ත්‍යාග 65 ක් සහ රුපියල් ලක්ෂ දෙකක ත්‍යාග 1,996 ක් පිරිනමන ලදී. 2024 වර්ෂයේ දී බෙදා දෙන ලද මුළු ත්‍යාග මුදල රු. 1,442,150,012.00 ක් විය.

### 2024 වර්ෂය සඳහා නව බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන් සහ අලෙවි නියෝජිතවරුන්පත් කිරීම

| දිස්ත්‍රික් අංකය | දිස්ත්‍රික්කය | බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන් | අලෙවි නියෝජිතයන් |
|---|---|---|---|
| 01 | කොළඹ | | 19 |
| 02 | කළුතර | | 06 |
| 03 | මහනුවර | 01 | 06 |
| 04 | මාතලේ | | 04 |
| 05 | නුවරඑළිය | | 02 |
| 06 | ගාල්ල | 01 | 09 |
| 07 | මාතර | | 03 |
| 08 | හම්බන්තොට | | 05 |
| 09 | යාපනය | | 02 |
| 10 | මන්නාරම | | - |
| 11 | වවුනියාව | | - |
| 12 | මඩකලපුව | 01 | 02 |
| 13 | අම්පාර | | 02 |
| 14 | ත්‍රිකුණාමලය | | 01 |
| 15 | කුරුණෑගල | | 07 |
| 16 | පුත්තලම | | 04 |
| 17 | අනුරාධපුරය | 01 | 01 |
| 18 | පොළොන්නරුව | | 02 |
| 19 | බදුල්ල | | 01 |
| 20 | මොණරාගල | | 02 |
| 21 | රත්නපුරය | | 06 |
| 22 | කෑගල්ල | | 04 |
| 23 | ගම්පහ | 03 | 11 |
| 24 | කිලිනොච්චිය | | 01 |
| 25 | මුලතිව් | | 01 |
| | | **07** | **101** |

## දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිත සහ අලෙවි නියෝජිත රැස්වීම්

### බෙදාහැරීමේ අලෙවි නියෝජිත රැස්වීම්

රට පුරා සිටින බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් සහ අලෙවි නියෝජිතයන් ගේ ජාලය විසින් 2023 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය වෙත ලබා දෙන ලද දායකත්වය අගය කිරීමේ සහ 2024 වර්ෂය සඳහා වන නව අලෙවිකරණ උපාය මාර්ග පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමේ අරමුණු ඇතිව "සංවර්ධන අභිමන්" සමුළුව අප්‍රේල් 29 වන දින බත්තරමුල්ල වෝටර්ස් එජ් හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලදී.

මෙම අලෙවි නියෝජිතයින්ගේ සමුළුවේ දී, සංවර්ධන ලොතරැයි මණ්ඩලය දිස්ත්‍රික් බෙදාහැරීමේ නියෝජිතයන්ගේ සහ අලෙවි නියෝජිතයින්ගේ සේවය අගය කිරීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, පහත සඳහන් පරිදි මුදල් ත්‍යාග සහ සම්මාන ප්‍රදානය කරන ලදී:

- ශ්‍රී ලංකාවේ ඉහළ ම ලොතරැයි අලෙවිය වාර්තා කළ බෙදාහැරීමේ අලෙවි නියෝජිත ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන.
- දිස්ත්‍රික්කය තුළ ඉහළ ම අලෙවිය වාර්තා කළ අලෙවි නියෝජිත ප්‍රථම, දෙවන සහ තෙවන ස්ථාන.

2024 වර්ෂයේ පළමු වන සහ දෙවන කාර්තුවල විකුණුම් සහ අලෙවිකරණ උපාය මාර්ග සමාලෝචනය කිරීම සඳහා 2024 නොවැම්බර් 11 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී 'බෙදාහැරීමේ අලෙවි නියෝජිත සමුළුවක්' සංවිධානය කරන ලදී. අලෙවි ප්‍රවර්ධනය සඳහා බෙදාහැරීමේ අලෙවි ජාලයෙන් ලැබෙන දායකත්වය අගය කිරීම සඳහා මෙම උත්සවය පවත්වන ලදී. මෙම රැස්වීමේ දී, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සහ අනාගත සැලසුම් පිළිබඳව සාකච්ඡා කරන ලදී. එයට අමතරව, එක් එක් බෙදාහැරීමේ අලෙවි නියෝජිතවරුන් විසින් අත්පත් කරගත් අලෙවි ප්‍රගතිය පිළිබඳ සමාලෝචනයක් ද සිදු කරන ලද අතර, එමගින් ඔවුන්ට ඔවුන්ගේ අදහස්, යෝජනා සහ ගැටළු එකිනෙකා සමග බෙදා ගැනීමට ද අවස්ථාවක් ලැබුණි.

### අලෙවි නියෝජිත රැස්වීම්

ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක ඇතුළුව දකුණු පළාතේ අලෙවි නියෝජිතයින් සඳහා රැස්වීමක් 2024 දෙසැම්බර් 8 වන දින මාතර ග්‍රෑන්ඩ් නව්රෝ හෝටල් පරිශ්‍රයේ දී පවත්වන ලදී. 2025 වර්ෂය සඳහා අලෙවි ඉලක්ක පිළිබඳව අලෙවි නියෝජිතයින් දැනුවත් කිරීම, සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අනාගත අලෙවි සැලසුම් පිළිබඳව දැනුවත් කිරීම, අලෙවි සහ ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සඳහා අලෙවි නියෝජිතයින් පෙළඹවීම සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලය කෙරෙහි ඔවුන්ගේ ළැදියාව ඉහළ නැංවීම සඳහා මෙම රැස්වීම සංවිධානය කරන ලදී.

මෙම රැස්වීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ඉදිරි අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සහ සැලසුම් පිළිබඳ සාකච්ඡා, එක් එක් නියෝජිතයන් විසින් අලෙවි ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ අදාළ ප්‍රදේශවල ඉහළ ම අලෙවියක් වාර්තා කළ අලෙවි නියෝජිතයින් ඇගයීමට මුදල් ත්‍යාග ප්‍රදානය කිරීම වැනි අංග ඇතුළත් විය. තවද, ලොතරැයි අලෙවියට අදාළ තම අදහස්, යෝජනා සහ ගැටළු බෙදා ගැනීමට ද අලෙවි නියෝජිතවරුන්ට අවස්ථාවක් ලබා දෙන ලදී.

දිවයින පුරා අලෙවි ජාලය ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විවිධ දිස්ත්‍රික්කවල අලෙවි සහායකයින් දිරිමත් කිරීම සඳහා 2024 වර්ෂය පුරා ම "අලෙවි පිළිසඳර" යන මාතෘකාව යටතේ සුහද රැස්වීම් මාලාවක් පවත්වන ලදී. ඒ පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ:

| දිනය | දිස්ත්‍රික්කය | ස්ථාන |
|---|---|---|
| 2024 මැයි 18 සහ 19 | අනුරාධපුරය | අනුරාධපුරය, මිහින්තලය, ගල්නෑව |
| 2024 අගෝස්තු 03 සහ 04 | කොළඹ | මහරගම, මොරටුව, කොළඹ, බත්තරමුල්ල |
| 2024 අගෝස්තු 24 සහ 25 | කුරුණෑගල | වාරියපොල, කුරුණෑගල, කුලියාපිටිය |
| 2024 අගෝස්තු 24 සහ 25 | හම්බන්තොට | තංගල්ල, හම්බන්තොට |

මෙම අලෙවි සහායකයින්ගේ රැස්වීම් අතරතුර, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අලෙවි සහායකයන්ගේ දත්ත සංචිතය යාවත්කාලීන කරන ලදී. එයට අමතරව, සෑම අලෙවි සහායකයෙකු සඳහාම මහජන බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක් විවෘත කරන ලද අතර, මණ්ඩලය විසින් රු. 1,000/- ක මූලික තැන්පතුවක් සහ මහජන බැංකුව විසින් රු. 500/- ක අතිරේක තැන්පතුවක් තැන්පත් කරන ලදී. ඇගයීමට ලක්කිරීමේ සංකේතයක් ලෙස, අලෙවි සහායකයින්ට මණ්ඩලයේ ලාංඡනය සහිත සන්නාමගත ටී-ෂර්ට් ද පිරිනමන ලදී.

## 2024 වර්ෂයේ දී අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයන් සඳහා පවත්වන ලද විශේෂ වැඩසටහන්

1. රුපියල් මිලියනයේ සිට රුපියල් මිලියන 100 දක්වා ත්‍යාග සහිත ලොතරැයි ටිකට්පත් අලෙවි කළ අලෙවි නියෝජිතයින්ට ලබා දුන් රු. 2,500 ක මුදල 2024 වර්ෂයේ දෙවන භාගයේ සිට රු. 5,000 දක්වා වැඩි කරන ලදී.
2. 2024 වර්ෂයේ දී ලොතරැයි අලෙවිසැල් 365 ක් ස්ටිකර් අලවා වැඩිදියුණු කර ඇති අතර, 2024 වර්ෂයේ දී ඒ සඳහා දරන ලද පිරිවැය රු. 9,279,830 ක් විය.
3. 2018 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය දිවයින පුරා අලෙවි නියෝජිතයින්ට 'Lottery Shop' පිහිටුවීම සඳහා අනුග්‍රහය දැක්වීමේ වැඩසටහනක් දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂය වන විට දිවයින පුරා 'Lottery Shop' 27 ක් ස්ථාපනය කර තිබුණි.
4. 2022 වර්ෂයේ දී, වෙළඳසැල්වල ලොතරැයි ටිකට්පත් විකිණීම සඳහා දිරිමත් කිරීමේ අරමුණ ඇතිව "සිල්ලර වෙළඳසැල් හරහා ලොතරැයි විකිණීමේ ව්‍යාපෘතිය" හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයේ දී දිවයින පුරා සිල්ලර වෙළඳසැල් 618 ක් වෙත ලොතරැයි ටිකට්පත් අලෙවිය හඳුන්වා දී ඇත.
5. විවිධ රෝගවලට ගොදුරු වී මිය ගිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකවරුන් සඳහා 2024 වර්ෂය දී රු. 6,048,500 ක මුදලක් වෙන් කරන ලදී.

6. විශ්වවිද්‍යාලවලට තේරී පත් වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ දරුවන් සඳහා 2024 වර්ෂයේ දී රු. 819,000 ක මුදලක් ලබාදී ඇත.

7. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකවරුන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබදීම සඳහා 2024 වර්ෂයේ දී රු. 314,500 ක මුදලක් වෙන් කරන ලදී.

8. 2024 වර්ෂයේදී දිවයින පුරා විසිරී සිටින සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් අතර උද්‍යාන කුඩ 100 ක් බෙදා දෙන ලදී.

9. 2024 ඔක්තෝබර් 29 වන දින, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එහි අලෙවි සහායකයින් අතරින් තෝරාගන්නා ලද ශාරීරික ආබාධ සහිත අලෙවි සහායකයින් හට ට්‍රයිසිකල් ප්‍රදානය කරන ලදී.

### සමාජ සත්කාරක වැඩසටහන්

2024 ජුනි මාසයේ දී, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යාමේදී මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන සිසුන්ට සහාය වීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කළේ ය. මෙම වැඩසටහන යටතේ, දිවයිනේ සියලු ම පාසල් ආවරණය වන බව සහතික කරමින් 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අධ්‍යයන සහ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කළ සිසුන් 100,000 ක් තෝරා ගන්නා ලදී. තෝරාගත් සෑම සිසුවෙකුට ම මාස 12 ක් සඳහා රු. 3,000 ක මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙන ලදී. එයට අමතරව, 2022/2023 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට ඉන් සාර්ථකව සමත්වී අ.පො.ස. උසස් පෙළ අධ්‍යයන කටයුතු සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 6,000 ක් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහනකට මණ්ඩලය පූර්ණ අනුග්‍රහය දැක්වූයේ ය. මෙම සිසුන් රට පුරා අධ්‍යාපන කලාප 100 ක් අතරින් තෝරා ගන්නා ලද අතර, ඔවුන් උසස් පෙළ විභාගය අවසන් කරන තෙක් මාස 24 ක් සඳහා රු. 6,000 ක මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම රු.මි. 71.5 ක් විය.

ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 2024 සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වන 'වසත් සිරිය' සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 5,000,000 ක මුදල් අනුග්‍රහයක් දැක්වූයේ ය.

වාණිජ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මහපොළ උසස් අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 1,000,000 ක මුදල් අනුග්‍රහයක් දක්වූයේය.

මහනුවර ශ්‍රී දළදා පෙරහැර සඳහා 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 2,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.

රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර සඳහා 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 1,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.

බෙල්ලන්විල රජමහා විහාරයේ 75 වන වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු. 2,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.

2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොටපොල, ගැටබරුව රජමහා විහාරයේ ඇසළ පෙරහැර සඳහා රු. 1,500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.

2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැලණිය දුරුතු පෙරහැර සඳහා රු. 500,000 ක දායකත්වයක් ලබා දුන්නේ ය.

2024 වර්ෂයේ දී ගංගාරාමයේ වාර්ෂික නවම් පෙරහැර සඳහා රු. 1,500,000 ක අනුග්‍රහයක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කළේ ය.

2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය බුද්ධ රශ්මි වෙසක් කලාපය සඳහා රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.

දැරණියගල ශ්‍රී සුමන සමන් දේවාලයේ ඇසළ පෙරහැර සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.

2024 වර්ෂයේ 'ස්වර්ණමය වසන්තයක් - කෑගල්ල දිස්ත්‍රික් රූපවාහිනී රන් හිරු උත්සවය' සඳහා රු. 500,000 ක අනුග්‍රාහකත්වයක් ලබා දෙමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රධාන අනුග්‍රාහකයෙක් ලෙස කටයුතු කළේ ය.

2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ 'ICTer 2024' සමුළුව සඳහා රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.

### විශේෂ වැඩසටහන්

2022 වර්ෂයේ ආරම්භ කරන ලද සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලොතරැයිපත් වලින් ජයග්‍රහණ ලබාගත් ජයග්‍රාහකයින්ට සහ එම ලොතරැයිපත් අලෙවි කළ අලෙවි නියෝජිතයින්ට ලොතරැයි අලෙවි කවුන්ටර ඉදිරිපිට දී මුදල් ත්‍යාග ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. අලෙවි නියෝජිතයින්ට ඔවුන්ගේ උත්සාහයන් වෙනුවෙන් සහතිකපත් සහ මුදල් ත්‍යාග ද පිරිනමන ලදී. 2024 වර්ෂයේ දී එම වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, ජනතාව යාවත්කාලීන කිරීම සඳහා ත්‍යාග බෙදා හැරීමේ ඡායාරූප ෆේස්බුක් මාධ්‍යයේ පළ කරන ලදී.

2024 අගෝස්තු 8 වන දින, 2023 වර්ෂයේ දී විශ්‍රාම ගිය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සහ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ වසර 20 ක් සේවය කළ සේවකයන්ට උපහාර පුදන ලදී.

# නිෂ්පාදන කළඹ පිළිබඳ දළ විශ්ලේෂණය

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ජනාධිපති අරමුදල හරහා උසස් අධ්‍යාපන සහ ප්‍රජා වැඩසටහන් සඳහා අරමුදල් සපයනු ලබයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රධාන නිෂ්පාදන වර්ග දෙක ක්ෂණික ලොතරැයිපත් සහ දිනුම් ඇදීමේ මුද්‍රිත ලොතරැයිපත් වේ. මෙම ලොතරැයිපත් සාම්ප්‍රදායික අලෙවි නියෝජිත ජාලය හරහා සහ 'DLB Sweep App' ලෙස හඳුන්වනු ලබන ජංගම යෙදවුම හරහා අලෙවි කරනු ලබයි.

- **දිනුම් අදිනු ලබන ලොතරැයි** — ලොතරැයි පතෙහි සඳහන් අංක ලොතරැයි දිනුම් ඇදීමෙන් තෝරා ගනු ලබන අංක සමග ගැළපීම මගින් මෙම ක්‍රීඩාව සිදු කරනු ලැබේ.
- **සූරන ලොතරැයි** — පූර්වයෙන් තීරණය කරන ලද ත්‍යාග තිබේද යන්න හෙළි කර ගැනීම සඳහා ක්ෂණික ලොතරැයි පතෙහි ඇති ක්ෂීර ස්ථරය සූරා ඉවත් කිරීම අදාල ත්‍යාග දිනාගත හැක.

| | | |
|---|---|---|
| දිනපතා | දිනපතා | දිනපතා |
| දිනපතා | දිනපතා | දිනපතා |
| සඳුදා/බදාදා | අඟහරුවාදා/බ්‍රහස්පතින්දා/සිකුරාදා/සෙනසුරාදා/ඉරිදා | ක්ෂණික |

## 1. අද කෝටිපති




### සන්නාම දැක්ම

වෙළඳපොළ ප්‍රමුඛයා වීම සහ ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ලොතරැයිය බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීබව වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : රතු, තද නිල්, රෝස, ලා නිල්, දම්, කහ සහ කොළ
**ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-**

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.4,000.00 |
| අංක හතර | රු.2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.200.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.50,000,000.00 |

## 2. ශනිදා




### සන්නාම දැක්ම

සඳුදා සිට ඉරිදා දක්වා සතියේ (දින 7)ලොතරැයි වෙළෙඳපොළේ ප්‍රමුඛතම සන්නාමය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ශ්‍රී ලංකාවේ සතියේ දින හතෙහිම ප්‍රමුඛතම සන්නාමය ලෙස, අති නවීනතම තාක්ෂණය තුළින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : ලා නිල්, කොළ, දම්, රතු, තැඹිලි, ලා කොළ, සහ රෝස
**ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-**

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම ඉංග්‍රීසි අකුරක් | රු.40.00 |
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.4,000.00 |
| අංක හතර | රු.2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.200.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.50,000,000.00 |

### 3. කප්රුක



**සන්නාම දැක්ම**

ජයමලු දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාවගේ සිහින සහ අපේක්ෂාවන් ඉටු කර දෙන ලොතරැයි සන්නාමය බවට පත්වීම.

**සන්නාම මෙහෙවර**

සුපිරි ජයමල්ල දිනා ගැනීමේ අභිලාෂයෙන් පසුවන ජනතාව ප්‍රියකරන ලොතරැයි සන්නාමය බවට පත් වීම.

**ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : කොළ, රෝස, නිල්, තැඹිලි, ලා දුඹුරු, රතු සහ කහ
**ආරම්භක ජයමල්ල : රු. 150,000,000/-**

**ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
| --- | --- |
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| සුපිරි අංකය | රු.40.00 |
| ඉංග්‍රීසි අකුර | රු.40.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.200.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.2,000.00 |
| ඕනෑම අංක තුනක් | රු.4,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.200,000.00 |
| අංක හතර | රු.2,000,000.00 |
| අංක හතර + සුපිරි අංකය | රු.10,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.10,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර +සුපිරි අංකය | රු.150,000,000.00 |

### 4. ලග්න වාසනාව



**සන්නාම දැක්ම**

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කරන ප්‍රමුඛතම ලොතරැයිය බවට පත්වීම.

**සන්නාම මෙහෙවර**

ලග්න සංකේතයෙන් වාසනාව උදා වන්නේ යැයි විශ්වාස කරන ජනතාවගේ බලාපොරොත්තුව වන ලොතරැයි සන්නාමය බවට පත්වීම.

**ලොතරැයි විස්තර**

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : කහ, රතු, කොළ, දුඹුරු, තද නිල්, ලා නිල්, දම්
**ආරම්භක ජයමල්ල : රු. 3,000,000/-**

**ත්‍යාග ව්‍යුහය**

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
| --- | --- |
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ලග්න සංකේතය | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.2,000.00 |
| අංක හතර | රු.1,000,000.00 |
| ලග්න සංකේතය + ඕනෑම අංක එකක් | රු.120.00 |
| ලග්න සංකේතය + ඕනෑම අංක දෙකක් | රු.400.00 |
| ලග්න සංකේතය + ඕනෑම අංක තුනක් | රු.20,000.00 |
| ලග්න සංකේතය + අංක හතර | රු.3,000,000.00 |

## 5. සුපර්බෝල්




### සන්නාම දැක්ම

ශ්‍රී ලංකාවේ ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා සහ ජනප්‍රිය ලොතරැයියක් බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

අති නවීනතම තාක්ෂණය යොදා ගනිමින් නව්‍ය ත්‍යාග ව්‍යුහයන් හඳුන්වා දීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායී බව වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා (සතියේ දින හත ම)
ලොතරැයි වර්ණ : දම්, ලා නිල්, රතු, කොළ, රෝස, තද නිල් සහ තැඹිලි.
**ආරම්භක ජයමල්ල : රු. 50,000,000/-**

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඉංග්‍රීසි අකුර | රු.40.00 |
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.4,000.00 |
| අංක හතර | රු.2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.200.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.200,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.50,000,000.00 |

## 6. සුපිරි ධන සම්පත




### සන්නාම දැක්ම

අංක රටා ගැලපීම තුළින් තම වාසනාව විශ්වාස කරන පුද්ගලයින් ගේ අපේක්ෂාවන් ඉටුකරන ප්‍රමුඛතම ලොතරැයිය බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

ප්‍රියතම අංක සංයෝජන උත්සාහ කරන පාරිභෝගිකයින් සඳහා වඩාත් ප්‍රියකරන ලොතරැයිය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සිට ඉරිදා දක්වා සතියේ දින හතම.
ලොතරැයි වර්ණ : දම්, රතු, කොළ, කහ, රෝස, නිල් සහ දුඹුරු
**ආරම්භක ජයමල්ල : රු. 20,000,000/-**

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| අවසන් අංක 6 සමඟ ඉංග්‍රිසි අකුර | රු.20,000,000.00 |
| ඕනෑම පිළිවෙලට සියලුම අංක 6 ම | රු.1,000.00 |
| අවසන් අංක 6 | රු.2,500,000.00 |
| අවසන් අංක 5 | රු.200,000.00 |
| අවසන් අංක 4 | රු.20,000.00 |
| අවසන් අංක 3 | රු.2,000.00 |
| අවසන් අංක 2 | රු.200.00 |
| අවසන් අංකය | රු.40 |
| පළමු අංක 5 | රු.100,000.00 |
| පළමු අංක 4 | රු.2,000.00 |
| පළමු අංක 3 | රු.400.00 |
| පළමු අංක 2 | රු.120.00 |
| පළමු අංකය | රු.40.00 |
| ඉංග්‍රිසි අකුර | රු.40.00 |

## 7. ජයෝදා




### සන්නාම දැක්ම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ආදායම් සහ ලාභ උත්පාදනය කර දෙමින්, සුවිශේෂී සහ විශ්වාසනීය යෝජනා ක්‍රමයක් පිරිනමමින් සඳුදා සහ බදාදා දිනවල ජනප්‍රියතම ලොතරැයි සන්නාමය බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කරමින්, නවීනතම තාක්ෂණය හරහා නව්‍ය ත්‍යාග ව්‍යුහයන් පිරිනමමින්, සඳුදා සහ බදාදා දිනවල ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම ලොතරැයි නිෂ්පාදනය බවට පත්වීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : සඳුදා සහ බදාදා

ලොතරැයි වර්ණ : කහ සහ තැඹිලි

**ආරම්භක ජයමල්ල : රු. 20,000,000/-**

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඉංග්‍රීසි අකුර | රු.40.00 |
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.200.00 |
| ඕනෑම අංක තුනක් | රු.4,000.00 |
| අංක හතර | රු.2,000,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක එකක් | රු.80.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක දෙකක් | රු.2,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග ඕනෑම අංක තුනක් | රු.100,000.00 |
| ඉංග්‍රීසි අකුර සමග අංක හතර | රු.20,000,000.00 |

## 8. සසිරි




### සන්නාම දැක්ම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ ඩිජිටල් ලොතරැයි සන්නාමයක් බවට පත්වීම.

### සන්නාම මෙහෙවර

නව්‍ය, අධි තාක්ෂණික ලොතරැයි ක්‍රමයක් හඳුන්වා දීම මගින් මෙතෙක් ප්‍රයෝජනයට නොගත් නව වෙළඳපොළක් නිර්මාණය කිරීම සහ එමගින් මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම.

### ලොතරැයි විස්තර

දිනුම් ඇදීමේ දින : අඟහරුවාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා

ලොතරැයි වර්ණ : දම්, නිල්, කොළ, තැඹිලි සහ ලා දුඹුරු

### ත්‍යාග ව්‍යුහය

| සංයෝජනය | ත්‍යාගය (රු.) |
|---|---|
| ඕනෑම එක් අංකයක් | රු.40.00 |
| ඕනෑම අංක දෙකක් | රු.400.00 |
| අංක තුනක් | රු.200,000.00 |

## 9. ක්ෂණික ලොතරැයිය

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ක්ෂණික ලොතරැයි පුරෝගාමියා ලෙස 1983 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් මුල් වරට ශ්‍රී ලංකාවට ක්ෂණික ලොතරැයියක් හඳුන්වා දෙන ලදී. වෙළඳපොළට හඳුන්වා දෙන විට එය මෙරටට නව්‍ය සංකල්පයක් විය.

### සන්නාම දැක්ම

මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වැඩසටහන හරහා ශ්‍රී ලංකාවේ වෙළඳපොළ ප්‍රමුඛයා බවට පත් වීම.

### සන්නාම මෙහෙවර

ශ්‍රී ලංකාවේ මාර්ගගත නොවන ක්ෂණික දිනුම් ලොතරැයි වෙළඳපොළ ප්‍රමුඛයා ලෙස නව්‍ය ත්‍යාග ව්‍යුහයක් හඳුන්වා දීම සහ මණ්ඩලයේ ලාභදායීත්වය වැඩිදියුණු කිරීම සඳහා නවීනතම තාක්ෂණය හරහා නව මුහුණුවරක් හඳුන්වා දීම.

### තරගකාරී පසුබිම

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ක්ෂණික ලොතරැයි වෙළඳපොළට හඳුන්වා දීමෙන් පසු ජාතික ලොතරැයි මණ්ඩලය විසින් වෙළඳපොළට ක්ෂණික ලොතරැයි දෙකක් හඳුන්වා දෙන ලදී: සෙවණ සහ සමෘද්ධි එම ලොතරැයි දෙක විය.

සෙවණ ලොතරැයිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ක්ෂණික ලොතරැයියේ සෘජු තරගකරු විය. සෙවන ක්ෂණික ලොතරැයිය පැවැත්වීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කළමනාකරණය කරනු ලබන වෙනම ම ආයතනයක් ස්ථාපනය කරන ලදී. එම නිසා ජනතාව එය මෙරට තිබෙන ක්ෂණික ලොතරැයි ව්‍යාපාර ආයතනයක් ලෙස පිළිගත්හ.

# තිරසරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක හතරක කාලය තුළ,
සංවර්ධන ලොතරැයි මණ්ඩලය තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස
ක්‍රියාත්මක වී ඇත.

# තිරසාරභාවය පිළිබඳ වාර්තාව

පසුගිය දශක හතර තුළ, සංවර්ධන ලොතරැයි මණ්ඩලය තිරසාර ව්‍යාපාරික ආයතනයක් ලෙස ක්‍රියාත්මක වී ඇත. තරගකාරී ව්‍යාපාරික උපාය මාර්ග සකස් කිරීම අවශ්‍යයෙන් ම සමාජයේ දිගුකාලීන අවශ්‍යතා සහ සාරධර්ම සමග නොගැටෙන බවත්, එමගින් සම්බන්ධ වන ආසන්නතම පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා පමණක් සලකා බලන බවත් ආරම්භයේ සිටම සංවර්ධන ලොතරැයි මණ්ඩලය විශ්වාස කළේ ය. මණ්ඩලයේ තිරසාරභාවය පිළිබඳ වාර්තාවට එහි පැතිකඩ, තිරසාරභාවය පිළිබඳ උපාය මාර්ගය, ආර්ථික වගකීම, සමාජ වගකීම සහ පාරිසරික වගකීම ඇතුළත් වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය වගකීම් සහගත වර්ධනයක් සඳහා කැපවී සිටින අතර, එය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා ශ්‍රී ලංකාවේ ජනතාවට කාලයත් සමග ස්ථාවර සහ තිරසාර වටිනාකමක් ජනනය කරයි. මෙම වාර්තාව මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාජ, පාරිසරික සහ ආර්ථික වගවීම පවත්වා ගැනීම අරමුණු කරගත් වැඩසටහන් ගෙනහැර දක්වයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාජ වගකීම් ප්‍රයත්නවලට ව්‍යාපාර, පාරිභෝගිකයින් සහ ලොතරැයි ජයග්‍රාහකයින් ආරක්ෂා කිරීම සඳහා නිර්මාණය කර ඇති වැඩසටහන් මෙන්ම ප්‍රජා සත්කාරක වැඩසටහන් ද ඇතුළත් වේ. පාරිසරික වගකීම සාක්ෂාත් කර ගැනීම සඳහා, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම් නිරීක්ෂණය කරන අතර, පරිසර හිතකාමී ක්ෂණික ලොතරැයි ටිකට්පත් නිෂ්පාදනය කරයි. විනිවිදභාවය සහ සමතුලිතතාවය සහතික කරන පාලන ආකෘතියක් මගින් මණ්ඩලයේ ආර්ථික වගකීම පිළිබිඹු වෙයි.

### අපගේ මූලික සාරධර්ම

අපි තෝරාගෙන තිබෙන ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ කැපවීම, විශ්වාසය සහ උපදේශනය ඇති කරමින් සුවිශේෂී පාරිභෝගික අත්දැකීමක් ලබා දීමේ පැහැදිලි අභිලාෂයක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයට ඇත. මෙම අභිලාෂය සාක්ෂාත් කර ගැනීම සරල නොවන අතර බොහෝ දුරට වගකීම් සහගත සහ තිරසාර ව්‍යාපාරයක් ලෙස අපට ක්‍රියාත්මක විය හැකි ආකාරය පිළිබඳ අනවරත ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ අපගේ හැකියාව මත එය රඳා පවතියි.

අපගේ කැපවූ සහ දැඩි ලෙස අභිප්‍රේරණය වූ සේවකයින් අපගේ ආයතනයට ඉමහත් වත්කමකි. එබැවින්, ඔවුන් තමන් ලබා දෙන දායකත්වයන් පිළිබඳ ආඩම්බර වන පරිසරයක් පෝෂණය කිරීමට අපි කැපවී සිටින්නෙමු. අපගේ ව්‍යාපාරයේ සාර්ථකත්වය ඔවුන්ගේ රැකියාවේ තෘප්තිමත්භාවය සමග දැඩි ලෙස බැඳී ඇති බව අපි හඳුනා ගෙන ඇත්තෙමු; එබැවින් අපි විශිෂ්ඨත්වය සහ ජයග්‍රහණ ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුව සහ අඛණ්ඩ අධ්‍යාපනය සඳහා අවස්ථා ලබා දීමෙන් අපගේ ශ්‍රම බලකාය මත නිරන්තරයෙන් ආයෝජනය කරනනෙමු.

එයට අමතරව, අපගේ තිරසාරභාවය පිළිබඳ වැඩසටහන මගින් පාරිභෝගිකයන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම, කර්මාන්තය තුළ රැකියා උත්පාදනය කිරීම සහ ජනාධිපති අරමුදලට සහ මහපොළ භාරකාර අරමුදලට දායක වීම තුළින් සෞඛ්‍ය සේවා සහ අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය සේවාවන් සඳහා ආදායම් උත්පාදනය කිරීමට අරමුණු කරන්නෙමු. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ලොතරැයි සේවා සපයා දීමේදී පාරිභෝගිකයා කේන්ද්‍ර කර ගත් ප්‍රවේශයක් පවත්වා ගැනීමට කැපවී සිටින අතර, අපගේ සේවා සපයන්නන් අධීක්ෂණය කිරීම අඛණ්ඩව සිදු කරයි.

### පාරිසරික වගකීම

පාරිසරික බලපෑම අවම කිරීම සඳහා අප විසින් දරන ලද ප්‍රයත්නයන් සාර්ථක වී ඇත. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පුළුල් සේවක පුහුණුව, නව්‍ය තාක්ෂණය සහ ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග සහයෝගීත්වය තුළින් ඵලදායී ප්‍රජා සහාය සේවා සැපයීම සඳහා වන ද්වාරයක් ලෙස සේවය කරයි.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් 'DLB Sweep App' ඊ-ලොතරැයි සේවාව වන 'සසිරි ලොතරැයිය' වැනි නිෂ්පාදන හඳුන්වාදීම මගින් මෙම අරමුණු සඳහා ඇති අපගේ කැපවීම පෙන්නුම් කරයි. ඩිජිටල්කරණය හරහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය එහි කාබන් පියසටහන අවම කිරීමට සහ අපගේ පාරිභෝගිකයන්ගේ පහසුව සඳහා අමතර යෙදුම සහ විද්‍යුත්-සේවා හඳුන්වා දීමට අරමුණු කරයි.

පාරිසරික බලපෑම සම්බන්ධයෙන් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් වැඩිදියුණු කිරීම සහ පාරිභෝගිකයන් සහ සේවකයින් යන දෙඅංශයේම හරිත දැනුවත්භාවය වැඩිදියුණු කිරීම අපගේ අභිප්‍රාය වේ. මෙම වාර්තාව මගින් මෙම ක්ෂේත්‍රවල සෑම වසරකම අප අත්කර ගන්නා ප්‍රගතිය පෙන්නුම් කරන අතර, ඉදිරි වර්ෂය සඳහා වන අපගේ ඉලක්ක ද ගෙනහැර දක්වන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ලොතරැයි නිෂ්පාදන සහ ත්‍යාග හරහා තිරසාර සංවර්ධනය කෙරෙහි කැපවී සිටින අතර එය ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිත සඳහා ස්ථාවර සහ කල් පවත්නා වටිනාකමක් නිර්මාණය කරයි. මෙම ක්‍රියාමාර්ග මගින් සමාජීය, පාරිසරික සහ මූල්‍ය වගකීම් ඉටු කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ඇති කැපවීම අවධාරණය කෙරෙයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය ස්වකීය ආයතනික ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම් අඛණ්ඩව නිරීක්ෂණය කරයි.

### ආයතනික සමාජ වගකීම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අපි අපගේ ආයතනික සමාජ වගකීම් ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් ප්‍රජාවේ වටිනා සාමාජිකයෙකු ලෙස පිළිගැනීමට ලක්වීමට අපේක්ෂා කරන්නෙමු. පරිසර හිතකාමී ආකාරයකින් අපගේ ව්‍යාපාර කටයුතු කරගෙන යන අතර ම, තිරසාර, දිගුකාලීන හවුල්කාරිත්වයන් තුළින් ප්‍රජාවට අර්ථාන්විත ලෙස දායක වීමට අපි කැපවී සිටින්නෙමු.

ජනාධිපති අරමුදලට සහ මහපොළ උසස් අධ්‍යාපන භාර අරමුදලට මෙන්ම දේශීය පුණ්‍යායතන සහ සත්කාරක ප්‍රජාවන්ට දායක වීම ඇතුළු විවිධ වැඩසටහන් සඳහා සහාය වීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැපවී සිටියි. ශ්‍රී ලංකාව පුරා පුද්ගලයින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම අපගේ ඉලක්කය වේ.

එමෙන්ම, සංවර්ධන ලොතරැයි මණ්ඩලය ව්‍යවසායකත්වය සවිබල ගැන්වීම අරමුණු කරගත් සමාජ ව්‍යාපාර කිහිපයක් ද සාර්ථකව දියත් කර ඇත. මෙම වැඩසටහන් ප්‍රජාව තුළ වර්ධනය සහ අවස්ථා ප්‍රවර්ධනය කරමින් ලොතරැයි නියෝජිතයින් සහ බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් සමස්ත ජාලයට ම පුළුල් සහයෝගයක් ලබා දෙයි.

### සේවා නියුක්තිය සවිබල ගැන්වීම සඳහා අපි පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන ඇත:

අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකයින් සඳහා පවත්වන ලද විශේෂ වැඩසටහන්

1. රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 100 දක්වා ත්‍යාග සහිත ලොතරැයි ටිකට්පත් අලෙවි කළ අලෙවි නියෝජිතයින්ට ලබා දුන් රු. 2,500 ක මුදල 2024 වර්ෂයේ දෙවන භාගයේ සිට රු. 5,000 දක්වා වැඩි කරන ලදී.

2. 2024 වර්ෂයේ දී අලෙවිසැල් 365 ක් ස්ටිකර් අලවා වැඩිදියුණු කර ඇති අතර, 2024 වර්ෂයේ දී ඒ සඳහා දරන ලද පිරිවැය රු. 9,279,830 ක් විය.

3. 2018 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය දිවයින පුරා අලෙවි නියෝජිතයින්ට ලොතරැයි සාප්පු පිහිටුවීම සඳහා වැඩසටහනක් දියත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වර්ෂය වන විට දිවයින පුරා 'ලොතරැයි සාප්පු' 27 ක් ස්ථාපනය කර තිබුණි.

4. 2022 වර්ෂයේ දී, සිල්ලර වෙළඳසැල් ලොතරැයි ටිකට්පත් විකිණීම සඳහා දිරිමත් කිරීමේ අරමුණ ඇතිව "සිල්ලර වෙළඳසැල් හරහා විකිණීමේ ව්‍යාපෘතිය" හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයේ දී දිවයින පුරා සිල්ලර වෙළඳසැල් 618 ක් වෙත ලොතරැයි ටිකට්පත් අලෙවිය හඳුන්වා දී ඇත.

5. විවිධ රෝගවලට ගොදුරු වී මිය ගිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායකවරුන් සඳහා 2024 වර්ෂය දී රු. 6,048,500 ක මුදලක් වෙන් කරන ලදී.

6. විශ්වවිද්‍යාලවලට තේරී පත් වූ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින්ගේ දරුවන් සඳහා 2024 වර්ෂයේ දී රු. 819,000 ක මුදලක් වෙන් කර ඇත.

7. 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සහ අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වූ අලෙවි නියෝජිතයින් සහ අලෙවි සහායක වරුන්ගේ දරුවන් සඳහා 2024 වර්ෂයේ දී රු. 314,500 ක මුදලක් වෙන් කර ඇත.

8. 2024 වර්ෂයේදී දිවයින පුරා විසිරී සිටින සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අලෙවි නියෝජිතයින් අතර උද්‍යාන කුඩ 100 ක් බෙදා දෙන ලදී.

9. 2024 ඔක්තෝබර් 29 වන දින, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් එහි අලෙවි සහායකයින් අතරින් තෝරාගන්නා ලද ශාරීරික ආබාධ සහිත අලෙවි සහායකයෙකුට ට්‍රයිසිකලයක් ප්‍රදානය කරන ලදී.

### අනෙකුත් ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම්

- අධ්‍යාපන කටයුතු සිදු කරගෙන යාමේදී මූල්‍ය දුෂ්කරතාවන්ට මුහුණ දෙන සිසුන්ට සහාය වීම සඳහා ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කළේ ය. මෙම වැඩසටහන යටතේ, දිවයිනේ සියලු ම පාසල් ආවරණය කරමින්, 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අධ්‍යයන සහ විෂය සමගාමී ක්‍රියාකාරකම්වල සුවිශේෂී දක්ෂතා පෙන්නුම් කළ සිසුන් 100,000 ක් තෝරා ගන්නා ලදී. තෝරාගත් සෑම සිසුවෙකුට ම මාස 12 ක් සඳහා රු. 3,000 ක මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙන ලදී. එයට අමතරව, 2022/2023 වර්ෂයේ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට ඉන් සාර්ථකව සමත්වී අ.පො.ස. උසස් පෙළ අධ්‍යයන කටයුතු සඳහා සුදුසුකම් ලැබූ සිසුන් 6,000 ක් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහනකට මණ්ඩලය පූර්ණ අනුග්‍රහය දැක්වූයේ ය. මෙම සිසුන් රට පුරා අධ්‍යාපන කලාප 100 ක් අතරින් තෝරා ගන්නා ලද අතර, ඔවුන් උසස් පෙළ විභාගය අවසන් කරන තෙක් මාස 24 ක් සඳහා රු. 6,000 ක මාසික ශිෂ්‍යත්වයක් ලබා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා දරන ලද මුළු වියදම රු.මි. 71.5 ක් විය.

- ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද 2024 සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය වන 'වසත් සිරිය' සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 5,000,000 ක මුදල් අනුග්‍රහයක් දැක්වූයේ ය.
- වාණිජ අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද මහපොළ උසස් අධ්‍යාපන වෙළඳ ප්‍රදර්ශනය සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 1,000,000 ක මුදල් අනුග්‍රහයක් දැක්වූයේය.
- මහනුවර ශ්‍රී දළදා පෙරහැර සඳහා 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 2,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.
- රුහුණු කතරගම මහා දේවාලයේ ඇසළ පෙරහැර සඳහා 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 1,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.
- 2023 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය බෙල්ලන්විල 75 වන වාර්ෂික ඇසළ පෙරහැර සඳහා රු. 2,000,000 ක අනුග්‍රහයක් ලබා දීමට කටයුතු කළේ ය.
- 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොටපොල, ගැටබරුව රජමහා විහාරයේ ඇසළ පෙරහැර සඳහා රු. 1,500,000.00 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.
- 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කැලණිය දුරුතු පෙරහැර සඳහා රු. 500,000.00 ක දායකත්වයක් ලබා දුන්නේ ය.
- 2024 වර්ෂයේ දී ගංගාරාමයේ වාර්ෂික නවම් පෙරහැර සඳහා රු. 1,500,000 ක අනුග්‍රහයක් ලබා දීමට සංවර්ධන ලොතරැයි මණ්ඩලය කටයුතු කළේ ය.
- 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය බුද්ධ රශ්මි වෙසක් කලාපය සඳහා රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.
- දැරණියගල ශ්‍රී සුමන සමන් දේවාලයේ ඇසළ පෙරහැර සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.
- 2024 වර්ෂයේ 'ස්වර්ණමය වසන්තයක් - කෑගල්ල දිස්ත්‍රික් රූපවාහිනී රන් හිරු උත්සවය' සඳහා රු. 500,000 ක අනුග්‍රාහකත්වයක් ලබා දෙමින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය ප්‍රධාන අනුග්‍රාහකයෙක් ලෙස කටයුතු කළේ ය.
- 2024 වර්ෂයේ දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ 'ICTer 2024' සමුළුව සඳහා රු. 500,000 ක අනුග්‍රහයක් ලබා දුන්නේ ය.

### මානව සම්පත්

ඵලදායී ව්‍යාපාරික පිළිවෙත් වර්ධනය කිරීමේදී සහ කල් පවත්නා පාරිභෝගික සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීමේ දී අපගේ සේවකයින් ඉටු කරන වැදගත් කාර්යභාරය අපි පිළිගැනීමට ලක්කරන්නෙමු. අපි අපගේ සේවකයින්ව දැඩි ලෙස අගය කරන අතර, ඔවුන්ගේ බොහෝ දායකත්වයන් කෙරෙහි අප තුළ ඇති අගය කිරීම පෙන්නුම් කරමින් නව්‍ය, සහයෝගී සහ ආකර්ෂණීය සේවා ස්ථානයක් නිර්මාණය කිරීමට අපි ප්‍රයත්න දරන්නෙමු.

### කාර්ය මණ්ඩල සංවර්ධන කිරීමේ අරමුණු

- රැකියා සහ වෘත්තීය අවස්ථා නිර්මාණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
- ගුණාත්මක බඳවා ගැනීමේ සහ රඳවා ගැනීමේ ක්‍රියාමාර්ග, නායකත්ව සංවර්ධනය, අනුප්‍රාප්තිය සැලසුම් කිරීම සහ අඛණ්ඩ ඉගෙනීම ඇතුළුව ශ්‍රම බලකාය සැලසුම් කිරීමේ සහ කුසලතා කළමනාකරණය කිරීමේ වැඩසටහන් ඉදිරියට ගෙන යාම අඛණ්ඩව සිදු කිරීම.
- අපගේ සේවකයින්ට තමන්ව සවිබලගැන්වී ඇති බව දැනෙන බවත්, ඔවුන්ගේ ජයග්‍රහණ සඳහා පිළිගැනීමක් ලැබෙන බවත් සහතික කිරීම.
- අපගේ කාර්ය මණ්ඩලය හොඳින් දැනුවත් බවත්, මණ්ඩලයේ උපායමාර්ගික දිශානතිය පිළිබඳව ඔවුන් දැනුවත් බවත් සහතික කර ගැනීම.

## දේශීය පුහුණු වැඩසටහන්

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| නිල බැංකු ගිණුම් පවත්වාගෙන යාම පිළිබඳ වැඩමුළුව | දුෂානි ප්‍රනාන්දු මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | හසිතා පුෂ්පකුමාරි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ලලිතා කුමුදුනී මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | කල්හාරි විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | දිනූෂා රාජපක්ෂ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බුද්ධික කරුණාසේන මහතා | කළමනාකරණ සහකාර | | |
| | තිළිණි පියුමිකා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | තුෂාරි පෙරේරා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | සජිත ආටිගල මහතා | කළමනාකරණ සහකාර | | |
| | දිනුෂිකා මුතුමාලි මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | සුමුදු ගුණරත්න මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | රසිකා උදයංගනී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | චාන්දනී ජයසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නිලූකා වික්‍රමසිංහ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | හර්ෂනී විජේසිංහ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බී.එච්.ඒ.එස්. පීරිස් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | තාරකා පෙරේරා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නලින් දර්ශන කුමාරගේ මහතා | කළමනාකරණ සහකාර | | |
| | පියුමි ගමගේ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | හෂාන් රත්නායක මහතා | කළමනාකරණ සහකාර | | |
| | එන්.එස්.සී. පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | | |
| | චමෝද්‍යා හංසිකා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | දිල්කි වනිගසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | අචලා පියරත්න මහත්මිය | මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | | |
| ඡායාරූපකරණය වැඩමුළුව | ඇෂ්ලි ලාසරස් මහතා | කළමනාකරණ සහකාර | දින 05 | ජාතික තරුණ සේවා සභාව |
| | ඒ.ඩී. රේබාන් සංකන මහතා | කළමනාකරණ සහකාර | | |
| | එම්. කාමේෂ් කාන්ත් මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඒ.එන්. පුංචිහේවා මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඩී.එල්. ලක්නාත් රණසිංහ මහතා | කා.කා.ස. | | |
| ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | විජිතා සෝමරත්න මෙනවිය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | | |
| | කසුන් ජයසූරිය මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | | |
| | නිශාන් පෙරේරා මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | | |
| | සී.සී. අයිලප්පෙරුම මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | | |
| | මලින්ද බලගල්ල මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | | |
| | උමේෂ් ඉලේපෙරුම මහතා | පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | | |
| | නුවන් අබේරත්න මහතා | පරිපාලන නිලධාරී | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| ආයතනික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම පිළිබඳ වැඩමුළුව | චමිලා තෙවරප්පෙරුම මහත්මිය | මානව සම්පත් නිලධාරී | | |
| | ප්‍රසන්න ගෝකුල මහතා | ප්‍රවාහන නිලධාරී | | |
| | සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය | අලෙවි හා ප්‍රචාරණ නිලධාරී | | |
| | නිරංජලා ගුණසේකර මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | වත්සලා රූපසිංහ මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | ඉන්දික උපුල් මහතා | ගිණුම් නිලධාරී | | |
| | චන්ද්‍රා රාජපක්ෂ මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | අචලා පියරත්න මහත්මිය | මාධ්‍ය සහ මහජන සම්බන්ධතා සහකාර | | |
| | ඩිස්නි තරින්ද්‍රා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | චතුරි ලසන්ති මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නිශාන්ත රණවක මහතා | අලෙවි ප්‍රවර්ධන සහකාර | | |
| | චමෝද්‍යා හංසිකා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | සුසීමා චන්දිමාලි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කෞශල්‍ය වික්‍රමසිංහ මහතා | කළමනාකරණ සහකාර | | |
| | සජිත ආටිගල මහතා | කළමනාකරණ සහකාර | | |
| | බී.ටී.එස්. ලක්මාලි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | තුෂාරි පෙරේරා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | තිළිණි පියුමිකා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | දිල්හානි වෙදගේ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | චම්මිකා විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | මනෝජිතා සංජීවනී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | චාමර කටුකෙන්ද මහතා | කළමනාකරණ සහකාර | | |
| නායකත්ව පුහුණු කඳවුර (ක්‍රිකට් කණ්ඩායම) | | | දින 01 | |
| | හර්ෂ වීරසිංහ මහතා | පුහුණුකරු | | |
| | දෙනුවන් ප්‍රනාන්දු මහතා | පුහුණුකරු | | |
| | ලහිරු හෙට්ටිආරච්චි මහතා | රියදුරු | | |
| | දිලුක් චමල් මහතා | කා.කා.ස. | | |
| | එම්.කේ.ඩී.බී. කුමාර මහතා | රියදුරු | | |
| | මාලිංග යොහාන් මහතා | කා.කා.ස. | | |
| | ප්‍රදීප් රණතුංග මහතා | කා.කා.ස. | | |
| | ලක්මාල් විනෝජිත් මහතා | කළමනාකරණ සහකාර | | |
| | වරුණ විශ්වජිත් මහතා | කා.කා.ස. | | |
| | හංසක මධුරංග මහතා | කා.කා.ස. | | |
| | තිසර ඉන්දුසංඛ මහතා | කළමනාකරණ සහකාර | | |
| | බුද්ධික පෙරේරා මහතා | දුරකථන ක්‍රියාකරු | | |
| | චම්මි ගනේපොල මහතා | කළමනාකරණ සහකාර | | |
| | සම්පත් ගුණවර්ධන මහතා | කා.කා.ස. | | |
| | ඩොනල් දෙනවක මහතා | ආරක්ෂක සහායක | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| | ලසන්ත ෆොන්සේකා මහතා | කා.කා.ස. | | |
| | පෙරුමාල් පද්මනාදන් මහතා | කළමනාකරණ සහකාර | | |
| | අමිල සම්පත් මහතා | කළමනාකරණ සහකාර | | |
| | කෞශල්‍ය වික්‍රමසිංහ මහතා | කළමනාකරණ සහකාර | | |
| | නුවන් විබුද්ධ මහතා | කා.කා.ස. | | |
| | හිරාන් ඉන්ද්‍රජිත් මහතා | කා.කා.ස. | | |
| නව සුපිරි ධන සම්පත ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍රය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව | එල්. ප්‍රදීප් ප්‍රේමසිරි මහතා | ආරච්චි | | |
| | යූ.එන්.සී. පෙරේරා මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | ආර්.එම්.යූ.පී. රාමනායක මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | ඩබ්ලිව්.බී.එන්.එස්. පෙරේරා මහතා | දුරකථන ක්‍රියාකරු | | |
| | අයි.එන්. වික්‍රමසිංහ මහතා | රෝනියෝ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | කේ.පී.ඩබ්.එස්. බර්නාඩ් මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | අයි.කේ. ඉලංගකෝන් මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | එම් ඩී චින්තක මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | එම්.එච්.එන්.පී තිසේරා මහතා | කා.කා.ස. | | |
| | ඩී.එන්.එස්.ඒ. රාජපක්ෂ මහතා | විදුලි කාර්මික ශිල්පී | | |
| | එස්.ඒ.ඩී. ගුණරත්න මහතා | කා.කා.ස. | | |
| | ඩී.එල්. ලක්නාත් රණසිංහ මහතා | කා.කා.ස. | | |
| නිවාඩු විෂය පිළිබඳව කළමණාකරන සහකාරවරුන්ගේ කාර්යභාරය සහ වගකීම පිළිබඳ වැඩමුළුව | චමිලා තෙවරප්පෙරුම මහත්මිය | මානව සම්පත් නිලධාරී | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | තිළිණ පෙරේරා මහතා | අලෙවි ප්‍රවර්ධන සහකාර | | |
| | අචලා පියරත්න මහත්මිය | මාධ්‍ය සහ මහජන සම්බන්ධතා සහකාර | | |
| | චමිලා දිසානායක මහත්මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර | | |
| | චම්මිකා විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | සුනේත්‍රා සුදර්ශනී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඒ.ඊ.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජගත් මුදන්නායක මහතා | කළමනාකරණ සහකාර | | |
| | ටී.එස්.ඩී. පීරිස් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | හිමාලි විතානගේ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | දුෂානි ප්‍රනාන්දු මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | රුවන් පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | | |
| | අර්ජුන මිත්‍රනන්ද මහතා | කළමනාකරණ සහකාර | | |
| | වරුණි මල්කාන්ති මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඈන් ජානකී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | සුසීමා චන්ද්‍රිමාලි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නිසංසලා කාරියවසම් මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.කේ.කේ මධුසංඛ මහතා | කළමනාකරණ සහකාර | | |
| | පියුමි ගමගේ මහත්මිය | කළමනාකරණ සහකාර | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| | ගිහාරා රමුදිනී මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ජේ.කේ.ඒ. සුරේඛා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඒ.කේ.කේ.ඩී. වික්‍රමසිංහ මහතා | කළමනාකරණ සහකාර | | |
| | එස්.කේ. අමරකෝන් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | චමෝද්‍යා හංසිකා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| ආයතනික අභ්‍යන්තර අංශ අතර ගැටුම් අවම කිරීම පිළිබඳ වැඩමුළුව | ඩබ්ලිව්.බී.එන්.එස්. පෙරේරා මහතා | දුරකථන ක්‍රියාකරු | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | ඒ.ඊ.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.පී.ඩබ්.එස්. බර්නාඩ් මහතා | දිනුම් ඇදීමේ යන්ත්‍ර ක්‍රියාකරු | | |
| | සුමිත් එදිරිසිංහ මහතා | රියදුරු | | |
| | පී.ඩබ්.එන්.ඩී. ෂමිල් මහතා | රියදුරු | | |
| | එන්.පී. දිල්රුක් විජේන්ද්‍ර මහතා | රියදුරු | | |
| | ඩී.එෆ්.එම්.ඒ. අජිත් මහතා | රියදුරු | | |
| | ජී.ඩී.බී.ඒ. ගොඩගම්පල මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඊ.එම්. දමිත් තුෂාර මහතා | කා.කා.ස. | | |
| | එෆ්.එස්. නැදගමුව මහතා | කළමනාකරණ සහකාර | | |
| | ආර්.සී. තිලකසිරි මහතා | කළමනාකරණ සහකාර | | |
| | එච්.ඒ.ආර්.එස්. පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | | |
| | එන්. තරංග සමරසේකර මහතා | සන්නිවේදක | | |
| | කේ.එච්.යූ. මධුමාල් මහතා | කා.කා.ස. | | |
| | ඩී.එම්.එල්. වානගුරු මහතා | කා.කා.ස. | | |
| | එස්.එච්.අයි.ආර්. ජයතිලක මහතා | කා.කා.ස. | | |
| | කේ.ජී.කේ. චතුරංග මහතා | කා.කා.ස. | | |
| | එච්.ඒ.ටී.එස්.එම්. පෙරේරා මහතා | අලෙවි ප්‍රවර්ධන සහකාර | | |
| | ජී.එච්.ජී. අමරදාස මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ටී.එන්.එන්. කාරියවසම් මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ටී.වී. තිසර ඉන්දුසංක මහතා | කළමනාකරණ සහකාර | | |
| | එච්.ඒ.එන්. ගුණවර්ධන මහතා | ආරක්ෂක සහායක | | |
| | මහේෂ් චමීර සමරතුංග මහතා | ආරක්ෂක සහායක | | |
| | පී.ඒ.එච්.එන්. අතුකෝරල මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බී.සී.එන්. විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඩී.ඒ.ඩී.සී. අබේසේකර ගුණරත්න මහතා | කා.කා.ස | | |
| | ඒ.ටී. කපිල නිශාන්ත මහතා | කළමනාකරණ සහකාර | | |
| | ටී.එස්.ඩී. පීරිස් මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.සී.පී. සේනාරත්න මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජී.ආර්. පූර්ණිමා නිරෝෂා මධුවන්ති මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්.කේ.එස්. පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| **දෙපාර්තමේන්තු ගැටුම් අවම කිරීම පිළිබඳ වැඩමුළුව** | ආර්.පී.ඩී. ධර්මානි මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | ජේ.ඒ.එස්.එම්. ජයකොඩි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.ඩී. රොහාන් සම්පත් මහතා | කළමනාකරණ සහකාර | | |
| | එන්. හර්ෂනී රණසිංහ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.ටී.ඩී. රුක්ෂිනි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | පී.ඒ.එන්. චමිම් ගනේපොල මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.ඒ.ඩී. ප්‍රනාන්දු මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | පී.එම්.එස්. ගුණරත්න මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.කේ. ලලිතා කුමුදුනි මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.එම්.බී. කරුණාසේන මහතා | කළමනාකරණ සහකාර | | |
| | ටී.ඒ.එස්.ඒ. ජානකී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.එන්. දර්ශන මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඒ.ඒ. රන්ජන් සාලිය මහතා | කා.කා.ස | | |
| **ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්ය පටිපාටික නීති යොදා ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව** | | | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | ජේ.ඒ.ටී.කේ. ජයසූරිය මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | | |
| | එන්.වී. ඉන්දික උපුල් මහතා | ගිණුම් නිලධාරී | | |
| | ඩබ්ලිව්.කේ.එල්. සාගරි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ආර්.ඒ.ඩබ්ලිව්.පී. රූපසිංහ මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | බී.සී.එන්. විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ටී.එස්.ඩී. පීරිස් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බී.එච්.ඒ.එස්. පීරිස් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කේ.පී.ඒ.සී. මිත්‍රානන්ද මහතා | කළමනාකරණ සහකාර | | |
| | ජේ.ඩී.සී.සී. ජයසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඩී.ඩී.සී. දම්මින්ද මහතා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | | |
| | ආචාර්ය ඒ.එස්. ගුණසිංහ මහත්මිය | සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | | |
| | සී.සී. අයිලප්පෙරුම මහත්මිය | සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) 1 | | |
| | බී.එම්.එන්.කේ. බලගල්ල මහතා | සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) 2 | | |
| | පී.ඩී.එස්. ප්‍රේමතිලක මහත්මිය | අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී | | |
| | එච්.ඒ.ටී.එස්.එම්. පෙරේරා මහතා | අලෙවි ප්‍රවර්ධන සහායක | | |
| | එම්.ඒ.ජේ.පී. මුදන්නායක මහතා | කළමනාකරණ සහකාර | | |
| | එච්.පී. විතානගේ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ෂර්මිලා ජයසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එෆ්.එස්. නැදගමුව මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඩී.එන්.පී.ඒ. ශෂිකා දිල්ෂානි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඒ.එස්.පී.එස්. රාධිකා මහත්මිය | මානව සම්පත් නිලධාරී | | |
| | සී.එන්. තෙවරප්පෙරුම මහත්මිය | මානව සම්පත් නිලධාරී | | |
| | ආර්.ඒ.සී.පී. රාජපක්ෂ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඒ.ඩබ්.ටී.ඩී.එන්. වනිගසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ කාර්ය පටිපාටික නීති යොදා ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව | ජේ.කේ. අවන්ති සුරේඛා මෙනවිය | කළමනාකරණ සහකාර | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | චමෝද්‍යා සමරසිංහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.කේ.එල්. සුසීමා චන්දිමාලි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ඩී.එම්. සඳරානි හේමමාලා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජේ.පී.එස්.එම්.එස්. සත්සරා ජයමහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඩී.එච්. කෝට්ටගේ මහතා | කළමනාකරණ සහකාර | | |
| | යු.ජී. ඉලේපෙරුම මහතා | පද්ධති විශ්ලේෂක | | |
| | ඒ.සී. මහානාම මහත්මිය | තො.තා. සහකාර | | |
| | පී.පී. ගෝකුල ප්‍රනාන්දු මහතා | ප්‍රවාහන නිලධාරී | | |
| | ඒ.ඊ.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජී.එච්.ජී. අමරදාස මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජේ.සී.ජී. පුංචිහේවා මහතා | කළමනාකරණ සහකාර | | |
| | ටී.එන්.එන්. කාරියවසම් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ටී.වී. තිසර ඉන්දුසංක මහතා | කළමනාකරණ සහකාර | | |
| සේ.අ.අ. සහ සේ.නි.භා.අ., පාරිතෝෂික පනතෙහි ප්‍රතිලාභ පිළිබඳව සහ සාප්පු සහ කාර්යාල සේවකයන් පිළිබඳ පනතෙහි විධිවිධාන යොදා ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව | චමිලා තෙවරප්පෙරුම මහත්මිය | මානව සම්පත් නිලධාරී | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | චමිලා දිසානායක මහත්මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර | | |
| | ජේ.කේ. අවන්ති සුරේඛා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඩබ්ලිව්.කේ.එල්. සුසීමා චන්දිමාලි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | චමෝද්‍යා සමරසිංහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | සංජලී සත්සර ජයමහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ආර්.ඒ.එන්.ජී. රූපසිංහ මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | එන්.වී. ඉන්දික උපුල් මහතා | ගිණුම් නිලධාරී | | |
| | චන්ද්‍රා රාජපක්ෂ මහත්මිය | ගිණුම් නිලධාරී | | |
| | ටී.එස්.ඩී. පීරිස් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | දිනූෂා රාජපක්ෂ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එස්.එස්.ඩී.එස්. ජයසිංහ මහතා | කළමනාකරණ සහකාර | | |
| | ජේ.බී.සී.සී. ජයසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බුද්ධික කරුණාසේන මහතා | කළමනාකරණ සහකාර | | |
| | අර්ජුන මිත්‍රනන්ද මහතා | කළමනාකරණ සහකාර | | |
| | කේ.ටී.ඩී. රුක්ෂිණී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | අයන්ති සාරංග මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කල්හාරි විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | චම්මිකා විජේසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එච්.ඒ.ඩී.එම්. වීරසිංහ මහතා | කළමනාකරණ සහකාර | | |
| | අයි.එන්. අබේසිරිවර්ධන මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | බී.ඒ.සී.ජේ. කරුණාරත්න මහතා | ප්‍රසම්පාදන නිලධාරී | | |

| පුහුණුව | සහභාගීවූ අයගේ නම | තනතුර | පුහුණු කාලය | සත්කාර කත්වය |
|---|---|---|---|---|
| **සේ.අ.අ. සහ සේ.නි.භා.අ., පාරිතෝෂික පනතෙහි ප්‍රතිලාභ පිළිබඳව සහ සාප්පු සහ කාර්යාල සේවකයන් පිළිබඳ පනතෙහි විධිවිධාන යොදා ගැනීම පිළිබඳ පුහුණු වැඩමුළුව** | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | සේපාලිකා ප්‍රේමතිලක මහත්මිය | අලෙවිකරණ සහ ප්‍රචාරණ නිලධාරී | | |
| | තිළිණ පෙරේරා මහතා | අලෙවි ප්‍රවර්ධන සහකාර | | |
| | ජගත් මුදන්නායක මහතා | කළමනාකරණ සහකාර | | |
| | හිමාලි විතානගේ මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ෂර්මිලා ජයසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එච්.ආර්.ආර්.එස්. පෙරේරා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ශෂිකා දිල්ෂානි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | මලින්ද නිගමුණි මහතා | කළමනාකරණ සහකාර | | |
| | ඉසුරු සඳරුවන් මහතා | කළමනාකරණ සහකාර | | |
| | පී.පී. ගෝකුල ප්‍රනාන්දු මහතා | ප්‍රවාහන නිලධාරී | | |
| | ඩී.ටී.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| **ලිපිලේඛන බැහැර කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව** | ඈෂ්ලි ලාසරස් මහතා | කළමනාකරණ සහකාර | දින 01 | සී/ස නිපුණතා සංවර්ධන අරමුදල |
| | සී.එන්. තෙවරප්පෙරුම මහත්මිය | මානව සම්පත් නිලධාරී | | |
| | චමිලා දිසානායක මහත්මිය | ප්‍රධාන කළමනාකරණ සහකාර | | |
| | ප්‍රියංගනී රාජපක්ෂ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | එම්.සී. වරුණි මල්කාන්ති මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එම්.එල්.එස්. සුදර්ශනී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | සන්ධ්‍යා අමරකෝන් මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | අවන්ති සුරේකා මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | චමෝද්‍යා සමරසිංහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | සඳරාණි හේමමාලා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | ජේ.පී. සංජලී ජයමහ මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | ඈන් ජානකී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | හසිතා පුෂ්පකුමාරි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නාමල් පෙරේරා මහතා | කළමනාකරණ සහකාර | | |
| | ශ්‍රීමාලි ජයකොඩි මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | අර්ජුන මිත්‍රනන්ද මහතා | කළමනාකරණ සහකාර | | |
| | කේ.ටී.ඩී. රුක්ෂිණී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | අයේෂා සමන්මලී මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | කනිෂ්ක කුරුගම මහතා | කළමනාකරණ සහකාර | | |
| | ජේ.සී.ජී. පුංචිහේවා මහතා | කළමනාකරණ සහකාර | | |
| | ටී.එන්.එන්.කාරියවසම් මෙනවිය | කළමනාකරණ සහකාර | | |
| | දුෂානි ප්‍රනාන්දු මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | බී.ඒ.සී.ජේ.කරුණාරත්න මහතා | ප්‍රසම්පාදන නිලධාරී | | |
| | දර්ශි රත්නසේකර මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | නිශාන්ත රණවක මහතා | අලෙවි ප්‍රවර්ධන සහකාර | | |
| | ජගත් මුදන්නායක මහතා | කළමනාකරණ සහකාර | | |
| | සුදර්ශන නැදගමුව මහතා | කළමනාකරණ සහකාර | | |
| | පී.පී. ගෝකුල ප්‍රනාන්දු මහතා | ප්‍රවාහන නිලධාරී | | |
| | ඩී.ටී.ආර්.ඩබ්ලිව්. ද සොයිසා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එන්.එස්.සී. පෙරේරා මහත්මිය | කළමනාකරණ සහකාර | | |
| | එච්.ඒ.සී.ඩී. හෙට්ටි ආරච්චි මහතා | කළමනාකරණ සහකාර | | |

# 2024.12.31 දිනට සේවක සංඛ්‍යා තත්ත්වය

| තනතුර | | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| සභාපති/ ප්‍රධාන විධායක නිලධාරී | | 1 | 1 | | |
| සාමාන්‍යාධිකාරී | H.M - 2.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) | H.M - 1.1 | 1 | 1 | | |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) | H.M - 1.1 | 1 | | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) | M.M-1.1 | 2 | 1 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | M.M-1.1 | 3 | 2 | 1 | |
| සහකාර සාමාන්‍යාධිකාරී (විකුණුම්) | M.M-1.1 | 2 | 2 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (මා.ස.ක./පරිපාලන) | M.M-1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) | M.M-1.1 | 1 | 1 | | |
| සහකාර සාමාන්‍යාධිකාරී (තොරතුරු තාක්ෂණ) | M.M-1.1 | 1 | 0 | 1 | |
| අභ්‍යන්තර විගණක | M.M-1.1 | 1 | 1 | | |
| පරිපාලන නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රධාන ආරක්ෂක නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රවාහන නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| කලාප කළමනාකරු | J.M- 1.1 | 10 | 8 | 2 | |
| ගිණුම් නිළධාරී | J.M- 1.1 | 4 | 4 | | |
| පද්ධති/වැඩසටහන් විශ්ලේෂක | J.M- 1.1 | 1 | 1 | | |
| ප්‍රසම්පාදන නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| මානව සම්පත් නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| අලෙවිකරණ හා ප්‍රචාරණ නිළධාරී | J.M- 1.1 | 1 | 1 | | |
| කණිෂ්ඨ කළමනාකරු ( IT-INF ) | J.M- 1.1 | 1 | 0 | 1 | |
| අලෙවි ප්‍රවර්ධන සහකාර | MA - 3 | 22 | 18 | 4 | |
| තත්ත්ව පාලන සහකාර | MA - 3 | 1 | 0 | 1 | |
| තොරතුරු තාක්ෂණ සහකාර | MA - 3 | 6 | 3 | 3 | |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | MA - 3 | 1 | 1 | | |
| ප්‍රසම්පාදන සහකාර | MA - 3 | 1 | 0 | 1 | |
| කළමනාකරණ සහකාර (Tech- IT) | MA-2-2 | 4 | 0 | 4 | |
| ගිණුම් සහකාර | M.A-2.2 | 2 | 0 | 2 | |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | MA-1.2 | 1 | 1 | | |
| කළමනාකරණ සහකාර-131 සහ පුද්ගලික සහකාර - 01 | MA-1.2 | 132 | 130 | 2 | |
| අලෙවි සම්බන්ධීකාරක | MA-1.1 | 5 | 4 | 1 | |
| රියදුරු | P.L - 3 | 43 | 40 | 3 | |
| විදුලි කාර්මික | P.L -3 | 2 | 1 | 1 | |
| කාර්යාල කාර්ය සහායක | P.L -1 | 65 | 62 | 3 | |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | P.L -1 | 10 | 8 | 2 | |
| ක්ෂේත්‍ර ජංගම රථ නිවේදක | P.L -1 | 6 | 0 | 6 | |
| ආරක්ෂක සහකාර | P.L -1 | 3 | 14 | | *11 |
| **එකතුව** | | **341** | ** **312** | **40** | |

* පුද්ගලික ලෙස තනතුර අනුමත කර ඇති සේවකයින් (ආරක්ෂක සහායකයින්) 11 දෙනෙක් ඇත.

** වර්තමාන සේවක සංඛ්‍යාව = ස්ථිර තනතුරු 306+ කොන්ත්‍රාත් තනතුරු 06

| කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| සභාපති / ප්‍රධාන විධායක නිළධාරී | 1 |
| සාමාන්‍යාධිකාරී | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 1 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 7 |
| අභ්‍යන්තර විගණක | 1 |
| පරිපාලන නිළධාරී | 1 |
| ප්‍රධාන ආරක්ෂක නිළධාරී | 1 |
| කලාප කළමනාකරු | 8 |
| ගිණුම් නිළධාරී | 4 |
| පද්ධති විශ්ලේෂක | 1 |
| මානව සම්පත් නිළධාරී | 1 |
| ප්‍රසම්පාදන නිළධාරී | 1 |
| ප්‍රවාහන නිළධාරී | 1 |
| අලෙවි හා ප්‍රචාරණ නිළධාරී | 1 |
| අලෙවි ප්‍රවර්ධන සහායක | 18 |
| තො.තා. සහායක | 3 |
| මාධ්‍ය හා මහජන සම්බන්ධතා සහකාර | 1 |
| ප්‍රධාන කළමනාකරණ සහකාර | 1 |
| කළමනාකරණ සහකාර | 130 |
| අලෙවි සම්බන්ධීකාරක | 4 |
| රියදුරු | 40 |
| විදුලි කාර්මික | 1 |
| කාර්යාල කාර්ය සහායක | 62 |
| ක්ෂේත්‍ර ප්‍රවර්ධක | 8 |
| ආරක්ෂක සහායක | 14 |
| **එකතුව** | **312** |

| ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| පිරිමි සේවක සංඛ්‍යාව | 214 |
| කාන්තා සේවක සංඛ්‍යාව | 98 |
| **එකතුව** | **312** |

| වයස අනුව කාර්ය මණ්ඩලය | |
|---|---|
| 21 - 30 | 41 |
| 31 - 40 | 94 |
| 41 - 50 | 119 |
| 51 - 60 | 57 |
| 60+ | 1 |
| **එකතුව** | **312** |

# ආයතනික පාලනය

ආයතනික පාලන පද්ධතිය සංවර්ධන ලොතරැයි මණ්ඩලයට තීරණ ගැනීම සඳහා වන පරිචයන් සහ මගපෙන්වීමේ ප්‍රතිපත්ති නිර්වචනය කර දෙන අතර ම, මණ්ඩලයෙහි දිගු කාලීන අරමුණු සහ උපාය මාර්ගික සැලසුම්වලට මග පෙන්වයි. ආයතනික පාලන ආකෘතිය මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි විවිධ මට්ටම් අතර, විශේෂයෙන් ම පාලනයෙහි මට්ටම් අතර, එනම් අධ්‍යක්ෂ මණ්ඩල සහ විධායක කළමනාකරණ මට්ටම් අතර බලතල සහ වගකීම බෙදී යන ආකාරය සංක්ෂිප්තව දක්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ආයතනික ප්‍රතිපත්ති ස්ථාපනයක කරන අතර, තම ව්‍යාපාරයේ මනා ක්‍රියාකාරිත්වය සඳහා වගකිව යුතු පුද්ගලයින් වන ප්‍රධාන විධායක නිලධාරිට සහ විධායක නිලධාරීන්ට ක්‍රමෝපායික මග පෙන්වීමක් සපයා දෙයි. 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි පනත මගින් සංවර්ධන ලොතරැයි මණ්ඩලය පාලනය වෙයි. මණ්ඩලයේ ව්‍යුහය පහත සඳහන් පරිදි පනතේ 3(i) වගන්තිය යටතේ විශේෂිතව දක්වා ඇත.

**(අ) පහත සඳහන් නිලබලයෙන් පත්වන සාමාජිකයින්**

i. මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙකු.

ii. ජනාධිපති ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

iii. අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම් හෝ ඔහුගේ නියෝජිතයෙකු.

**(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන තවත් සාමාජිකයින් දෙදෙනෙකු**

අමාත්‍යවරයා විසින් සභාපතිවරයෙකු පත් කරනු ලැබිය යුතු අතර, එම සභාපතිවරයා මණ්ඩලයේ පරිපාලනය කිරීමේ සහ කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන ප්‍රධාන විධායක නිලධාරී වන්නේය.

### අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය

රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ කාර්යක්ෂම කළමනාකරණය සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේය. සියලු ව්‍යවස්ථාපිත හා අනෙකුත් කළමනාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වන අතර ම, සම්පත් ආරක්ෂා කිරීම, ප්‍රමාණවත් පරිදි ගිණුම් පවත්වා ගැනීම සහ නිවැරදි වාර්තා සම්පාදනය කිරීම සහතික කරමින් මෙය සාක්ෂාත් කරගත යුතුය.

එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය පහත සඳහන් දෑ සහතික කළ යුතුය:

- සංවිධානයේ උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මකව පවතින බව සහතික කිරීම
- උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා නායකත්වය ලබා දීම.
- ඵලදායී අභ්‍යන්තර පාලනයක් සහ අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම.
- ආයතන කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම.
- නිතිපතා වන පදනමකින් අවශ්‍ය කරනු ලබන මූල්‍ය අංග සහ අනාවරණයන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස කොටස් හිමියන් වෙත වාර්තා කිරීම.
- සම්පත් සහ වත්කම් වගකීමෙන් යුතුව භාවිතා කිරීම.
- අදාළ අණ පනත්, මාර්ගෝපදේශ සහ චක්‍රලේඛ ආදිය ප්‍රකාරව ඔවුන්ගේ සියලු ක්‍රියාමාර්ග සඳහා වගකිව යුතු වීම.

### අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

අයවැය සහ අදාළ ප්‍රමිතීන්ට අනුකකූලව ආයතනික මෙහෙයුම් සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වල ප්‍රතිඵල දැඩි ලෙස හා නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය සවිස්තරාත්මකව අවශ්‍ය කරන අනෙකුත් කාරණා සමග සම්මත න්‍යාය පත්‍රයක් අනුගමනය කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය මසකට වරක් රැස් වන අතර අවශ්‍ය ඕනෑම අවස්ථාවක විශේෂ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබේ.

### සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කමිටු

1. කළමනාකරණ කමිටුව
2. විගණන කමිටුව
3. ප්‍රසම්පාදන කමිටුව
4. කාර්ය මණ්ඩල සුභසාධක කමිටුව
5. වෙළඳ දැන්වීම් කමිටුව
6. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සංස්කෘතික සහ කලා සංගමය

### කළමනාකාරිත්වය

මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීගේ ඉහළ කළමනාකරණ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් වෙත පවරා තිබේ. අවදානම් සහ අවස්ථා හඳුනාගෙන නිසි කලට අවශ්‍ය පියවර ගනු ලබන බවත්, අභිමතාර්ථ ඉටුකර ගැනීම සඳහා අයවැය නියම කරනු ලබන බවත් එම කණ්ඩායම් විසින් සහතික කළ යුතු වේ.

## 2024 වර්ෂයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්

| රැස්වීමේ දිනය | අ.මං.රැ. අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 05.01.2024 | 289 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 18.01.2024 | 290 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 08.02.2024 | 291 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 21.02.2024 | 292 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 05.04.2024 | 293 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 20.05.2024 | 294 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 14.06.2024 | 295 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |

| රැස්වීමේ දිනය | අ.මං.රැ. අංකය | අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | පැමිණීම |
|---|---|---|---|---|
| 27.06.2024 | 296 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 10.07.2024 | 297 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 23.07.2024 | 298 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 13.08.2024 | 299 | අජිත් ගුණරත්න නාරගල මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ඩබ්.ඒ. සරත් කුමාර මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 13.09.2024 | 300 | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | අධ්‍යක්ෂ | ☑ |
| | | ජැනට් ජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ | ☑ |
| 14.10.2024 | 301 | එම්.ආර්.එච්. ස්වර්ණතිලක මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | අධ්‍යක්ෂ | නොපැමිණි |
| | | ඒ. චානක්‍ය ලියනගේ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| 22.10.2024 | 302 | එම්.ආර්.එච්. ස්වර්ණතිලක මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ඒ. චානක්‍ය ලියනගේ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| 04.11.2024 | 303 | එම්.ආර්.එච්. ස්වර්ණතිලක මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ඒ. චානක්‍ය ලියනගේ මහතා | අධ්‍යක්ෂ | ☑ |
| 11.12.2024 | 304 | එම්.ආර්.එච්. ස්වර්ණතිලක මහතා | සභාපති/ප්‍ර.වි.නි. | ☑ |
| | | ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය | අධ්‍යක්ෂ | ☑ |
| | | ඒ. චානක්‍ය ලියනගේ මහතා | අධ්‍යක්ෂ | ☑ |

# අවදානම් කළමනාකරණ වාර්තාව

ඵලදායී අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ව්‍යාපාර ක්‍රියාවලියේ ප්‍රධාන සාධකයකි. අපගේ ව්‍යාපාරයෙහි අවදානම් සහ ප්‍රතිඵල අතර උචිත සමතුලිතතාවයක් ඇති කර ගැනීමට සහ පාලිත පරිසරයක් තුළ අපගේ වර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමට උපකාරී වන අවදානම් කළමනාකරණ හැකියාවන් අඛණ්ඩව වැඩි දියුණු කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු. අවදානම් කළමනාකරණය සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ව්‍යුහයේ ප්‍රධානතම අංගයක් වේ. මුහුණ දීමට සූදානම්ව සිටින අවදානම් මට්ටම් ඇතුළත අවදානම් නිරාවරණයවීම් කළමනාකරණය කිරීම මගින් ඉපැයීම්වල සහ ප්‍රාග්ධනයෙහි අහිතකර විචලනයන් සීමා කර ගැනීමට අපි උත්සාහ කරන්නෙමු.

අවදානම් හඳුනා ගැනීම සහ අවම කිරීම සඳහා වගකීම් සහගත ප්‍රවේශයක් සංවර්ධන ලොතරැයි අවදානම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් වේ. අවදානම් දැනුවත් කිරීමේ චර්යාවන්ට සහාය දෙන ශක්තිමත් අවදානම් කළමනාකරණ සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ එමගින් අවදානම් මත පදනම්ව තීරණ ගැනීමට අනුබලය දීම අපගේ ප්‍රධාන අවධානය වී තිබේ. සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි දිගුකාලීන තිරසාර බව සහතික කිරීම සඳහා අපි අපගේ අවදානම් උපාය මාර්ග තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු.

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි අවදානම් කළමනාකරණ උපායමාර්ගය පාර්ශ්වකරුවන්, කළමනාකරුවන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සඳහා ප්‍රතිපෝෂණ ක්‍රමවේදයක් ලෙස ක්‍රියාත්මක වේ. මණ්ඩලයේ ව්‍යාපාර, මෙහෙයුම්, පද්ධති සහ සේවාවන් සඳහා දැනුවත්භාවයෙන් යුතු තීරණ ගැනීමේ උපාය මාර්ගික කේන්ද්‍රයක් ලෙස එයට හිමි වන තත්ත්වයෙන් එය සුවිශේෂී වේ. මෙය පහත සඳහන් දෑ හරහා ව්‍යාපාර අවදානම්වලට ආමන්ත්‍රණය කිරීම සඳහා උපායමාර්ගික සහ ව්‍යාපාර සැලසුම්කරණයට, ව්‍යාපෘති කළමනාකරණයට සහ ව්‍යාපාර ක්‍රියාවලි මට්ටම්වලට ස්ථාවර ප්‍රවේශයක් සපයා දෙයි:

- ව්‍යාපාර කාර්යයන් සහ ඒකක පුරා ඇති අවදානම් පිළිබඳ පොදු අවබෝධයක් ලබා දීම.
- වැඩිදියුණු වූ ප්‍රමුඛතා නියම කර ගැනීම සහ තීරණ ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස කළමනාකරණයට අඛණ්ඩ අවදානම් තක්සේරුවක් සපයා දීම.
- සේවක දැනුවත්භාවය සහ කළමනාකරණ වගකීම් වැඩි කිරීම.

**සංවර්ධන ලොතරැයි මණ්ඩලය පහත සඳහන් කර ඇති පරිදි විශේෂිත අවදානම් සමූහයකට යටත් වේ:**

### ත්‍යාග මුදල් ගෙවීමේ අවදානම

මුදල් ප්‍රවාහයට බලපෑ හැකි වැඩිවන ත්‍යාග මුදල් ගෙවීමේ අවධානම කළමණාකරනය කර ගැනීමට සෑම තොග මට්ටමකදී ම ත්‍යාගවල සම්මත ගෙවීම් අනුපාතයක් පවත්වා ගත යුතුය. ඉහත සඳහන් කළ අවදානම ආවරණය කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය මුද්‍රණ ආයතන වලින් රක්ෂණ ආවරණයක් ද ලබා ගනියි.

### ආර්ථික අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ගනුදෙනුකරුවන්ගේ මිලදී ගැනීමේ රටාවන් රටෙහි පවතින සමාජ-ආර්ථික හා දේශපාලන වෙනස්කම් වල අනුබලය මත පදනම් වේ.

### මූල්‍ය අවදානම

අකාර්යක්ෂම මුදල් ප්‍රවාහ කළමනාකරණය හා මූල්‍ය තොරතුරු සම්බන්ධ අවදානම් මගින් ආයතනවල ලාභදායීත්වයට හා ඵලදායීතාවයට හානි ගෙන දිය හැකියි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිසි රක්ෂණ ආවරණයක් සහතික කිරීම සහ ආයතනය පුරා පිරිවැය පාලන උපාය මාර්ග සම්බන්ධීකරණය කිරීම වැනි සාම්ප්‍රදායික මූල්‍ය අවදානම් කළමනාකරණ පිළිවෙත් භාවිතා කරයි.

### ද්‍රවශීලතා අවදානම

ඉහළ මට්ටමේ ත්‍යාග වේලාසනින් ගෙවීම මගින් ද්‍රවශීලතා අවදානම් ඇති විය හැකිය. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය ඉහළ මුදල් වත්කම් පවත්වාගෙන යයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය බුන්වත් වුව ද, මණ්ඩලය ගෙවීමට බැඳී සිටින ගෙවීම් ගෙවිය යුතු අවස්ථාව වන විට ඒවා ගෙවීම සඳහා ප්‍රමාණවත් තරම් මුදල් සම්පත් පවත්වාගෙන යාමට හෝ උත්පාදනය කිරීමට නොහැකි නම්, හෝ එසේ ගෙවීමට හැක්කේ සැලකිය යුතු ලෙස අවාසිදායක තත්ත්වයන් යටතේ පමණක් නම් ද්‍රවශීලතා අවදානම් පැන නගියි.

### මෙහෙයුම් අවදානම

පද්ධති ඇනහිටීම්, පුද්ගලයින් අතින් සිදුවිය හැකි දෝෂ, සාපරාධී ක්‍රියාකාරකම් හෝ අභ්‍යන්තර පද්ධතිමය බිඳවැටීම් හේතුවෙන් සිදු විය හැකි පාඩු මෙහෙයුම් අවදානම් වලට අයත් වේ. එවැනි තත්වයන් මගින් පාරිභෝගික විශ්වාසයට හා ආයතනික ප්‍රතිරූපයට හානි සිදු විය හැකිය. මෙහෙයුම් අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය නිරතුරුව ම අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කරයි. ආයතනික අවදානම මගින් ඇති වන තර්ජනය අවම කිරීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි කළමනාකාරීත්වය විසින් මෙහෙයුම් ඒකක, ව්‍යාපාර ක්‍රියාවලි සහ මහා පරිමාණ ඒකක පිළිබඳ නිරන්තර අවදානම් තක්සේරු කිරීම් සිදු කරනු ලබයි.

### ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම උපායමාර්ගික සහ/හෝ කීර්තිනාම හේතූන් නිසා ඇති වන පිරිවැය පදනමට සාපේක්ෂව ඇති විය හැකි ආදායම් හිඟයට අදාළ වේ. අනෙකුත් අමතර කරුණු අතර, බාහිර සාර්ව ආර්ථික පරිසරය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් තෝරාගනු ලබන උපායමාර්ගය සහ මණ්ඩලය ක්‍රියාත්මක වන වෙළඳපොළ තුළ එයට ඇති කීර්තිනාමය මණ්ඩලයෙහි ආදායම් උත්පාදන හැකියාව කෙරෙහි බලපායි.

### කීර්තිනාම අවදානම

පාර්ශ්වකරුවන් අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ප්‍රතිරූපයට හානි සිදු වීම හේතුවෙන් කීර්තිනාම අවදානම ඇති විය හැකි අතර, එමගින් ව්‍යාපාර රඳවා තබා ගැනීමට සහ උත්පාදනය කිරීමට ඇති හැකියාව අඩපණ කරයි. විශ්වාසය, පැහැදීම හෝ ව්‍යාපාරික සම්බන්ධතාවය බිඳවැටීමෙන් එවැනි හානියක් සිදුවිය හැකිය.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය දෘශ්‍ය මාධ්‍ය සහ මහජන බැඳියාව මත විශ්වාසය තබා සිටීම මගින් මණ්ඩලය සැලකිය යුතු කීර්තිනාම පාඩු අවදානමකට ලක් වෙයි. මෙම අවදානම අවම කිරීම පිණිස සංවර්ධන ලොතරැයි මණ්ඩලය මහජන බැඳියාව රඳවා ගැනීම සඳහා ඵලදායී අලෙවිකරණ ව්‍යාපාර ක්‍රියාත්මක කරන අතර දැඩි පද්ධතික විනිවිදභාවයක් අනුගමනය කරමින් කටයුතු කරයි.

### නීති අවදානම

සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එරෙහිව ගනු ලැබිය හැකි අනාගත නීතිමය ක්‍රියාමාර්ග වලින් ආරක්ෂා වීමට අපොහොසත් වීම නීතිමය හානි සිදුවීමේ අවදානම වැඩි කරයි. සංවර්ධන ලොතරැයි මණ්ඩලය පිළිගත් නීති වෘත්තිකයන්ගේ උපදෙස් ලබා ගෙන එවැනි ක්‍රියාමාර්ග අවම කිරීම සඳහා සුදුසු පියවර ගෙන තිබේ.

### තොරතුරු තාක්ෂණ අවදානම

තොරතුරු තාක්ෂණ පද්ධතිය මගින් ලබා ගන්නා නිශ්චිත හා කාලෝචිත තොරතුරු සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි මෙහෙයුම් ක්‍රියාවලියේ මූලික ම අංගයක් වේ.

# විගණන කමිටු වාර්තාව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ වාර්තාව අපි සතුටින් ඉදිරිපත් කරන්නෙමු.

## විගණන කමිටුවේ සංයුතිය

2024 වර්ෂයේ දී විගණන කමිටුව පහත සඳහන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් හයදෙනෙකුගෙන් (06) සමන්විත විය:

| | | |
|---|---|---|
| 1. | ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය (2024.10.21 සිට මේ දක්වා) | විගණන කමිටුවේ සභාපති |
| 2. | ඒ. චානක්‍ය ලියනගේ මහතා (2024.09.30 සිට මේ දක්වා) | විගණන කමිටුවේ සාමාජික |
| 3. | ඩබ්.ඒ. සරත් කුමාර මහත (2024.01.01 සිට 2024.09.30 දක්වා) | විගණන කමිටුවේ හිටපු සභාපති |
| 4. | ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා (2024.01.01 සිට 2024.09.24 දක්වා) | විගණන කමිටුවේ සාමාජික |
| 5. | ජැනට් ජයවර්ධන මහත්මිය (2024.01.01 සිට 2024.09.21 දක්වා) | විගණන කමිටුවේ සාමාජික |
| 6. | කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය (2024.01.01 සිට 2024.10.20 දක්වා) | විගණන කමිටුවේ සාමාජික |

සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), අභ්‍යන්තර විගණක, සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) සහ අනෙකුත් අදාළ නිලධාරීන් මෙම රැස්වීම් වලට සහභාගී වීම අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරී මෙම කමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස රැස්වීම්වලට සහභාගී වේ. තවද, මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා ද නිරීක්ෂකයෙකු ලෙස විගණන කමිටුවට සහභාගී වෙයි.

## විගණන කමිටුවේ කාර්යභාරය

පාර්ශ්වකරුවන්ගේ අයිතීන් සහ මණ්ඩලය සතු වත්කම් ආරක්ෂා කර ගැනීම සඳහා සංවර්ධන ලොතරැයි මණ්ඩලය ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගත යුතු වේ. මුදල් අමාත්‍යාංශය සහ අදාළ බලධාරීන් විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශ ද කමිටුව විසින් අනුගමනය කරනු ලබයි. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී විගණන කමිටුව විසින් එහි ප්‍රධාන වගකීම් වලට අදාළව සිදු කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත:

1. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට පෙර එම ප්‍රකාශනවල අනුකූලතාවය සහ සම්පූර්ණ බව පරීක්ෂා කර බැලීම සහ ඒවායෙහි අඩංගු වැදගත් මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් සමාලෝචනය කිරීම. ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් සහ පරිචයන්, විනිශ්චයකිරීම අවශ්‍ය කරන ප්‍රධාන අංශ සහ නෛතික හා නියාමන අවශ්‍යතා වලට අනුකූල වීම සමාලෝචනය කිරීම මෙයට ඇතුළත් වේ. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමෙන් සොයාගත් කරුණු සමාලෝචනය කිරීමෙහි කොටසක් ලෙස විගණන කමිටුව මෙම කරුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවෙහි නියෝජිත සමග සාකච්ඡා කළේය.

2. අනුමත වාර්ෂික විගණන සැලැස්මට අනුකූලව වරින් වර සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන පිළිබඳ කාලීන විගණන වාර්තා අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම අභ්‍යන්තර විගණන වාර්තා මගින් මණ්ඩලයේ ක්‍රියාත්මකව පවතින පද්ධති හා ක්‍රියා පටිපාටිවල ඇති අඩුපාඩු අවධාරණය කර පෙන්වා දෙන අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අවශ්‍ය අවස්ථාවන්හි දී පවතින ක්‍රමවේද හා කාර්ය පටිපාටිවල වැඩිදියුණු කිරීම් නිර්දේශ කර, විගණන කමිටුවට ප්‍රගතිය වාර්තා කරයි. විගණන කමිටුවට අභ්‍යන්තර විගණනයෙන් නිතිපතා වාර්තා ලැබෙන අතර, එම කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද එක් එක් විගණනය මගින් සොයා ගත් ප්‍රධාන කරුණු පිළිබඳ සාරාංශයක් එම වාර්තාවලට ඇතුළත් වේ. කළමනාකරණයෙහි අදහස් ද එහි කොටසක් වන අතර, විගණනය විසින් නිරීක්ෂණය කර ඇති තත්ත්වයන්ට හේතු වී ඇති මූලික කරුණු සහ එම තත්ත්වයන් නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලබයි.

3. අභ්‍යන්තර විගණනයේ සහ රජයේ විගණනයේ සහාය ඇතිව කමිටුව විසින් මණ්ඩලයේ මෙහෙයුම් සහ මූල්‍ය පාලන සහ කාර්ය පටිපාටිවල ඵලදායීතාවය තක්සේරු කරනු ලබන අතර, ඒවාට වියදම්, ආදායම් ක්‍රියාවලිය සහ ප්‍රාග්ධන වියදම් සඳහා අවසර දීමේ සීමා, අත්සන් කිරීමේ බලධාරීන්, තොරතුරු තාක්ෂණ යෙදවුම් පාලන සහ සංවර්ධනය කිරීම්, ආයතනික ව්‍යූහය, ප්‍රතිපත්ති, රාජකාරී වෙන් කර දීම සහ කළමනාකරණය විසින් සිදු කරන සමාලෝචන ඇතුළත් වේ. මණ්ඩලයෙහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ද්‍රවශීලතා තත්ත්වය නිරන්තරයෙන් නිරීක්ෂණය කරන ලදී. එහිදී හඳුනාගනු ලබන අඩුපාඩු අවශ්‍ය වැඩි දියුණු කිරීම් සඳහා වන නිර්දේශ ද සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරනු ලැබේ. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් මණ්ඩලය වෙත නිකුත් කරනු ලබන නියෝග කෙරෙහි කමිටුව විශේෂ අවධානයක් යොමු කරයි.

## විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව

2024 වර්ෂය සඳහා රැස්වීම් හතරක් පවත්වන ලද අතර ඒ සඳහා සහභාගීත්වය පහත සඳහන් පරිදි වේ:

| අධ්‍යක්ෂවරයාගේ නම | පැමිණීම | අවසරය මත සහභාගි නොවූ |
|---|---|---|
| ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය | 02/02 | නැත |
| ඒ. චානක්‍ය ලියනගේ මහතා | 02/02 | නැත |
| ජැනට් ජයවර්ධන මහත්මිය | 02/02 | නැත |
| ඒ.එම්.පී.එම්.බී. අතපත්තු මහතා | 01/01 | නැත |
| ඩබ්.ඒ. සරත් කුමාර මහතා | 01/01 | නැත |
| කේ.ඒ.එච්.සී. පුබුදුසිරි මෙනවිය | 02/02 | නැත |



**ඩී.සී.ඩබ්. හපුගොඩ මෙනවිය**
සභාපති - විගණන කමිටුව




# මූල්‍ය වාර්තාව


| | |
|---|---|
| ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව | 57 |
| විගණන වාර්තාව 2024 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග | 70 |
| විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය | 85 |
| මුදල් තත්ත්ව ප්‍රකාශනය | 86 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | 87 |
| හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය | 88 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 89 |
| කාණ්ඩ වාර්තාව | 94 |
| මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් | 95 |
| දස අවුරුදු සාරාංශය | 108 |

# ස්වාධීන විගණකවරුන්ගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } පියූආර්/එෆ්/ඩීඑල්බී/01/24/33 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

සභාපති

සංවර්ධන ලොතරැයි මණ්ඩලය

**සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකරකම්වලින්වූ මුදල් ප්‍රවාහය ගණනයේදී ආයෝජන පොලී ආදායම් බදු පෙර ලාභයට නැවත එකතු කර වර්ෂය තුලදී සත්‍ය වශයෙන්ම මුදලින් ලද පොලී මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස පෙන්විය යුතු වුවත් 2024 වර්ෂයේ ආයෝජන පොලී ආදායම් ලෙස බදු පෙර ලාභයට නැවත එකතුකරන ලද රු.177,922,791 ක ප්‍රමාණයම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ආයෝජන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

පොලී මුදල් ලැබීම් ලෙස පෙන්වා තිබුණි. එසේ වුවත් වර්ෂය තුලදී සත්‍ය වශයෙන්ම මුදලින් ලද ආයෝජන පොලිය රු.284,754,828 ක් විය. ඒ අනුව ආයෝජන පොලී මුදල් ලැබීම් රු.106,832,037 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුලදී ආයෝජන මුදල් ගලායාම් සහ ආයෝජන මුදල් ගලා ඒම් වෙන වෙනම පෙන්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුලදී කල්පිරුණු පසු ප්‍රති ආයෝජනය නොකර මුදල් ලබාගෙන තිබූ රු.377,732,522 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් සහ සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබූ රු.9,791,292 ක් වූ මුදල් ගලා ඒම් සහ ගලා යෑම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිරූපනය කර නොතිබුණු අතර ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් ලෙස රු.474,773,267 ක් දක්වා තිබුණි. ඒ අනුව ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් රු.106,832,037 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 07 වන ජේදය ප්‍රකාරව දේපල,පිරියත හා උපකරණ හි අයිතමයකින් ලැබිය හැකි ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා එන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණක් එය දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවද ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා ඒම යන කොන්දේසිය සපුරාලිය නොහැකි භෞතිකව මණ්ඩලය සතුව නොමැති වටිනාකම රු.8,095,000 ක් වූ කැබ් රථයක් සහ දැනට භාවිතයෙන් ඉවත්කර ඇති වටිනාකම රු.7,641,159 ක් වූ දිනුම් ඇදීමේ යන්ත්‍ර 07 ක් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

(ඈ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෑම කාමරය , ගබඩා කාමරය සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරිම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දරන ලද රු.1,728,884 ක වියදම කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගතකර තිබුණි. මෙම කාර්යය සිදුකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 07 කට අධික කාලයක් ගතවී ඇතත් අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදුනොකර දේපල පිරියත උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස තවදුරටත් පෙන්වා තිබුණි.

(ඉ) ගැලපුම් සංකල්පය (Matching Concept) අනුව ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී ආදායමට එරෙහිව එම ආදායම ඉපයීමට අදාළව දරන ලද සියලු වියදම් කපාහැරිය යුතු වුවත් එම සංකල්පයට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 08 කට අදාළ ත්‍යාග වියදම ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද ප්‍රතිශතය මත ගණනය කරන ලද ත්‍යාග වියදම වූ රු.15,094,967,030 ක් හඳුනාගෙන තිබුණි. එහෙත් එම ලොතරැයිවලට අදාළව ජයග්‍රහනය කරන ලද තත්‍ය වියදම රු.14,945,564,011 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ ත්‍යාග වියදම ලෙස රු.149,403,019 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2024 ජනවාරි 01 දින සිට පෙබරවාරි 28 දින දක්වා කාලපරිච්ඡේදයේදී ශනිදා වාසනා, ලග්නවාසනා, ජයෝදා, සුපර්බෝල්, අද කෝටිපති, සුපිරි ධන සම්පත යන ලොතරැයි වර්ග 06 සඳහා දෙවන වරම නමින් ලබාදුන් විශේෂ ත්‍යාග වෙනුවෙන් දරන ලද ත්‍යාග වියදම්වල එකතුව රු.64,100,000 ක් වර්ෂයේ ත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත නොකර ත්‍යාග සංචිත අරමුදලට ගලපා තිබුණි. ඒ අනුව ගැලපුම් සංකල්පයට පටහැනි ලෙස ත්‍යාග වියදම හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.64,100,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) උපචිත සංකල්පයට අනුව උපචිත වියදම් හඳුනාගැනීමේදී වර්තමාන බැඳීමක් පැවතිය යුතුවීම සහ එම වියදම නිරාකරණය කිරීමේදී සම්පත් පිටතට ගලාගෙන යෑමේ හැකියාවක් පැවතීමත් එහි වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකි විය යුතුවීම යන කරුණු සම්පූර්ණ කල යුතුවේ. 2021 වර්ෂයේ සිට උපචිත වියදම් හඳුනාගැනීමේ ක්‍රමවේදයේ පවතින දුර්වලතාවයන් නිසා උපචිත සංකල්පයට පටහැනි ආකාරයට ඇතැම් උපචිත වියදම් හඳුනාගෙන තිබුණු අතර වියදම හඳුනාගත් වර්ෂයට පසු වර්ෂයේ වියදම් සිදුනොවීම නිසා එය ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ උපචිත වියදම් ලෙස හඳුනාගෙන තිබුණත් එම වියදම නොදැරීම නිසා රු.12,848,010 ක් නැවත සමාලෝචිත වර්ෂයේදී ලාභයට එකතු කර තිබුණි.

(ඌ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 10 (ආ) වගන්තිය අනුව අනාගත තක්සේරු වර්ෂයකදී දැරීමට අපේක්ෂිත වියදම් හෝ අලාභ සඳහා සංචිතයකට හෝ වෙනත් ස්ථානයකට මාරු කර ඇති මුදල් ප්‍රමාණයන් බදුවන ආදායම ගණනය කිරීමේදී අඩුකිරීම සඳහා ඉඩදෙනු නොලබන බැවින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හර කර ඇති එවැනි ප්‍රතිපාදනයන් බදුවන ආදායම ගණනය කිරීමේදී නැවත ලාභයට එකතුකල යුතුවේ. 2024 දෙසැම්බර් 31 දිනට සේවක පාරිතෝෂිත වගකීම නැවත තක්සේරු කිරීමේදී ඌණ ප්‍රතිපාදනයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හර කර තිබූ රු.4,570,469 ක පාරිතෝෂිත ප්‍රතිපාදනය සහ 2003 වර්ෂයේදී කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීම සඳහා ගෙවා තිබුණු රු.723,780 ක ආපසු ගෙවන තැන්පතු මුදල නැවත ලබාගැනීම අවිනිශ්චිත වීම නිසා 2024 වර්ෂයේදී අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනයක් කර තිබූ රු.723,780 ක් බදුවන ආදායම ගණනය කිරීමේදී නැවත ලාභයට එකතුකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු. 1,159,274 අඩුවෙන් ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(එ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 (4) වගන්තියේ සහ උපලේඛණ 02 හි ප්‍රතිපාදන අනුව සම්පූර්ණයෙන් ප්‍රාග්ධන දීමනාව ලබාගත් වත්කම් බැහැර කිරීමේදී ඇතිවන අලාභ බදුවන ලාභය ගණනය කිරීමේදී ඉඩදෙනු නොලබන වියදමක් බැවින් නැවත ගිණුම්කරණ ලාභයට එකතුකල යුතුවේ. සමාලෝචිත වර්ෂය වන විට මණ්ඩලය විසින් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධන දීමනා ලබාගත් පිරිවැය රු. 502,595 ක් වූ කාර්යාල උපකරණ, පිරිවැය රු.289,791 ක් වූ ලීබඩු හා සවිකිරීම් හා පිරිවැය රු.12,570 ක් වූ පරිගණක සමාලෝචිත වර්ෂය තුලදී බැහැර කිරීම නිසා

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ඇතිවූ එකතුව රු.467,974 ක් වූ අලාභය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්කරණ ලාභයෙන් අඩුකර තිබූ නමුත් බදු වන ආදායම ගණනය කිරීමේදී එම අලාභය නැවත ආදායමට එකතුකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.140,392 කින් අඩුවෙන් ගණනය කර තිබුණි.

(ඒ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 (2) වගන්තියේ ප්‍රතිපාදන අනුව ප්‍රාග්ධන දීමනාවන් ගණනය කර බදු වන ආදායම ගණනය කිරීමේදී අඩුකල යුතු වුවත් මණ්ඩලය විසින් බදුවන ආදායම ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනාව නිවැරදිව ගණනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම වූ රු.109,667,357 කින් සියයට 60 ක ප්‍රමාණයක් වූ රු.65,800,414 ප්‍රාග්ධන දීමනාව ලෙස අඩුකර තිබුණි.

(ඔ) ජංගම නොවන වත්කම් වලට අදාළ ලෙජර් ගිණුම් 06 ක 2024 වර්ෂයේ ක්ෂය වියදම ලෙස රු.34,116,012 ක් ගිණුම් ගත කර තිබුණු අතර එම වත්කම් ගිණුම් වලට අදාළව විගණනය වෙත ලබාදී තිබුණු ස්ථාවර වත්කම් උපලේඛණ අනුව ක්ෂය වියදම රු.33,367,046 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.748,966 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඕ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සීමා සහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන දෙකට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.62,960,000 හා රු.3,875,113 ක් වුවද ආයතන දෙක විසින් විගණනයට සෘජුවම සනාථ කරන ලද ශේෂයන් පිළිවෙලින් රු.77,079,512 ක් සහ රු.6,343,788 ක් වීමෙන් එම ශේෂයන් අතර වෙනසක් පැවතුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා, මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි, ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

### 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද . ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 19 වගන්තිය | ටිකට් පතක් විකිණිය යුතු මිල, ටිකට් පතක සඳහන් කළයුතු විස්තර, ටිකට්පත් විකිණිය යුතු හෝ විකිණීම සඳහා ඉදිරිපත්කල යුතු ආකාරය, විකිණීමේ අනුයෝජිතයන් සේවයේ නියුක්ත කිරීම සහ ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකයන්, ටිකට්පතේ ජය අංක සහ ජයග්‍රාහකයන් ප්‍රසිද්ධ කිරීම සහ අවශ්‍ය වෙනත් කාරණා |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| | | සම්බන්ධව රීති සැදිය යුතු වුවත් 2024 වර්ෂය අවසන් වන තෙක්ම පනත ප්‍රකාරව රීති සැදීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | (i) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වන වගන්තිය<br>(ii) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ ජාතික අයවැය චක්‍රලේඛයේ 12.3 වගන්තිය<br>(iii) රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාවසායන්ගේ වියදම් කළමනාකරණ හා ව්‍යාපාර තිරසර භාවය පිළිබඳ චක්‍රලේඛයේ 14.1 වගන්තිය | පනතේ හා චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව 2024 ජුනි 19 දින සිට ජුලි 24 දින දක්වා කාලපරිච්ඡේදයේදී ජනාධිපති අරමුදල පවත්වා තිබුණු දිවයිනේ පාසල් හා පිරිවෙන්හි 1 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100,000 කට හා අ.පො.ස (උසස් පෙළ) හදාරන තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6000 කට ලබාදෙන ශිෂ්‍යත්ව වැඩසටහනේ උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා මණ්ඩලය විසින් එකතුව රු.73,266,631 ක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | |
| | (i) 4.3.1 වගන්තිය | ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සියළුම ආශ්‍රිත වියදම් ඇතුලත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් ඇස්තමේන්තුව රු.මිලියන 185 ක්වූ ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍ර දෙකක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි. |
| | (ii) 4.2.3 වගන්තියේ 31 වැනි අතිරේඛය | ලොතරැයි යන්ත්‍ර දෙකක් මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය උපරිම සති 06 ක කාලසීමාවක් තුළ අවසන් කල යුතු වුවද තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කල 2023 අප්‍රේල් 27 දින සිට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තෝරාගත් සැපයුම්කරු සමඟ ගිවිසුම අත්සන් |

| | | |
|---|---|---|
| | | කරන ලද දිනය වූ 2024 පෙබරවාරි 20 දක්වා සති 42 ක කාලයක් ගතකර තිබුණි. |
| | (iii) 2.12 වගන්තියේ | තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීම්වල දී සිදුවන කටයුතු පිළිබඳව වාණිජමය රහස්‍යතාවය පිළිබඳව ගරු කරන බවට සහ තමන්ගේ අපක්ෂපාතීත්වය, අවංකභාවය, පෞද්ගලික සම්බන්ධතාවයක් නොමැති බවට ප්‍රතිඥා දෙමින් ලබාදිය යුතු ප්‍රකාශ තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින්ගෙන් ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති මෙහෙයුම් කාර්ය සංග්‍රහයේ 3.2 (v) ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියක් අනුව දිරිදීමනා ගෙවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු වුවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේදී රු.121,772,415 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | |
| | (i) 2 ඡේදය | නිල වාහන ලැබීමට සුදුසුකම් නොමැති MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දරණ නිලධාරීන් අටදෙනෙකු සඳහා 2024 ජනවාරි 01 දින සිට නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයේදී නිල වාහන අනුයුක්ත කර තිබුණි. |
| | (ii) 3.1 ඡේදය | ඉන්ධන දීමනාව ලබාගැනීමට හිමිකමක් නොමැති නමුත් නිල වාහන ලබාදී තිබුණු MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දරණ නිලධාරීන් අටදෙනෙකු සඳහා 2024 ජනවාරි 01 දින සිට නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයේ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට රු.3,274,000 ක මුදලක් දරා තිබුණි. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | |
|---|---|---|
| (ඊ) | 2016 මැයි 30 දිනැති අංක 04/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | නිල වාහන ලැබීමට සුදුසුකම් නොමැති MM 1-1 ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරීන්ට ලබාදීම සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීමට නොහැකි වුවත් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනි ලෙස MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර දරන නිලධාරිනිය සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් මෝටර් රථයක් 2024 ජනවාරි 01 දින සිට අගෝස්තු 31 දින දක්වා අනුයුක්ත කර තිබුණු අතර එම මෝටර් රථය සඳහා එම කාලපරිච්ඡේදයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු.1,564,000 ක මුදලක් ගෙවා තිබුණි. |
| (උ) | 2022 ජනවාරි 14 දිනැති අංක PED 1/2015 (ii) දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | මණ්ඩලයේ සභාපති, සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්), නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුරු දරන නිලධාරීන් සඳහා චක්‍රලේඛය අනුව අනුමත මාසික ඉන්ධන සීමාව ඉක්මවා 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයේදී රු.125,483 ක වැඩිපුර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඌ) | රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 ඡේදය | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්යමණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු මුදල් රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්යමණ්ඩලය සඳහා නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) 2024 අගෝස්තු 01 දින සිට 2025 ජූලි 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ ලොතරැයිපත් වර්ග 07 ක් නිර්මාණය, සංවර්ධනය, මුද්‍රණය හා සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී ජයෝදා සහ සුපර් බෝල් යන ලොතරැයි සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුව, ලංසු ලේඛනයේ 2.C

ඡේදයේ සඳහන් ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොමැති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර මූලික ලංසු ඇගයීමේදී ඉවත්කර තිබුණි. එකී ලොතරැයි වර්ග දෙක ඇතුළුව ලොතරැයි වර්ග තුනක් සැපයීම සඳහා තෝරාගත් ලංසුකරුද ලංසු ලේඛනයේ 2.C ඡේදයේ සඳහන් ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොතිබුණි. ඒ අනුව ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොමැති බවට පවසා අවම ලංසුව ඉදිරිපත්කල ලංසුකරු මූලික ලංසු ඇගයීමෙන් ප්‍රතික්ෂේප කර එම අවශ්‍යතාවයම සපුරා නොතිබූ ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබීම නිසා ජයෝදා සහ සුපර් බෝල් යන ලොතරැයිපත් දෙක මුද්‍රණයේදී මණ්ඩලයට රු.8,140,000 ක ආර්ථිකමය වාසියක් ලබාගැනීමට නොහැකිවී තිබුණි.

(ආ) ලංසු ලේඛනයේ ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන්හි 06 ඡේදයේ අනුව පසුගිය වර්ෂ තුනක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාදිය යුතු වුවත් වර්ෂ දෙකක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පමණක් ඉදිරිපත් කර තිබියදී සහ ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන්හි 16.iii ඡේදය අනුව ලංසුකරු විසින් පසුගිය වර්ෂ තුනක සිදුකරන ලද සමාන සැපයුම් පිළිබඳ විස්තර සහ ඒවා තහවුරු කරන ලේඛන ඉදිරිපත් කල යුතු වුවත් එවැනි තොරතුරු සපයා නොතිබියදී ඒ පිළිබඳව සලකා බැලීමකින් තොරව තෝරාගත් සැපැයුම්කරු සඳහා ලග්න වාසනා සහ කප්රුක ලොතරැයි වර්ග දෙක සඳහා රු.234,460,000 ක ප්‍රතිෂ්ඨාවකට මුද්‍රණ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

### 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිලදීගන්නා තෙක් සුපිරි ධන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද දිනුම් ඇදීමේ මෘදුකාංගයක් මඟින් සිදුකර තිබූ අතර එම මෘදුකාංගයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව සිදුකරන ලද පද්ධති විගණනය සඳහා රු.1,160,613 ක් පුද්ගලික විගණන ආයතනයකටද, ලොතරැයි ප්‍රතිඵල රූපවාහිනිය මඟින් විකාශනය කිරීමේදී දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මඟින් පන්දු මිශ්‍රකර ඉන් අහඹු ලෙස පන්දුවක් තෝරාගැනීම සිදුකරන ආකාරයට විකාශනය කිරීම සඳහා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් (Game Animation Software) නිර්මාණය කරගැනීම සඳහා රු.3,350,000 ක මුදලක් පුද්ගලික මෘදුකාංග නිර්මාණ ආයතනයකටද ගෙවා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිලදීගෙන සුපිරි ධන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීමේ කටයුතු සඳහා යොදාගැනීම නිසා ඉහත සඳහන් මෘදුකාංග දිනුම් ඇදීමේ ක්‍රියාවලියෙන් ඉවත්කර තිබුණි. දිනුම් ඇදීමේ යන්ත්‍රය මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ලෙස සැලසුම් කර කාර්යක්ෂමව සිදුකර නව ලොතරැයිපත වෙළඳපොලට හඳුන්වාදීමට පෙර දිනුම් ඇදීමේ යන්ත්‍රය මිලදීගැනීම සිදුකර තිබුණේ නම් දිනුම් ඇදීමේ මෘදුකාංග නිර්මාණය සහ එහි පද්ධති විගණනය සඳහා දරන ලද රු.4,510,613 ක මුදල ඉතිරි කරගැනීමට හැකිව තිබූ බව නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ආ) ජනාධිපති අරමුදලට මුදල් ප්‍රේෂණය කිරීම සහ මණ්ඩලය එදිනෙදා ගණුදෙනු සඳහා භාවිතා කරන ලංකා බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා භාවිතා කරනු ලබන මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ පවත්වාගෙන යන ඉතිරිකිරීමේ ගිණුමේ රු.565,797,125 ක පමණ මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මහජන බැංකුව විසින් ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ගෙවන වාර්ෂික පොලී අනුපාතය සියයට 2.2 ක් වූ අතර 2024 වර්ෂයේදී රු.17,966,768 ක පොලී ආදායමක් උපයා තිබුණි. ඉතිරිකිරීමේ ගිණුමක රඳවාගෙන තිබුණු මෙම මුදල මෙම බැංකුවේම සියයට 5.5 ක පමණ පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබන සත් දින කෙටිකාලීන තැන්පතු ( 7 Day Call Deposit ) වල ආයෝජනය කලේනම් රු.36,486,529 ක පමණ පොලී ආදායමක්ද, සියයට 8 ක පමණ පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබන මාසික ස්ථාවර තැන්පතු වල ආයෝජනය කලේනම් රු.55,864,543 ක පමණ පොලී ආදායමක් උපයා ගැනීමට අවස්ථාව තිබුණි. ඒ අනුව ඵලදායී ලෙස ආයෝජනය කර ඉහල පොලී ආදායමක් ලබාගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2023 නොවැම්බර් 09 දින වෙළඳපොලට හඳුන්වාදී තිබූ සුපිරි ධන සම්පත ලොතරැයිපත සතියේ දිනක අලෙවිය ලොතරැයිපත් 245,000 දක්වා සහ ඉරිදා දිනක අලෙවිය ලොතරැයිපත් 220,000 දක්වා ඉහළ නැංවීමට 2024 වර්ෂයේ රු.14,002,480 ක්දී වැය කරමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් තුනක් ක්‍රියාත්මක කර තිබුණද සමාලෝචිත වර්ෂයේ සතියේ දිනක සාමාන්‍ය අලෙවිය ලොතරැයිපත් 164,419 ක් හා ඉරිදා දිනක සාමාන්‍ය අලෙවිය ලොතරැයිපත් 133,051 ක් පමණක් විය. ඒ අනුව මෙම අලෙවි ප්‍රවර්ධන උපක්‍රම සාර්ථකවී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුලදී ලොතරැයි වර්ග 08 කට අදාළව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් 98 දෙනෙකු වෙත ලොතරැයිපත් 811,002,580 ක් නිකුත් කර තිබූ අතර ඉන් සියයට 8 ක් පමණ වූ ලොතරැයිපත් 67,091,560 ක් විකිණීමට නොහැකි බව දන්වා තිබුණි. මෙම විකිණීමට නොහැකි බව දන්වා එවූ ලොතරැයිපත් මණ්ඩලයට නැවත භාරදිය යුතු වුවත් ලොතරැයිපත් 60,350 ක් එලෙස මණ්ඩලයට සමාලෝචිත වර්ෂය තුලදී භාරදී නොතිබුණි.

(ඉ) තාක්ෂණයේ සිදුවෙමින් පවතින නව්‍යතාවයන් සමඟ අනාගතයේ සියළුම ව්‍යාපාරික කටයුතු භෞතික වෙළඳපල වලින් බැහැරවී මාර්ගගත ක්‍රමයට පරිවර්ථනය වීමට නැඹුරුතාවයක් පවතින කාලයක මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුලදී අලෙවිකර තිබූ ලොතරැයිපත් 745,645,051 න් මාර්ගගත ක්‍රමය මඟින් අලෙවි කර තිබුණේ විද්‍යුත් ලොතරැයිපත් 1,119,059 ක් පමණි. එය සමස්ථ අලෙවියෙන් සියයට 0.15 ක් වැනි ඉතා පහළ ප්‍රතිශතයක් විය.

(ඊ) 2023 නොවැම්බර් 09 දින සිට වෙළඳපලට හඳුන්වාදී තිබූ සුපිරි ධන සම්පත ලොතරැයිපත 2024 නොවැම්බර් 20 දින දක්වාම වර්ෂයකට අධික කාලයක් මාර්ගගත ක්‍රමයට වෙළඳපලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. 2024 නොවැම්බර් 21 දින සිට සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලොතරැයිපත් 82,000 ක් අලෙවි නියෝජිතයන් වෙත මාර්ගගත ක්‍රමයට

නිකුත්කර තිබූ අතර ඉන් ලොතරැයිපත් 18,225 ක් පමණක් අලෙවි කර තිබූ අතර ලොතරැයිපත් 63,775 ක් හෙවත් සියයට 78 ක ප්‍රතිශතයක් ආපසු එවා තිබුණි.

(උ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ සිදුවන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුළින් සිදුවන බැවින් එම සමස්ත ක්‍රියාවලිය මණ්ඩලයේ කාර්ය මණ්ඩලය හරහා ඉටුකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 25 දින ජාතික තරඟකාරී ලංසු ක්‍රමය උපයෝගී කරගෙන ලංසු කැඳවා, ලංසු ඇගයීමේ කටයුතු ආරම්භ කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 05 කට අධික කාලයක් ගතවී ඇතත් එම කටයුතු අවසන් කර නොතිබීම නිසා 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. 92,541,077 ක මුදලක් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධති සේවාව ලබාගැනීම සඳහා බාහිර සේවා සැපයුම් ආයතනයට ගෙවීමට සිදුවී තිබුණි.

(ඌ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක් යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 18 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(එ) 1990 වර්ෂයේ චෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමඟ ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාළ මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 09 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ වියදම් අයිතම 07 ක සංශෝධිත ප්‍රතිපාදන ඉක්මවා එකතු වටිනාකම රු.5,735,563 ක වියදම් සිදුකර තිබුණි. එක් එක් අයිතම සැලකීමේදී අයවැය ගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම සියයට 13 සිට සියයට 74 ක පරාසයක විය.

ජී.එච්.ඩී.ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

# විගණන වාර්තාව 2024 සහ කළමනාකාරීත්වය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව වක්‍ර ක්‍රමයට මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් වූ මුදල් ප්‍රවාහය ගණනයේදී ආයෝජන පොලී ආදායම් බදු පෙර ලාභයට නැවත එකතු කර වර්ෂය තුලදී සත්‍ය වශයෙන්ම මුදලින් ලද පොලී මුදල ආයෝජන ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් ලෙස පෙන්විය යුතු වුවත් 2024 වර්ෂයේ ආයෝජන පොලී ආදායම් ලෙස බදු පෙර ලාභයට නැවත එකතුකරන ලද රු.177,922,791 ක ප්‍රමාණයම ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ආයෝජන පොලී මුදල් ලැබීම් ලෙස පෙන්වා තිබුණි. එසේ වුවත් වර්ෂය තුලදී සත්‍ය වශයෙන්ම මුදලින් ලද ආයෝජන පොලිය රු.284,754,828 ක් විය. ඒ අනුව ආයෝජන පොලී මුදල් ලැබීම් රු.106,832,037 ක් අඩුවෙන් දක්වා තිබුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති, මුදලින් ලද ආයෝජන පොලී ආදායමේ මුළු එකතුව අප විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ආදායම තුළ ඇතුළත් කර ඇත.<br><br>මෙම රු. 106,832,037 ක මුදල 2024 වසර තුළ දී මුදලින් ලද, 2023 වසරට අදාල ලැබිය යුතු පොළී ආදායම් හා 2024 වසර අවසානයේ දී ලැබිය යුතු පොළී ආදායම් අතර වෙනස වේ. මෙම අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ගැළපුම් කර ඇත.<br><br>විගණනය පෙන්වා දී ඇති පරිදි ආයෝජන පොළී ලැබීම් තුළ පෙන්විය යුතු මෙම රු.106,832,037 ක මුදල් ප්‍රවාහය, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා තිබුණ ද ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන් සඳහා බලපෑමක් නොවේ.<br><br>කෙසේ නමුත් විගණනය පෙන්වා දී ඇති පරිදි මෙම වසරේ සිට අදාල වෙනස්කිරීම් සිදු කිරීමට නියමිතය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුලදී ආයෝජන මුදල් ගලායාම් සහ ආයෝජන මුදල් ගලා ඒම් වෙන වෙනම පෙන්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී රු.377,732,522 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් කල්පිරුණු පසු ප්‍රති ආයෝජනය නොකර මුදල් ලබාගෙන තිබුණි. එසේම රු.9,791,292 ක් සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. මෙම මුදල් ගලා ඒම් සහ ගලා යෑම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ නිරූපනය කර නොතිබුණු අතර ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් ලෙස රු.474,773,267 ක් දක්වා තිබුණි. ඒ අනුව ස්ථාවර තැන්පතුවලින් ලද මුදල් රු.106,832,037 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම රු. 106,832,037 ක මුදල ඉහත විස්තර කළ පරිදි 2024 වසර තුළ දී මුදලින් ලද, 2023 වසරට අදාල ලැබිය යුතු පොළී ආදායම් හා 2024 වසර අවසානයේ දී ලැබිය යුතු පොළී ආදායම් අතර වෙනස වේ.<br><br>විගණනය පෙන්වා දී ඇති පරිදි ආයෝජන පොළී ලැබීම් තුළ පෙන්විය යුතු මෙම රු.106,832,037 ක මුදල් ප්‍රවාහය, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පෙන්වා තිබුණ ද ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහයන් සඳහා බලපෑමක් නොවේ.<br><br>කෙසේ නමුත් විගණනය පෙන්වා දී ඇති පරිදි මෙම වසරේ සිට අදාල වෙනස්කිරීම් සිදු කිරීමට නියමිතය. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 07 වන ඡේදය ප්‍රකාරව දේපල, පිරියත හා උපකරණ හි අයිතමයකින් ලැබිය හැකි ආර්ථික වාසිය අස්ථිත්වය තුලට ගලා එන්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකිනම් පමණක් එය දේපල, පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු වුවද ආර්ථික වාසිය අස්ථිත්වය තුළට ගලා ඒම යන කොන්දේසිය සපුරාලිය නොහැකි භෞතිකව මණ්ඩලය සතුව නොමැති වටිනාකම රු.8,095,000 ක් වූ කැබ් රථයක් සහ දැනට භාවිතයෙන් ඉවත්කර ඇති වටිනාකම රු.7,641,159 ක් වූ දිනුම් ඇදීමේ යන්ත්‍ර 07 ක් සමාලෝචිත වර්ෂයේ දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | මෙහි සඳහන් රු.8,095,000/- ක් වූ ඩබල් කැබ් රථය මණ්ඩලය සතුව භෞතිකව නොමැති යන විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. මෙම කැබ් රථය සම්බන්ධයෙන් මේවන විට අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති බැවින් එය ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර ඇත.<br><br>මෙහි සඳහන් රු.7,641,119/- වටිනාකම තුළ දිනුම් ඇදීමේ යන්ත්‍ර 4 ක් වායු සම්පීඩක 1 ක් සහ දිනුම් ඇදීම සඳහා යොදාගන්නා පන්දු ඇතුලත් වේ. මෙම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් ආරම්භක අවධියේ යොදාගන්නා ලද අයිතම වන අතර මේවා මණ්ඩලයේ වත්කම් ලෙස සටහන් තබා ඇත.<br><br>එම අයිතම දිනුම් ඇදීමේ කාර්ය සඳහා යොදාගන්නා ලද විශේෂ යන්ත්‍ර වන බැවින් මෙම යන්ත්‍ර අපහරණය කිරීමේ දී ගැටළුවක් පවතී. මෙහි ඇති සුවිශේෂිභාවය සහ අබලි තත්වය මත මේවා බාහිර පාර්ශවයන් වෙත අපහරණය කිරීම දුෂ්කරවී ඇත. මේවන විට මෙම යන්ත්‍ර අපහරණය නොකිරීම මත මෙම යන්ත්‍ර ගිණුම් තුළ පෙන්වීම සිදුකර ඇති අතර සංරක්ෂිතව තැන්පත් කර තැබීමට කළමණාකාරීත්වය සැලසුම් කර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ඈ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කෑම කාමරය, ගබඩා කාමරය සහ මායිම් බිත්ති අලුත්වැඩියා කිරීම සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දරන ලද රු.1,728,884 ක වියදමක් දරා එය කෙරීගෙන යන වැඩ ගිණුමේ ගිණුම්ගතකර තිබුණි. මෙම කාර්යය සිදුකර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 07 කට අධික කාලයක් ගතවී ඇතත් අවශ්‍ය ගිණුම්කරණ ගැලපීම් සිදු නොකර දේපල පිරියත උපකරණ යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | මෙම විගණන විමසුමෙහි සඳහන් කෑම කාමරය, ගබඩා කාමරය, සහ මායිම් බිත්තිය අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් මෙතෙක් වැඩ අවසන් කර නොමැත. වත්කමක් ලෙස හඳුනාගැනීම සඳහා අදාල වත්කම ප්‍රතිලාභ ලැබෙන මට්ටමට නිමවී තිබිය යුතුය. එබැවින් 2024 දෙසැම්බර් 31 දින වන විටත් ඉහත ඉදිකිරීම් නිම වී නොතිබූ හෙයින් විගණන විමසුමෙහි සඳහන් අයිතම ප්‍රාග්ධනීත කර ක්ෂය කිරීමට කටයුතු යොදා නොතිබුණි. |
| (ඉ) ගැලපුම් සංකල්පය (Matching Concept) අනුව ලාභ හෝ අලාභ ගණනය කිරීමේදී ආදායමට එරෙහිව එම ආදායම ඉපයීමට අදාළව දරන ලද සියලු වියදම් කපාහැරිය යුතු වුවත් ගැලපුම් සංකල්පයට පටහැනි ලෙස සමාලෝචිත වර්ෂයේ ලොතරැයි වර්ග 08 කට අදාළ ත්‍යාග වියදම ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලද ප්‍රතිශතය මත ගණනය කරන ලද ත්‍යාග වියදම වූ රු.15,094,967,030 ක් හඳුනාගෙන තිබුණි. එහෙත් එම ලොතරැයිවලට අදාළව ජයග්‍රහනය කරන ලද සත්‍ය වියදම රු.14,945,564,011 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ ත්‍යාග වියදම ලෙස රු.149,403,019 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 1997 අංක 20 දරණ සංවර්ධනය ලොතරැයි මණ්ඩල පනතේ 18 (3) වගන්ති ප්‍රකාරව "ත්‍යාග මුදලක් කිසියම් තැනැත්තෙකු දිනා නොමැති අවස්ථාවක එම ත්‍යාග මුදල ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලබිය යුතුය" යන්න සඳහන් වේ. පනතේ මෙම වගන්තිය කෙරෙහි අනුකූල වීම සඳහා පූර්ව අනුමත ත්‍යාග ප්‍රතිශත අනුව ත්‍යාග ප්‍රමාණය ආදායම් ප්‍රකාශනය තුල වියදමක් ලෙස හඳුනාගෙන, සත්‍ය ත්‍යාග වියදම හා එම අනුමත ත්‍යාග වියදම අතර වෙනස ත්‍යාග සංචිත ගිණුමට බැර කර ඇත. ඒ අනුව 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතට අනුකූලව අප විසින් කටයුතු සිදු කර ඇති අතර මේ පිළිබඳ ගිණුම්කරන ප්‍රතිපත්ති තුළ අංක 3.3.3. මඟින් හෙලිදරව් කර ඇත.<br><br>මේ අනුව ගිණුම්කරන ගැලපුම් සංකල්පය සිතාමතා පැහැරහැරීමක් සිදුවී නොමැති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධාන වලට අනුකූල වීම සඳහා ඉහත ගිණුම්කරන ක්‍රමවේදය දිර්ඝ කාලයක් මුළුල්ලේ ගිණුම්කරන පිළිවෙතක් (Accounting Practice) ලෙස අනුගමනය කර ඇත. |
| (ඊ) 2024 ජනවාරි 01 දින සිට පෙබරවාරි 28 දින දක්වා කාලපරිච්ඡේදයේදී ශනිදා වාසනා, ලග්න වාසනා, ජයෝදා, සුපර්බෝල්, අද කෝටිපති, සුපිරි ධන සම්පත යන ලොතැරැයි වර්ග 06 සඳහා දෙවන වරම නමින් ලබාදුන් විශේෂ ත්‍යාග වෙනුවෙන් දරන ලද ත්‍යාග වියදම්වල එකතුව රු.64,100,000 ක් වර්ෂයේ ත්‍යාග වියදමක් ලෙස ගිණුම්ගත නොකර ත්‍යාග සංචිත අරමුදලට ගලපා තිබුණි. ඒ අනුව ගැලපුම් සංකල්පයට පටහැනි ලෙස ත්‍යාග වියදම හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය රු.64,100,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 18 (3) වගන්ති ප්‍රකාරව සංවර්ධන ලොතරැයියක යම් ත්‍යාග මුදලක් කිසියම් තැනැත්තකු විසින් දිනා නොමැති අවස්ථාවක වී ත්‍යාග මුදල ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුමෙහි එකතු වන මුදල් ප්‍රමාණ ඉන් පසුව පැවැත්වෙන සංවර්ධන ලොතරැයි වල ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා යොදා ගනු ලැබිය යුතුයි ලෙස සඳහන් වේ. ඒ අනුව පනතේ ඉහත කී වගන්තියට අනුකූලවනු පිණිස, 2024 වසර තුළ ත්‍යාග සංචිත ගිණුමේ එකතු වී තිබූ අරමුදල් තුලින් රු.64,100,000 ක මුදල් නැවත අමතර ත්‍යාග ලබාදීම සඳහා වැයකර ඇත. මේ අනුව මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත ප්‍රකාරව ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර අමතර ත්‍යාග ලබා දීම සිදු කර ඇති අතර ත්‍යාග සංචිත ගිණුමේ එකතු වී තිබූ අරමුදල් ප්‍රමාණය සඳහා මීට පෙර වර්ෂවල දී ආදායම් ප්‍රකාශ තුළින් ගැලපීම් සිදු කර ඇති බැවින් නැවත වරක් ප්‍රවර්ථන වර්ෂයේ වියදමක් ලෙස දැක්විය නොහැක.<br><br>මේ අනුව ගිණුම්කරන ගැලපුම් සංකල්පය සිතාමතා පැහැරහැරීමක් සිදුවී නොමැති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ විධිවිධාන වලට අනුකූල වීම සඳහා ඉහත ගිණුම්කරන ක්‍රමවේදය දිර්ඝ කාලයක් තිස්සේ ගිණුම්කරන පිළිවෙතක් (Accounting Practice) ලෙස අනුගමනය කර ඇත. |
| (උ) උපචිත සංකල්පයට අනුව උපචිත වියදම් හඳුනාගැනීමේදී වර්තමාන බැඳීමක් පැවතිය යුතුවීම සහ එම වියදම නිරාකරණය කිරීමේදී සම්පත් පිටතට ගලාගෙන යෑමේ හැකියාවක් පැවතීමත් එහි වටිනාකම විශ්වාසනීය ලෙස මැනිය හැකි විය යුතුවීම යන කරුණු සම්පූර්ණ කළ යුතුවේ. 2021 වර්ෂයේ සිට උපචිත වියදම් හඳුනාගැනීමේ ක්‍රමවේදයේ පවතින දුර්වලතාවයන් නිසා උපචිත සංකල්පයට පටහැනි ආකාරයට ඇතැම් උපචිත වියදම් හඳුනාගෙන තිබුණු අතර වියදම හඳුනාගත් වර්ෂයට පසු වර්ෂයේ වියදම් සිදුනොවීම නිසා එය ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ අනුව 2023 වර්ෂයේ උපචිත වියදම් | මෙම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති පරිදි පෙර වර්ෂවල සිදුකරන ලද උපචිත වියදම් සඳහා පදනම් වූ ඇස්තමේන්තුවල (Estimate ) සිදු වූ වෙනස්කම් සඳහා කරන ලද නිවැරදි කිරීමකි. එබැවින් LKAS-8 ප්‍රමිතය අදාල කර ගෙන ඇත. මෙම ගිණුම් ප්‍රමිතය (LKAS - 8) මගින් පෙන්වා දී ඇති පරිදි පෙර වර්ෂවල සිදු වූ ඇස්තමේන්තු පදනම්ව සිදුකරන ලද උපචිත වියදම් හී නිවැරදි කිරීම් ප්‍රවර්තන වර්ෂයට අදාල කරගත යුතු බව දක්වා ඇත (Prospective recognition). |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| ලෙස හඳුනාගෙන තිබුණත් එම වියදම නොදැරීම නිසා රු.12,848,010 ක් නැවත සමාලෝචිත වර්ෂයේදී ලාභයට එකතු කර තිබුණි. | |
| (ඌ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 10 (ආ) වගන්තිය අනුව අනාගත තක්සේරු වර්ෂයකදී දැරීමට අපේක්ෂිත වියදම් හෝ අලාභ සඳහා සංචිතයකට හෝ වෙනත් ස්ථානයකට මාරු කර ඇති මුදල් ප්‍රමාණයන් බදුවන ආදායම ගණනය කිරීමේදී අඩුකිරීම සඳහා ඉඩදෙනු නොලබන බැවින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හර කර ඇති එවැනි ප්‍රතිපාදනයන් බදුවන ආදායම ගණනය කිරීමේදී නැවත ලාභයට එකතුකල යුතුවේ. 2024 දෙසැම්බර් 31 දිනට සේවක පාර්තෝෂිත වගකීම නැවත තක්සේරු කිරීමේදී ඌණ ප්‍රතිපාදනයක් ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හර කර තිබූ රු.4,570,469 ක පාර්තෝෂිත ප්‍රතිපාදනය සහ 2003 වර්ෂයේදී කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබාගැනීම සඳහා ගෙවා තිබුණු රු.723,780 ක ආපසු ගෙවන තැන්පතු මුදල නැවත ලබාගැනීම අවිනිශ්චිත වීම නිසා 2024 වර්ෂයේදී අවිනිශ්චිත ලැබීම් සඳහා ප්‍රතිපාදනයක් කර තිබූ රු.723,780 ක් බදුවන ආදායම ගණනය කිරීමේදී නැවත ලාභයට එකතුකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු. 1,159,274 අඩුවෙන් ගණනය කර තිබුණි. | වාර්ෂික ආදායම් බද්ද ගණනය කිරීම, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 12 අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් මත පදනම්ව වෙන්කිරීමක් පමණක් සිදුකරනු ලැබේ. මෙය දීර්ඝ ක්‍රියාවලියක් බැවින් වාර්ෂික ආදායම් බදු නිශ්චිතව ගණනය කර ගෙවීම් කිරීම සඳහා ඊළඟ මූල්‍ය වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.<br><br>ඒ අනුව අප විසින් 2025 සැප්තැම්බර් 30 දිනට පෙර නියමිත පරිදි 2024 වර්ෂය සඳහා සත්‍ය ආදායම් බදු ගණනය කර අදාල නියමිත බදු ගෙවීම් සිදුකරනු ලැබේ. |
| (එ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 (4) වගන්තියේ සහ උපලේඛණ 02 හි ප්‍රතිපාදන අනුව සම්පූර්ණයෙන් ප්‍රාග්ධන දීමනාව ලබාගත් වත්කම් බැහැර කිරීමේදී ඇතිවන අලාභ බදුවන ලාභය ගණනය කිරීමේදී ඉඩදෙනු නොලබන වියදමක් බැවින් නැවත ගිණුම්කරණ ලාභයට එකතුකල යුතුවේ. සමාලෝචිත වර්ෂය වන විට මණ්ඩලය විසින් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධන දීමනා ලබාගත් පිරිවැය රු. 502,595 ක් වූ කාර්යාල උපකරණ, පිරිවැය රු.289,791 ක් වූ ලිබඩු හා සවිකිරීම් හා පිරිවැය රු.12,570 ක් වූ පරිගණක සමාලෝචිත වර්ෂය තුලදී බැහැර කිරීම නිසා ඇතිවූ එකතුව රු.467,974 ක් වූ අලාභය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්කරණ ලාභයෙන් අඩුකර තිබූ නමුත් බදු වන ආදායම ගණනය කිරීමේදී එම අලාභය නැවත ආදායමට එකතුකර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම් බද්ද රු.140,392 කින් අඩුවෙන් ගණනය කර තිබුණි. | වාර්ෂික ආදායම් බදු ගණනය කිරීම, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 12 අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් මත පදනම්ව වෙන්කිරීමක් පමණක් සිදුකරනු ලැබේ.<br><br>වත්කම් බැහැර කිරීම් සමබන්ධව ගිණුම්කරන ලාභය මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරන පදනම මත පිළියෙල කර තිබුණ ද ආදායම් බදු පදනම මත වෙනුවෙන් අදාල බදු නිර්ණායක මත වත්කම් බැහැර කිරීමේ ලාභය ගණනය කිරීම සඳහා යම් කාලයක් ගත වන බැවින් ගිණුම්කරන අවශ්‍යතාවය සඳහා 2024 වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී මූලික බදු ගණනය කිරීම් සැලකිල්ලට ගෙන මෙම බදු වෙන්කිරීම සිදු කර ඇත. සත්‍ය ආදායම් බදු ගණනය කිරීමේ දී අදාල සියළු තාක්ෂණික කරුණු සැලකිල්ලට ගෙන පුළුල් බදු ගණනය කිරීමක් සිදු කර නියමිත දිනට ගෙවීම් කරනු ලැබේ. |
| (ඒ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 16 (2) වගන්තියේ ප්‍රතිපාදන අනුව ප්‍රාග්ධන දීමනාවන් ගණනය කර බදු වන ආදායම ගණනය කිරීමේදී අඩුකල යුතු වුවත් මණ්ඩලය විසින් බදුවන ආදායම ගණනය කිරීමේදී ප්‍රාග්ධන දීමනාව නිවැරදිව ගණනය කර නොතිබූ අතර සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම වූ රු.109,667,357 කින් 60% ක ප්‍රමාණයක් වූ රු.65,800,414 ප්‍රාග්ධන දීමනාව ලෙස අඩුකර තිබුණි. | වාර්ෂික ආදායම් බද්ද ගණනය කිරීම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදී නිශ්චිතවම ගණනය කල නොහැකි බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත (LKAS) 12 අනුව ඒ සඳහා ඇස්තමේන්තුවක් මත පදනම්ව වෙන්කිරීමක් පමණක් සිදුකරනු ලැබේ.<br><br>මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලබන අවස්ථාවේදීම ප්‍රාග්ධන දීමනා ගණනය කිරීමට කාලයක් නොමැති බැවින් ප්‍රාග්ධන දීමනා, වාර්ෂික ක්ෂය මත පදනම්ව ඇස්තමේන්තුවක් ලෙස යොදාගෙන ඇත.<br><br>වාර්ෂික ආදායම් බද්ද නිශ්චිතව ගණනය කර ගෙවීම් කිරීම සඳහා ඊළඟ මූල්‍ය වර්ෂයේ සැප්තැම්බර් මස 30 වන දින දක්වා කාලයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇත.ඒ අනුව අප විසින් 2025 සැප්තැම්බර් 30 දිනට පෙර නියමිත පරිදි 2024 වර්ෂය සඳහා සත්‍ය ආදායම් බද්ද ගණනය කර අදාල නියමිත බදු ගෙවීම් සිදුකරනු ලැබේ. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ඖ) ජංගම නොවන වත්කම් වලට අදාළ ලෙජර් ගිණුම් 06 ක 2024 වර්ෂයේ ක්ෂය වියදම ලෙස රු.34,116,012 ක් ගිණුම් ගත කර තිබුණු අතර එම වත්කම් ගිණුම් වලට අදාළව විගණනය වෙත ලබාදී තිබුණු ස්ථාවර වත්කම් උපලේඛණ අනුව ක්ෂය වියදම රු.33,367,046 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු.748,966 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය. | ලෙජර් ගිණුම් අනුව 2024 වර්ෂයේ ක්ෂය වියදම නිවැරදි වේ. වත්කම් උපලේඛණය 2024/12/31 දිනට පැවති වත්කම් නිරූපණය වේ.<br><br>2024 වර්ෂය තුළ අපහරණය කරන ලද වත්කම්, උපලේඛනය තුළ පෙන්නුම් නොකරන බැවින් එයට අදාල ක්ෂය ද එම ලේඛනය තුළින් පෙන්නුම් නොකරේ.<br><br>එබැවින් කාර්යාල උපකරණ, ලී බඩු හා සවි කිරීම් හා පරිගණක හා උපාංග යන කාණ්ඩවල ලෙජර් ගිණුම් අනුව ක්ෂය සහ වත්කම් උපලේඛනය අනුව ක්ෂය සංසන්දනය කල නොහැකි බව කාරුණිකව දැනුම් දෙමි.<br><br>කෙසේ නමුත්, විගණන විමසුමේ සදහන් පරිගණක මෘදුකාංග කාණ්ඩයේ රු.299,797 ක්ෂය වෙනස්වීම සම්බන්ධයෙන් එකඟ වන අතර එම වෙනස්කම් 2025 වසර තුළදී නිවැරදි කරනු ලැබේ. |
| (ඕ) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන දෙකට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු මුදල පිළිවෙලින් රු.62,960,000 හා රු.3,875,113 ක් වුවද ආයතන දෙක විසින් විගණනයට සෘජුවම සනාථ කරන ලද ශේෂයන් පිළිවෙලින් රු.77,079,512 ක් සහ රු.6,343,788 ක් විය. | මෙම විගණන විමසුම සම්බන්ධව පෙන්වා දී ඇති විචලතාවය හඳුනා ගැනිම සඳහා අදාල විස්තර ලබා දෙන ලෙස ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සහ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම යන ආයතන වලට ලිඛිතව දන්වා ඇත.<br><br>ශ්‍රී ලංකා රූපවාහිනි සංස්ථාව 2025.05.20 දින ඊමේල් මාර්ගයෙන් මණ්ඩලයේ ගිණුම් හි සඳහන් මුදල නිවැරදි බව සහ එම මුදල ගෙවා අවසන් කර ඇති බවත් දක්වා ඇත.<br><br>තවද සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙන් එම විස්තර ලද පසු අප විසින් ශේෂ සැසඳීමක් සිදු කර මෙම වෙනසට හේතු ඉදිරිපත් කිරීමට ඉදිරියෙදී කටයුතු සිදු කරනු ඇත. |

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.**

| නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම | |
|---|---|---|
| (අ) 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 19 වගන්තිය. | ටිකට් පතක් විකිණිය යුතු මිල, ටිකට් පතක සඳහන් කළයුතු විස්තර, ටිකට්පත් විකිණිය යුතු හෝ විකිණීම සඳහා ඉදිරිපත් කළයුතු ආකාරය, විකිණීමේ අනුයෝජිතයන් සේවයේ නියුක්ත කිරීම සහ ඔවුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකයන්, ටිකට්පතේ ජය අංක සහ ජයග්‍රාහකයන් ප්‍රසිද්ධ කිරීම සහ අවශ්‍ය වෙනත් කාරණා සම්බන්ධව රීති සෑදිය යුතු වුවත් 2024 වර්ෂය අවසන් වන තෙක්ම පනත ප්‍රකාරව රීති සෑදීමට කටයුතු කර නොතිබුණි. | 1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 19 වන වගන්තිය ප්‍රකාරව සකස් කරන ලද රීතීන් 2022.09.28 වන දින පැවති 295 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලදී. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සඳහා ක්ෂේත්‍රයට අදාල විද්වත් කමිටුවකට යොමු කර ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන අංශය වෙත යොමු කර නිර්දේශ ලබා ගැනීමෙන් පසු නැවත 296 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇත. එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මුදල් අමාත්‍යාංශයේ නීති කටයුතු අංශයේ සාමාජිකයෙකු හා කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යයන අංශයේ සාමාජිකයෙකුගෙන් සැදුම් ලත් කමිටුවක් මගින් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර ඉදිරි උපදෙස් ලබා ගන්නා ලෙස දැනුම් දී ඇත. නමුත් මෙම කමිටුව සඳහා සාමාජිකයින් නම් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ ද ඒ සඳහා යහපත් ප්‍රතිචාරයක් මුදල් අමාත්‍යාංශයේ නීති අංශයෙන් නොලැබීම හේතුවෙන් සකස් කර ඇති කෙටුම්පත් වාර්තාව නීති උපදෙස් ලබා ගැනීමට 2024.09.03 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙතයොමු කර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|
| **නීතිරීති / විධානයට යොමුව** | **අනුකූල නොවීම** | |
| (ආ)<br>i. 1997 අංක 20 දරන සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 11 වන වගන්තිය<br>ii. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය වියදම් පාලනය සම්බන්ධ ජාතික අයවැය චක්‍රලේඛයේ 12.3 වගන්තිය<br>iii. රාජ්‍ය ව්‍යාවසාය දෙපාර්තමේන්තුවේ 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාවසායන්ගේ වියදම් කළමනාකරණ හා ව්‍යාපාර තිරසර භාවය පිළිබඳ චක්‍රලේඛයේ 14.1 වගන්තිය<br>(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | 2024 ජුනි 19 දින සිට ජූලි 24 දින දක්වා කාල පරිච්ඡේදයේදී ජනාධිපති අරමුදල පවත්වා තිබුණු දිවයිනේ 1 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 100,000 කට හා අ.පො.ස (උසස් පෙළ) හදාරන තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 6000 කට ලබාදෙන ශිෂ්‍යත්ව වැඩසටහනේ උත්සව කටයුතු සංවිධානය කිරීම සඳහා මණ්ඩලය විසින් එකතුව රු.73,266,631 ක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි. | එවකට සිටි ජනාධිපතිතුමාගේ උපදෙස් මත ජනාධිපති ලේකම්තුමා විසින් අප වෙත පවරන ලද මෙම කාර්යය අධ්‍යක්ෂ මණ්ඩල පූර්ව අනුමැතියට යටත්ව සිදු කරන ලදි. |
| 4.3.1 වගන්තිය | ප්‍රසම්පාදන කාර්යයන් සඳහා සියළුම ආශ්‍රිත වියදම් ඇතුලත් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් පිළියෙල කළ යුතු වුවත් ඇස්තමේන්තුව රු.මිලියන 185 ක්වූ ලොතරැයි දිනුම් ඇදීමේ යන්ත්‍ර දෙකක් මිලදීගැනීමේ ප්‍රසම්පාදනය සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණි. | මෙම ප්‍රසසම්පාදනයට අදාලව 2023 අයවැය ලේඛණය මඟින් රුපියල් මිලියන 50 ක් සහ 2024 අයවැය ලේඛණය මඟින් රුපියල් මිලියන 160 ක් වෙන් කර තිබුණි. විශේෂයෙන් පසුගිය වසර 10 ක කාලය සලකා බැලීමේදී ශ්‍රී ලංකාවට ආනයනය කර ඇත්තේ මෙවැනි යන්ත්‍ර කට්ටල 04ක් පමණක් වන අතර ඒ අනුව මෙම අයිතම ඉහල තරඟකාරීත්වයක් රහිත සීමිත ඉල්ලුමක් පවතින අයිතමයක් වේ.<br><br>එමෙන්ම එම අවස්ථා තුනේදීම මෙම යන්ත්‍ර සැපයීම කර ඇත්තේ එක් දේශීය සැපයුම්කරුවෙකු වන අතර විගණන ඡේදයේ දක්වා ඇති පරිදි ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට පෙර ඇස්තමේන්තුගත පිරිවැය පිළිබඳව අදහස් ලබා ගැනීම සඳහා එම නිෂ්පාදන මව් ආයතනය වෙතින් පමණක් මිළ ගණන් විමසීම ප්‍රසම්පාදනයේ විනිවිදභාවය කඩවීමට හේතු විය හැකි බැවින් එසේ සිදු නොකෙරිණි.<br><br>එම තත්වය මත වෙනත් අයිතමයන්ට සාපේක්ෂව ඇස්තමේන්තුවක් සකස් කිරීම අපහසු තත්වයක් පැවතුණි.<br><br>එබැවින් ලැබී ඇති ලංසු වටිනාකම සැලකිල්ලට ගෙන මේ පිළිබඳව ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇත. |
| 4.2.3 වගන්තියේ 31 වැනි අතිරේකය | ලොතරැයි යන්ත්‍ර දෙකක් මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය උපරිම සති 06 ක කාලසීමාවක් තුළ අවසන් කල යුතු වුවද තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කල 2023 අප්‍රේල් 27 දින සිට ප්‍රසම්පාදන කටයුතු අවසන් කර තෝරාගත් සැපයුම් කරු සමඟ ගිවිසුම | මෙම ප්‍රසම්පාදනයට අදාල ලංසු ලියවිලි නිර්දේශ කිරීම 2023.10.11 දින සිදු කර ඇති අතර ඊට අදාල ප්‍රසම්පාදන කමිටු තීරණය 2023.10.17 දින ලැබී ඇත. එම ලංසු කැඳවීමේ නිවේදනය 2023.10.19 පුවත්පත්වල ප්‍රසිද්ධ කරමින් එම ලංසු විවෘත කිරීම 2023.11.24 දින සිදු කර ඇති අතර ලැබී ඇති ලංසු ඇගයීමට ලක් කරමින් තාක්ෂණික ඇගයීම් කමිටුව මඟින් 2024.12.15 දිනැති වාර්ථාව ඉදිරිපත් කර ඇත. ඒ අනුව ලංසු විවෘත කළ දින සිට සති 03ක් ඇතුලත ඊට අදාල ප්‍රසම්පාදන කමිටු තීරණය 2024.01.02 දින ලැබී ඇති අතර එම ප්‍රසම්පාදන කමිටු තීරණය 2024.01.03 දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|
| නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම | |
| | අත්සන් කරන ලද දිනය වූ 2024 පෙබරවාරි 20 දක්වා සති 42 ක කාලයක් ගතකර තිබුණි. | එම ලංසු පැවරීම හා සම්බන්ධයෙන් ලැබී ඇති ලංසු මිළ ගණන් නැවත සමාලෝචනය කර එම මිළ ගණන් ප්‍රායෝගිකද යන්න තව දුරටත් තහවුරු කර ගැනීම සඳහා ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටු වාර්ථාවක් නැවත ඉදිරිපත් කරන ලෙසට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව එකී සමාලෝචනයන් සිදු කොට එම නිරීක්ෂණ සැලකිල්ලට ගෙන ලංසු පැවරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය 2024.01.18 දින ලැබී තිබූ අතර 2024.01.19 දින ලංසු පවරා ඇත. ඒ අනුව ලංසු ලියවිලි නිර්දේශ කළ දින සිට සති 12 කාලයකදී ප්‍රසම්පාදන කමිටු තීරණය ලබා දී මූලික කටයුතු අවසන් කර ඇත. ඒ අනුව ලංසු මිළ ගණන්වල වලංගු කාලය හා අනුමත ප්‍රසම්පාදන සැලැස්ම ඇතුලත ප්‍රසම්පාදනය ඉතා සාර්ථකව අවසන් කොට ඇත.<br><br>මෙම විගණන ඡේදයට අදාලව සති 06 කාල සීමාවක් තුල ප්‍රසම්පාදනය අවසන් කළ යුතු බවට සඳහන් කර ඇති නමුත් එම ප්‍රකාශය නිවැරදි නොවේ. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.3. හි 31 අතිරේකයේ සඳහන් වන්නේ ලංසුකරුවන් සඳහා ලංසු මිළ ගණන් ඉදිරිපත් කිරීම (Bidding Period) සඳහා ලබාදිය හැකි උපරිම කාලය සති 06 මිස මුළු ප්‍රසම්පාදනය සති 06 කාලයකින් අවසන් කිරීම නොවන බව මෙයින් දන්වා සිටිමි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.3 (88 පිටුව) යටතේ ප්‍රසම්පාදන වලට අදාලව ඉටු කළ යුතු එක් එක් ප්‍රසම්පාදන අදියර සඳහා ගත කළ යුතු උපරිම කාලය දන්වා ඇත. ඒ අනුව මෙම ප්‍රසම්පාදනය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.3 හි සඳහන් කාලච්ඡේදයන් නොඉක්මවන අයුරින් සාර්ථකව අවසන් කර ඇත. |
| 2.1.2 වගන්තියේ | තාක්ෂණික ඇගයීම් කමිටුව රැස්වීම්වල දී සිදුවන කටයුතු පිළිබඳව වාණිජමය රහස්‍යතාවය පිළිබඳව ගරු කරන බවට සහ තමන්ගේ අපක්ෂපාතිත්වය, අවංක භාවය, පෞද්ගලික සම්බන්ධතාවයක් නොමැති බවට ප්‍රතිඥා දෙමින් ලබාදිය යුතු ප්‍රකාශ තාක්ෂණික ඇගයීම් කමිටුවවල සාමාජික-යින්ගෙන් ලබා ගෙන නොතිබුණි. | ප්‍රධාන ප්‍රසම්පාදන වලට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් වෙතින් මෙම රහස්‍යභාවය පිළිබඳ පත්‍රිකාව අත්සන් කිරීම සිදුවන නමුත් මෙම ප්‍රසම්පාදනයට අදාලව මෙම ලේඛනය අත්සන් කර ගැනීම මඟහැරී තිබුණි. මේ වන විට සිදු කෙරෙන ප්‍රසම්පාදන කටයුතු වලදී එම ප්‍රකාශනය අත්සන් කිරීම සිදු කිරීමට පියවර ගෙන ඇත. |
| (ඈ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති මෙහෙයුම් කාර්ය සංග්‍රහයේ 3.2 (v) ඡේදය | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියක් අනුව දිරිදීමනා ගෙවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු වුවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද දිරිදීමනා ගෙවීමේ පටිපාටියක් නොමැතිව සමාලෝචිත වර්ෂයේදී රු.121,772,415 ක මුදලක් දිරි දීමනා ලෙස කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි. | මණ්ඩලයේ දිරි දීමනා ගෙවීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර 2024 වර්ෂයේ දී මේ සඳහා ක්‍රමවේදයක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලදි. එම අනුමැතිය මත පදනම්ව මුදල් අමාත්‍යාංශය වෙතින්ද අදාළ විධිමත් අනුමැතියක් ලබා ගැනීමට මේ වන විට අවශ්‍ය තොරතුරු මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|---|
| නීතිරීති / විධානයට යොමුව | අනුකූල නොවීම | |
| (ඉ) 2015 මැයි 25 දිනැති අංක PED 1/2015 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | | |
| 2 ඡේදය | නිල වාහන ලැබීමට සුදුසුකම් නොමැති MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දරණ නිලධාරීන් අටදෙනෙකු සඳහා 2024 ජනවාරි 01 දින සිට නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයේදී නිල වාහන අනුයුක්ත කර තිබුණි. | සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීම සම්බන්ධව 2023.07.24 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කල අතර එම ලිපිය සඳහා පිලිතුරු ලිපියක් 2023.08.15 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් යොමු කර තිබූ අතර මෙම ලිපියේ සඳහන් උපදෙස් පරිදි සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට තීරණය කර ඇත. ඒ අනුව සකස් කල ක්‍රමවේදය 2024.05.20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි විය. ඉන් පසුව එවකට සේවය කල සියලුම සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ට අනුයුක්ත වාහන පහසුකම 2024 නොවැම්බර් 30 දක්වා ලබා දී ඇත. |
| 3.1 ඡේදය | ඉන්ධන දීමනාව ලබාගැනීමට හිමිකමක් නොමැති නමුත් නිල වාහන ලබාදී තිබුණු MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී තනතුරු දරණ නිලධාරීන් අටදෙනෙකු සඳහා 2024 ජනවාරි 01 දින සිට නොවැම්බර් 30 දින දක්වා කාලපරිච්ඡේදයේ ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කිරීමට රු.3,274,000 ක මුදලක් දරා තිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් යොමු කල 2023.08.15 දිනැති ලිපියේ සඳහන් උපදෙස් අනුව සකස් කල ක්‍රමවේදය 2024.05.20 වන දින පැවති 294 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වීමෙන් පසුව එවකට සේවය කළ සියලුම සහකාර සාමාන්‍යාධිකාරීවරුන්ට අනුයුක්ත වාහන පහසුකම 2024 නොවැම්බර් 30 දක්වා ලබා දී ඇත. ඒ සඳහා රු.3,274,000 ක මුදලක් ඉන්ධන වශයෙන් දරා ඇත. |
| (ඊ) 2016 මැයි 30 දිනැති අංක 04/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය. | රාජ්‍ය සංස්ථාවක MM 1-1 ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරීන්ට අනුයුක්ත කිරීම සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබාගැනීමට නොහැකි වුවත් චක්‍රලේඛයේ විධිවිධාන වලට පටහැනි ලෙස නිල වාහන හිමිකමක් නොමැති MM 1-1 ශ්‍රේණියේ සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) තනතුර දරන නිලධාරිනිය සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබාගත් මෝටර් රථයක් 2024 ජනවාරි 01 දින සිට අගෝස්තු 31 දින දක්වා අනුයුක්ත කර තිබුණු අතර එම මෝටර් රථය සඳහා එම කාලපරිච්ඡේදයේදී මෙහෙයුම් කල්බදු කුලී ලෙස රු. 1,564,000 ක මුදලක් ගෙවා තිබුණි. | මණ්ඩලයේ මෝටර් රථවල පවතින හිඟතාවය හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ මෝටර් රථ 03 ක් ලබා ගෙන තිබූ අතර එම මෝටර් රථ අතුරින් මෝටර් රථ 02ක් සාමාන්‍යාධිකාරී හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුට අනුයුක්ත කර තිබුණි. අනෙක් මෝටර් රථය තාවකාලිකව සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකුට අනුයුක්ත කර තිබූ අතර එම මෝටර් රථය 2024 අගෝස්තු මස 01 වන දින සිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(මුදල්) වෙත අනුයුක්ත කර ඇත. එමෙන්ම මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන තිබූ එක් මෝටර් රථයක් 2024 දෙසැම්බර් 09 වන දින අදාල සැපයුම්කරු වෙත ආපසු භාර දීමට කටයුතු කර ඇත. එබැවින් මණ්ඩලයේ සංචිතය තුල ප්‍රමාණවත් පරිදි මෝටර් රථ නොමැති වීම හේතුවෙන් මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ ලබා ගෙන සහකාර සාමාන්‍යාධිකාරී (අලෙවි) වෙත අනුයුක්ත කර තිබූ මෝටර් රථය සඳහා රු1,564,000 ක මුදලක් ගෙවා තිබුණි. |

<table>
<tr><th colspan="2">විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු</th><th>කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර</th></tr>
<tr><td>නීතිරීති / විධානයට යොමුව</td><td>අනුකූල නොවීම</td><td></td></tr>
<tr><td>(උ) 2022 ජනවාරි 14 දිනැති අංක PED 1/2015 (ii) දරණ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය</td><td>මණ්ඩලයේ සභාපති, සමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මුදල්), නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අලෙවි) තනතුරු දරන නිලධාරීන් සඳහා චක්‍රලේඛය අනුව අනුමත මාසික ඉන්ධන සීමාව ඉක්මවා 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදයේදී රු.125,483 ක වැඩිපුර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කර තිබුණි.</td><td>PED 1/2015 (ii) චක්‍රලේඛයේ සඳහන් පරිදි සභාපති, සමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (මුදල්), නියෝජ්‍ය සමාන්‍යාධිකාරී (අලෙවි) තනතුරු දරන නිලධාරීන්ගේ ඉන්ධන දීමනාව ගෙවීම සිදු කළ යුතු අතර ඒ අනුව 2024 වර්ෂයේදී වැඩිපුර ගෙවා ඇති රු.125,483 ක මුදල ඒ ඒ නිලධාරියා වෙනුවෙන් ගෙවා ඇති වැඩිපුර මුදල් ගණනය කර එම නිලධාරීන්ගෙන් ආපසු අය කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.</td></tr>
<tr><td>(ඌ) රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 3.5 ඡේදය.</td><td>අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව රාජ්‍ය ව්‍යවසායන්ගේ කාර්ය මණ්ඩලය අමාත්‍යංශයේ හෝ වෙනත් ආයතන සඳහා නිදහස් නොකල යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමකින් තොරව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කාර්යමණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු මුදල් රාජ්‍ය අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා නිදහස් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි.</td><td>1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනතේ 15 වන වගන්තියේ අංක 01 අනුව අමාත්‍යවරයාට පවතින බලතල ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ මණ්ඩලයේ සේවයට බඳවාගත් කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ උපදෙස් මත තාවකාලිකව අනුයුක්ත කර තිබුණි. නමුත් එම කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සංවර්ධන ලොතරැයි මණ්ඩලය මගින් සිදු කළද එම ගෙවන ලද වැටුප් සම්පූර්ණයෙන්ම මුදල් අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කර ඇත. එබැවින් මණ්ඩලයට කිසිදු මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත.</td></tr>
<tr><td colspan="3">2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව</td></tr>
<tr><td colspan="2">(අ) 2024 අගෝස්තු 01 දින සිට 2025 ජූලි 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා මණ්ඩලයේ ලොතරැයිපත් වර්ග 07 ක් නිර්මාණය, සංවර්ධනය, මුද්‍රණය හා සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී ජයෝදා සහ සුපර් බෝල් යන ලොතරැයි සඳහා අවම මිල ඉදිරිපත් කර තිබූ ලංසුව, ලංසු ලේඛනයේ 2.C ඡේදයේ සඳහන් ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොමැති බවට තාක්ෂණික ඇගයීම් කමිටුව තීරණය කර මූලික ලංසු ඇගයීමේදී ඉවත්කර තිබුණි. එකී ලොතරැයි වර්ග දෙක ඇතුළුව ලොතරැයි වර්ග තුනක් සැපයීම සඳහා තෝරාගත් ලංසුකරුද ලංසු ලේඛනයේ 2.C ඡේදයේ සඳහන් ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොතිබුණි. ඒ අනුව ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන් සපුරා නොමැති බවට පවසා අවම ලංසුව ඉදිරිපත්කල ලංසුකරු මූලික ලංසු ඇගයීමෙන් ප්‍රතික්ෂේප කර එම අවශ්‍යතාවයම සපුරා නොතිබූ ලංසුකරුට කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබීම නිසා ජයෝදා සහ සුපර් බෝල් යන ලොතරැයිපත් දෙක මුද්‍රණයේදී මණ්ඩලයට රු.8,140,000 ක ආර්ථිකමය වාසියක් ලබාගැනීමට නොහැකිවී තිබුණි.</td><td>Printcare Secure Ltd ආයතනයේ ලංසු මිළ ගණන් ප්‍රතික්ෂේප වී ඇත්තේ එම ආයතන විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය ලොතරැයි මුද්‍රණය සඳහා සේවා සැපයීමට යොදවා ඇති එම ආයතනයේ ස්ථිර තොරතුරු තාක්ෂණ නිළධාරීන් බව තහවුරු නොවීම හා Printcare Secure Ltd ආයතනය නම් කරන ලද නිළධාරීන් ලොතරැයි සැපයීමට අදාල තෙරතුරු තාක්ෂණ රාජකාරීන් සඳහා සම්බන්ධ නොවන වෙනත් පිරිසක් බව මෙන්ම Printcare Secure Ltd ආයතනයේ ලොතරැයි මුද්‍රණයට අදාල තොරතුරු තාක්ෂණ රාජකාරී කටයුතු තෙවන පාර්ශවීය ආයතනයක් වෙතින් ලබා ගන්නා බව ලිඛිතව තහවුරු වීම මත පමණක් වේ.<br><br>විශේෂයෙන් ලොතරැයි මුද්‍රණ කාර්යභාරයට අදාල සියලුම තොරතුරු තාක්ෂණමය කටයුතු පිළිබඳ දීර්ඝ කාලීන පළපුරුද්ද හා දැනුම මෙම ක්‍රියාවලියට පැවතිය යුතු අනිවාර්යය කරුණක් වන අතර කුමන හෝ ලංසුකරුවකුගේ තොරතුරු තාක්ෂණ කාර්යය මණ්ඩලය තුල එවැනි පළපුරුදු තාක්ෂණ නිලධාරීන් සිටීම මණ්ඩලයේ සැපයීම් ක්‍රියාවලිය බාධාවක් හා අවධානමකින් තොරව එය සුමටව ගලා යෑමේ හැකියාව ලැබෙන අත්‍යවශ්‍යම කරුණක් වන බවද සඳහන් කරමි. එබැවින් විගණනය විසින් දක්වා ඇති පරිදි මූලික සුදුසුකම් ලබා නොමැති ලංසුකරුවකුගේ</td></tr>
</table>

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | ලංසු මිළ ගණන් පදනම් කර ගනිමින් මණ්ඩලයට කිසිඳු අලාභයක් සිදු වී නොමැත. ඇගයීම් ක්‍රියාවලියේදී මූලික සුදුසුකම් සපුරා නොමැති ලංසු මිළ ගණන් ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව නැවත ප්‍රතික්ෂේප වූ වලංගු මිළ ගණන් සන්සන්දනාත්මක අවශ්‍යතා සඳහා භාවිතා කිරීම ප්‍රායෝගික නොවන අතර, ඇගයීමෙන් බැහැර කළ ලංසුවක වටිනාකමක් සැලකිල්ලට නොගැනේ. එබැවින් මෙම ඡේදයේ දක්වා ඇති පරිදි ආර්ථික වාසියක් මණ්ඩලයට අහිමි වී නොමැත. |
| (ආ) ලංසු ලේඛනයේ ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන්හි 06 ඡේදයේ අනුව පසුගිය වර්ෂ තුනක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ලබාදිය යුතු වුවත් වර්ෂ දෙකක විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පමණක් ඉදිරිපත් කර තිබියදී සහ ලංසුකරුවන් විසින් සපුරාලිය යුතු අනිවාර්ය අවශ්‍යතාවයන්හි 16.iii ඡේදය අනුව ලංසුකරු විසින් පසුගිය වර්ෂ තුනක සිදුකරන ලද සමාන සැපයුම් පිළිබඳ විස්තර සහ ඒවා තහවුරු කරන ලේඛන ඉදිරිපත් කල යුතු වුවත් එවැනි තොරතුරු සපයා නොතිබියදී ඒ පිළිබඳව සලකා බැලීමකින් තොරව තෝරාගත් සැපැයුම්කරු සඳහා ලග්න වාසනා සහ කප්රුක ලොතරැයි වර්ග දෙක සඳහා රු.234,460,000 ක ප්‍රතිෂ්ඨාවකට මුද්‍රණ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. | ලංසු ඇගයීමට අදාලව Toppan Forms (Colombo) Ltd ආයතනය Eligibility Criteria හි සඳහන් ප්‍රධාන සහ මූලික අනිවාර්යය ලංසු කොන්දේසි සපුරා තිබූ අතර තාක්ෂණික ඇගයීම් වාර්තාවේ 8.1 ඡේදය ප්‍රකාරව ඇගයීම් කමිටුව විසින් සිදු කල මුද්‍රණ ආයතන පරීක්ෂාවේදී එම ආයතනයේ ඇති මුද්‍රණ යන්ත්‍ර පිළිබඳව හා එම ආයතනය විචල්‍ය දත්ත මුද්‍රණය පිළිබඳ (variable data printing) පළපුරුද්ද පවතින ආයතනයක් බව තහවුරු කර ඇත.<br><br>ලංසු කොන්දේසි ප්‍රකාරව මෙම ආයතනය විසින් 2021,2022 සහ 2023 යන වර්ෂ වලට අදාලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති අතර 2023 වර්ෂයට අදාලව විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇති බව විගණනයේ පෙන්වා දීම අනුව දැනගන්නට ලැබුණි.<br><br>එමෙන්ම 16 ඡේදයේ දක්වා ඇත්තේ ලංසුකරුවන් විසින් ඉදිරිපත් කල යුතු ලිඛිත තොරතුරු පෙළගස්වා ඇති ආකාරය වන අතර 16(III) යටතේ දක්වා ඇත්තේ පසුගිය වසර 3 ට අදාලව ඇති විචල්‍ය දත්ත මුද්‍රණය පිළිබඳ පළපුරුද්ද තහවුරු කෙරෙන තොරතුරු ඉදිරිපත් කිරීම පිළිබඳව වේ.<br><br>ඒ අනුව ලංසුකරු විසින් ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කර තිබූ අතර තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අදාලව එම ආයතනයේ විචල්‍ය දත්ත මුද්‍රණ ධාරිතාව සහ හැකියාව පිළිබඳව සජීවීවද නිරීක්ෂණය කර ඇති බවද තහවුරු කොට ඇත.<br><br>එමෙන්ම මෙම ලංසුකරු මෙම ප්‍රසම්පාදනයට අදාලව ලග්න වාසනාව සහ කප්රුක ලොතරැයිපත් වර්ග දෙක සඳහා අවම ලංසු මිල ගණන් ඉදිරිපත් කර තිබූ සාරානුකූල ප්‍රතිචාර දක්වා ඇති සාර්ථක ලංසුකරුවූ බැවින් එම ආයතනය වෙත මෙම කොන්ත්‍රාත්තුව පවරා දී ඇත. |

## 2.3 වෙනත් විගණන නිරීක්ෂණ

| | |
|---|---|
| (අ) දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිලදීගන්නා තෙක් සුපිරි ධන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය මණ්ඩලය විසින් නිර්මාණය කරන ලද දිනුම් ඇදීමේ මෘදුකාංගයක් මඟින් සිදුකර තිබූ අතර එම මෘදුකාංගයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධව සිදුකරන ලද පද්ධති විගණනය සඳහා රු.1,160,613 ක් පුද්ගලික විගණන ආයතනයකටද, ලොතරැයි ප්‍රතිඵල රූපවාහිනිය මඟින් විකාශනය කිරීමේදී දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මඟින් පන්දු මිශ්‍රකර ඉන් අහඹු ලෙස පන්දුවක් තෝරාගැනීම සිදුකරන ආකාරයට විකාශනය කිරීම සඳහා වීඩියෝ සජීවිකරණ මෘදුකාංගයක් (Game Animation Software) නිර්මාණය කරගැනීම සඳහා රු.3,350,000 ක මුදලක් පුද්ගලික මෘදුකාංග නිර්මාණ ආයතනයකටද ගෙවා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී දිනුම් ඇදීමේ යන්ත්‍රයක් මිලදීගෙන සුපිරි ධන සම්පත ලොතරැයියේ දිනුම් ඇදීමේ කටයුතු සඳහා | සුපිරි ධන සම්පත ලොතරැයි දිනුම් ඇදීම Game Animation software මඟින් සිදුකිරීමට මූලිකව තීරණය කර තිබූ අතර ඒ අනුව, ඊට අදාළ මෘදුකාංග පද්ධති පිළියෙල කරන ලදී. ලොතරැයි දිනුම් ඇදීම් සඳහා යන්ත්‍ර භාවිතා කිරීමේදී ඒ සඳහා Backup යන්ත්‍ර තිබිය යුතු අතර සුපිරි ධන සම්පත සඳහා නව යන්ත්‍ර මිළට ගැනීම සිදුකලද ඒ සඳහා ද Backup පැවතිය යුතුය. එබැවින් සුපිරි ධන සම්පත සඳහා යන්ත්‍ර මිළට ගැනීම සිදුකරන තෙක් Game Animation software පිළියෙල කිරීමට කටයුතු කළ අතර අදාල යන්ත්‍ර ලබා ගැනීමෙන් පසු එම Game Animation මෘදුකාංගය නව යන්ත්‍ර කට්ටලයේ ආරක්ෂිත (Backup) ලෙස කටයුතු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව මෙම මෘදුකාංග පද්ධතිය 2023.11.09 දින සිට 2024.04.30 දක්වා සුපිරි ධන සම්පත ලොතරැයි පතට අදාල දිනුම් ඇදීම් සඳහා භාවිතා කර ඇති අතර එම කාලයට අදාල මෙම ලොතරැයි පතේ මුළු පිරිවැටුම රුः 1,391,206,000.00 කි. සෑම විටම සියලුම ලොතරැයි |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| යොදාගැනීම නිසා ඉහත සඳහන් මෘදුකාංග දිනුම් ඇදීමේ ක්‍රියාවලියෙන් ඉවත්කර තිබුණි. දිනුම් ඇදීමේ යන්ත්‍රය මිලදීගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි ලෙස සැලසුම් කර කාර්යක්ෂමව සිදුකර නව ලොතරැයිපත වෙළඳපොලට හඳුන්වාදීමට පෙර දිනුම් ඇදීමේ යන්ත්‍රය මිලදීගැනීම සිදුකර තිබුණේනම් දිනුම් ඇදීමේ මෘදුකාංග නිර්මාණය සහ එහි විගණනය සඳහා දරන ලද රු.4,510,613 ක මුදල ඉතිරි කරගැනීමට හැකිව තිබූ බව නිරීක්ෂණය විය. | ටිකට්පත් වල ලොතරැයි දිනුම් ඇදීම දිනපතා සිදුකිරීම මණ්ඩලය විසින් සහතික කළ යුතු කාර්යයක් බැවින් ඒ සඳහා එලෙස ක්‍රියා කළ යුතුව පවතී.<br><br>එබැවින් විගණනය විසින් මෙම විගණන ඡේදයේ දක්වා ඇති පරිදි Game Animation මෘදුකාංගය දිනුම් ඇදීමේ නව යන්ත්‍ර ලැබීමත් සමඟම දිනුම් ඇදීමේ ක්‍රියාවලියෙන් ඉවත්කර නොමැති අතර එය Backup පහසුකම් ලෙස තබා ගනිමින් දිනුම් ඇදීම ක්‍රියාවලියේ අඛණ්ඩතාවය තහවුරු කරමින් දිනපතාම සිදුකරනු ලබයි.<br><br>මෙම ඡේදයට අදාළව විගණනය විසින් දක්වා ඇති පරිදි රු.4,510,613.00 ක මුදලක් මණ්ඩලයට අහිමි වී නොමැත. මෙම මුදල මණ්ඩලයේ සුපිරි ධන සම්පත ලොතරැයි ටිකට්පතේ දිනුම් ඇදීමේ ක්‍රියාවලිය නිතිපතා සිදු කිරීම වෙනුවෙන් කර ඇති ආයෝජනයක් වේ. එමඟින් නව දිනුම් ඇදීමේ යන්ත්‍රය වෙනුවෙන් Backup යන්ත්‍රයක් මිලට ගැනීමට වැය වීමට ඉඩ තිබූ විශාල මුදලක් මණ්ඩලයට ඉතිරි කරගැනීමට හේතු වූ බව වැඩි දුරටත් දන්වා සිටිමි.<br><br>එසේම නව දිනුම් ඇදිමේ යන්ත්‍රය මිලට ගන්නා තෙක් මෙලෙස Game Animation software භාවිතයෙන් දිනුම් ඇදීම සිදු නොකළේ නම් මණ්ඩලයට රුː 1,391,206,000.00ක පිරිවැටුමක් අහිමිවීමට ඉඩ ඇත.<br><br>තවද, 2023 නොවැම්බර් සිට 2024 අප්‍රේල් දක්වා මෘදුකාංග පද්ධතියක් හරහා සුපිරි ධන සම්පත දිනුම් ඇදීම තුළින් රුː 4,316,831.00 ක ශුද්ධ ලාභයක් මණ්ඩලයට ලැබී ඇත. |
| (ආ) ජනාධිපති අරමුදලට මුදල් ප්‍රේෂණය කිරීම සහ මණ්ඩලය එදිනෙදා ගණුදෙනු සඳහා භාවිතා කරන ලංකා බැංකුවේ අංක 0074824905 දරණ ගිණුමට මුදල් ප්‍රේෂණය කිරීම සඳහා භාවිතා කරනු ලබන මහජන බැංකුවේ යුනියන් පෙදෙස ශාඛාවේ පවත්වාගෙන යන අංක 014200190000651 දරණ Interest Sweep Account යන ඉතිරිකිරීමේ ගිණුමේ රු.565,797,125 ක පමණ මාසික සාමාන්‍ය ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මහජන බැංකුව විසින් ඉතිරිකිරීමේ ගිණුම් සඳහා ගෙවන වාර්ෂික පොලී අනුපාතය සියයට 2.2 ක් වූ අතර 2024 වර්ෂයේදී රු.17,966,768 ක පොලී ආදායමක් උපයා තිබුණි. ඉතිරිකිරීමේ ගිණුමක රඳවාගෙන තිබුණු මෙම මුදල මෙම බැංකුවේම සියයට 5.5 ක පමණ පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබන දින 7 කෙටිකාලීන තැන්පතු (7 Day Call Deposit) වල ආයෝජනය කලේනම් රු.36,486,529 ක පමණ පොලී ආදායමක්ද, සියයට 8 ක පමණ පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබන මාසික ස්ථාවර තැන්පතු වල ආයෝජනය කලේනම් රු.55,864,543 ක පමණ පොලී ආදායමක් උපයා ගැනීමට අවස්ථාව තිබුණි. ඒ අනුව ඵලදායී ලෙස ආයෝජනය කර ඉහළ පොලී ආදායමක් ලබාගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | මණ්ඩලයේ ප්‍රධාන මුදල් රැස්කිරීමේ ගිණුම් මහජන බැංකුව හා ලංකා බැංකුව තුළ පවත්වාගෙන යනු ලබන අතර බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් බොහෝමයක් මහජන බැංකුව හරහා මුදල් තැන්පත් කරන බැවින් අපගේ මහජන බැංකු ගිණුම තුළ දෛනිකව වැඩි මුදල් ප්‍රමාණයක් රැස්වේ.<br><br>එලෙස රැස්වන මුදල් අපගේ ජංගම ගිණුම් වල රඳවා නොගෙන මහජන බැංකුවේ ඉතුරුම් ගිණුමට බැර වීමට ස්ථාවර නියෝග ලබා දී ඇත.<br><br>මේ තුළින් 2024 වර්ෂය තුළ දී රු.17,966,769 ක පොළී ආදායමක් උපයා ඇත.<br><br>විගණන විමසුමේ සඳහන් පරිදි සැලකිය යුතු මුදලක් මෙම ගිණුම තුළ ශේෂය වශයෙන් 2024 වසරේ දී පවත්වාගෙන ගොස් ඇති අතර මණ්ඩලයේ කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා සපුරා ගැනීම හා හදිසියේ බිහිවිය හැකි සුපිරි ජයමලු ත්‍යාග හා අනෙකුත් ත්‍යාග මුදල් සඳහා ගෙවීම් කිරීම වෙනුවෙන් මෙම ගිණුමේ මුදල් ශේෂයක් පවත්වා ගනු ලැබේ.<br><br>ත්‍යාගලාභීන් විසින් ජයග්‍රහණය කර ඇති ලොතරැයි දිනුම් වෙනුවෙන් හිමිකම්පෑම සඳහා ඔවුන් මාස 06 ක් තුළ ඉදිරිපත් වීමට නියමිත අතර එම ලොතරැයි ත්‍යාග වටිනාකම මාසික සාමාන්‍යයක් ලෙස රු. මිලියන 700ක් පමණ වන අතර දිනුම් අඳිනු ලබන ලොතරැයිපත් වල සුපිරි ජයමලු ත්‍යාග වටිනාකම් වල එකතුව ද රු.මිලියන 800 ක් පමණ වේ. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | තවද, ජනාධිපති අරමුදල වෙනුවෙන් සෑම මසක් සඳහාම පළමු සතිය තුළ අත්තිකාරම් වශයෙන් රු. මිලියන 200 ක් ගෙවීම් කිරීමෙන් අනතුරුව ගෙවිය යුතු හිඟ ශේෂය ජනාධිපති අරමුදල විසින් වරින් වර තම මූල්‍ය අවශ්‍යතා වෙනුවෙන් ඉල්ලුම් කරනු ලබන පරිදි ගෙවීම් කිරීමට අප මුදල් ශේෂය තබා ගත යුතුවේ.<br><br>ඉහත කී අවශ්‍යතා හේතුවෙන් මූල්‍ය මෙහෙයුම් නම්‍යශීලිත්වය උදෙසා මණ්ඩල විසින් මහජන බැංකුවේ ඉතුරුම් ගිණුම තුළ, විගණන විමසුමේ සඳහන් පරිදි මාසික සාමාන්‍ය මුදල් ශේෂයක් පවත්වා ගෙන ගොස් ඇත.<br><br>තවද, විගණන විමසුමෙහි සඳහන් පරිදි දින 07 කෙටිකාලීන තැන්පතු (7 Day Call Deposit) හී මුදල් තැන්පත් කළහොත් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන සෙසු ගිණුම් වෙත RTGS හරහා මුදල් බැර කිරීමට නොහැකි තත්වයක් ද ඇති වනු ඇත.<br><br>එමෙන්ම බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් විසින් ඔවුන්ගේ පහසුව සැළකිල්ලට ගෙන දෛනික මුදල් වැඩි කොටසක් මහජන බැංකුවේ තැන්පත් කිරීම සාමාන්‍ය පිළිවෙත වේ.<br><br>2024/12/31 දිනට මණ්ඩලය සතුව රු. මිලියන 1,265 ක ස්ථාවර තැන්පතු ප්‍රමාණයක් පැවති අතර මණ්ඩලය විසින් සෑම සති දෙකකට වරක්ම මණ්ඩලයේ මූල්‍ය තත්වය පිළිබඳ මූල්‍ය විශ්ලේෂණයක් කර අතිරික්ත මුදල් ස්ථාවර ආයෝජනය කරනු ලැබේ.<br><br>කෙසේ නමුත් විගණන විමසුමේ සඳහන් බැංකු ශේෂය ඉහතින් සඳහන් කළ පරිදි මණ්ඩලයේ කෙටිකාලීන ද්‍රවශීල අවශ්‍යතා වෙනුවෙන් තබා ගෙන ගිය අතර මූල්‍ය මෙහෙයුම් හී පැවතිය යුතු නම්‍යශීලිත්වය සැළකිල්ලට ගෙන එම ශේෂය දිගුකාලීන ආයෝජන තුළ යෙදවීම සිදු කළ නොහැකි බව දැනුම් දෙමි.<br><br>ඒ තුලින් මණ්ඩලයේ දෛනික මෙහෙයුම් ක්‍රියාවලියේ ගැටළුවක් ඇති විය හැකි බව වාර්තා කරමි. |
| (ඈ) 2023 නොවැම්බර් 09 දින වෙළඳපොලට හඳුන්වාදී තිබූ සුපිරි ධන සම්පත ලොතරැයිපත සතියේ දිනක අලෙවිය ලොතරැයිපත් 245,000 දක්වා සහ ඉරිදා දිනක අලෙවිය ලොතරැයිපත් 220,000 දක්වා ඉහළ නැංවීමට 2024 වර්ෂයේ රු.14,002,480 ක් වැය කරමින් අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් තුනක් ක්‍රියාත්මක තිබුණද සමාලෝචිත වර්ෂයේ සතියේ දිනක සාමාන්‍ය අලෙවිය ලොතරැයිපත් 164,419 ක් හා ඉරිදා දිනක සාමාන්‍ය අලෙවිය ලොතරැයිපත් 133,051 ක් පමණක් විය. මෙම අලෙවි ප්‍රවර්ධන උපක්‍රම සාර්ථකවී නොතිබුණි. | දැඩි තරඟකාරිත්වය හේතුවෙන් මෙම නව ලොතරැයිපත වෙළඳපලතුළ ස්ථාපිත කිරීම වෙනුවෙන් විවිධ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට සිදු විය. කෙසේ නමුත් මේවන විට එම ප්‍රවර්ධන කටයුතු නවතා ඇති අතර ත්‍යාග ප්‍රතිශතය ද අඩුකර ලාභදායිත්වය වැඩි කිරීමට කටයුතු යොදා ඇත. එමෙන්ම 2025 අප්‍රේල් මස වන විට අලෙවියේ වර්ධනයක් සිදු වී ඇති අතර එය සමාන්‍ය ලෙස සතියේ දිනක 177,077 ක් සහ ඉරිදා දිනක 146,171 ක් වේ. |
| (ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ලොතරැයි වර්ග 08 කට අදාළව බෙදාහැරීමේ අලෙවි නියෝජිතයන් 98 දෙනෙකු වෙත ලොතරැයිපත් 811,002,580 ක් නිකුත් කර තිබූ අතර ඉන් සියයට 8 ක් හෙවත් ලොතරැයිපත් 67,091,560 ක් විකිණීමට නොහැකි බව දන්වා තිබුණි. මෙම විකිණීමට නොහැකි බව දන්වා එවූ ලොතරැයිපත් මණ්ඩලයට නැවත භාරදිය යුතු වුවත් ලොතරැයිපත් 60,350 ක් එලෙස මණ්ඩලයට සමාලෝචිත වර්ෂය තුළදී භාරදී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් වෙත චක්‍රලේඛ නිකුත් කර ඇත. ඉතිරි වූ ලොතරැයිපත් දින 14ක් ඇතුළත මණ්ඩලයට භාරදිය යුතුය. එසේ සිදු නොවන අවස්ථා වලදී බෙදාහැරීමේ අලෙවි නියෝජිතයින් විසින් එම ලොතරැයිපත් අලෙවි කළා සේ ලෙස සලකා එහි විකුණුම් වටිනාකම හා එම දිනුම් ඇදීමට අදාල ඔහුගේ කොමිස් මුදල දණ්ඩනයක් ලෙස මණ්ඩලය අය කර ගනු ලබයි.<br><br>මෙම පොත් සඳහා ද චක්‍රලේඛ ප්‍රකාරව දඩ මුදල් අයකර ඇති අතර, ගංවතුර, සුළි සුළං, ස්වාභාවික ආපදාවන් වැනි සාධාරණ කරුණු මත සිදුකරනු ලබන ඉල්ලීම් සලකා බලා ඉහළ කළමණාකාරීත්වයේ අනුමැතිය සහිතව දණ්ඩනයන් ඉවත් කිරීම්ද අවස්ථා කිහිපයක දී සිදුකර ඇත. |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| (ඉ) තාක්ෂණයේ සිදුවෙමින් පවතින නව්‍යතාවයන් සමඟ අනාගතයේ සියළුම ව්‍යාපාරික කටයුතු භෞතික වෙළඳපල වලින් බැහැරවී මාර්ගගත ක්‍රමයට පරිවර්ථනය වීමට නැඹුරුතාවයක් පවතින කාලයක මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අලෙවිකර තිබූ ලොතරැයිපත් 745,645,051 න් මාර්ගගත ක්‍රමය මඟින් අලෙවි කර තිබුණේ විද්‍යුත් ලොතරැයිපත් 1,119,059 ක් පමණි. එය සමස්ථ අලෙවියෙන් සියයට 0.15 ක් වැනි ඉතා පහළ ප්‍රතිශතයක් විය. | මෙම යෙදුම හඳුන්වා දීමේදී මහ බැංකුව විසින් පැනවූ රීතීවලට අනුව මෙය ක්‍රියාත්මක කළ අතර එම නිසා පාරිභෝගිකයන්හට මෙය හඳුන්වා දීමට මෙන්ම භාවිතා කිරීම අපහසු කාර්යයක් විය. එම නිසා 2024 වර්ෂයෙහි විද්‍යුත් ලොතරැයිපත් අලෙවිය 1,118,871 ප්‍රමාණයක් වේ.<br><br>කෙසේ නමුත් 2024 අනුමත කරගනු ලැබූ අයවැය මගින් අප බලාපොරොත්තු වූ විද්‍යුත් ලොතරැයි අලෙවි ඉලක්කය 1,201,241 කි. ඒ අනුව අපගේ අපේක්ෂිත ඉලක්කය 93.14% ක් සම්පූර්ණ කර ඇත. |
| (ඊ) 2023 නොවැම්බර් 09 දින සිට වෙළඳපලට හඳුන්වාදී තිබූ සුපිරි ධන සම්පත ලොතරැයිපත 2024 නොවැම්බර් 20 දින දක්වාම වර්ෂයකට අධික කාලයක් මාර්ගගත ක්‍රමයට වෙළඳපලට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. 2024 නොවැම්බර් 21 දින සිට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා ලොතරැයිපත් 82,000 ක් අලෙවි නියෝජිතයන් වෙත මාර්ගගත ක්‍රමයට නිකුත්කර තිබූ අතර ඉන් ලොතරැයිපත් 18,225 ක් පමණක් අලෙවි කර තිබූ අතර ලොතරැයිපත් 63,775 ක් හෙවත් 78% ක ප්‍රතිශතයක් ආපසු එවා තිබුණි. | මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ Sweep app ජංගම දුරකථන යෙදුම මගින් ලොතරැයි අලෙවිය අඩු අලෙවියක් මේ වන විට සිදුකරමින් සිටී. එම යෙදුම ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රචාරණය සැලසුම් සකස් කළඳ එම යෙදුමේ පැවති ප්‍රයෝගික තාක්ෂණික ගැටලු නිරාකරණය කරන තෙක් එම ප්‍රවර්ධන කටයුතු අත්හිටුවනු ලදි. කෙසේ නමුත් මේවන විට අදාල යෙදුම කළමණාකරණය කරනු ලබන Epic (එපික්) ආයතනය වඩා ප්‍රයෝගික භාවිතයට පහසුවන ආකාරයට සකස් කරමින් සිටී. |
| (උ) සංවර්ධන ලොතරැයි මණ්ඩලය තුළ සිදුවන ලොතරැයි මෙහෙයුම් හා කළමනාකරණ ක්‍රියාවලිය බාහිර සේවා සැපයුම් ආයතනයක් තුළින් සිදුවන බැවින් එම සමස්ත ක්‍රියාවලිය මණ්ඩලයේ කාර්ය මණ්ඩලය හරහා ඉටුකිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සඳහා 2019 ඔක්තෝබර් 25 දින ජාතික තරඟකාරී ලංසු ක්‍රමය උපයෝගී කරගෙන ලංසු කැඳවා ලංසු ඇගයීමේ කටයුතු ආරම්භ කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට වර්ෂ 05 කට අධික කාලයක් ගතවී ඇතත් එම කටයුතු අවසන් කර නොතිබීම නිසා 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු. 92,541,077 ක මුදලක් ලොතරැයි කළමනාකරණ මෘදුකාංග පද්ධති සේවාව ලබාගැනීම සඳහා බාහිර සේවා සැපයුම් ආයතනයට ගෙවීමට සිදුවී තිබුණි. | මෙම විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි 2020.7.27 දින සිට ලොතරැයි මෙහෙයුම් කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කිරීමේ මූලික ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබුණි.<br><br>එම ප්‍රසම්පාදනය යටතේ දැනට මණ්ඩලයේ ලොතරැයි මෙහෙයුම් ක්‍රියාවලිය සිදුකරනු ලබන ප්‍රධාන LMS මෘදුකාංග පද්ධතියෙන් සිදුවන සියළුම කාර්යයන් හා දැනට Manual සිදු කරන කාර්යයන් Automate කරමින් මණ්ඩලයේ කාර්යයන් කාර්යක්ෂම වන පරිදි නව මෘදුකාංග පද්ධතියක් මණ්ඩලයට එහි හිමිකාරීත්වය හා මෙහෙයවීමේ පහසුකම ලැබෙනසේ ස්ථාපිත කිරීම ඇතුලත්ව තිබුණි. ඒ අනුව එම පද්ධතිය නිර්මාණය කිරීම හා එහි source code මණ්ඩලයට ලැබෙන අයුරින් එම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල අවශ්‍යතාවයන් මෙම ප්‍රසම්පාදන ලියවිලි කට්ටලයට ඇතුලත් කර තිබුණි.<br><br>ඒ අනුව ඊට අදාලව ලංසු කැඳවා තිබූ නමුත් පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී තිබූ මාර්ගෝපදේශ ප්‍රකාරව අදාල මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු එය ක්‍රියාත්මක වීමේදී මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සමඟ සැපයුම්කරුගේ නිලධාරීන් සමගාමීව සේවය කළ යුතු බවට කොන්දේසිගතව එහි විෂයපථය සංශෝධනය විය යුතු බවට පසුව තීරණය කර තිබුණි.<br><br>ඒ අනුව එම කරුණ මෙම ප්‍රසම්පාදනයට අදාල තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කළ අතර ඇගයීම් කමිටුව විසින් එම කරුණු පිළිබඳව අවධානය යොමු කළ අතර එලෙස යෝජිත විෂය පථය සංශෝධනය කිරීම පිළිබඳව කටයුතු කිරීමේදී ඊට අදාලව පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරන ලදී.<br><br>i. මෙම යෝජිත මෘදුකාංග පද්ධතියේ විෂය පථයට අනුව පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු දෛනික මෙහෙයුම් ක්‍රියාවලිය වෙනුවෙන් ඊටම වෙන්කල වෙනමම තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයක්, මණ්ඩලයට සිටිය යුතු බව, (දැනටමත් මෙම සේවා සපයනු ලබන පුද්ගලික සේවා සමාගමේ සය දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්යය මණ්ඩලයක් එම කටයුතු සඳහා පූර්ණකාලීනව සේවයේ යොදවා ඇත). |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | i. මෙම යෝජිත මෘදුකාංග පද්ධතියේ විෂය පථයට අනුව පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු දෛනික මෙහෙයුම් ක්‍රියාවලිය වෙනුවෙන් ඊටම වෙන්කල වෙනමම තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලයක්, මණ්ඩලයට සිටිය යුතු බව, (දැනටමත් මෙම සේවා සපයනු ලබන පුද්ගලික සේවා සමාගමේ සය දෙනෙකුගෙන් යුත් ස්ථිර කාර්යය මණ්ඩලයක් එම කටයුතු සඳහා පූර්ණකාලීනව සේවයේ යොදවා ඇත).<br><br>ii. තෝරාගන්නා සැපයුම්කරු විසින් එම මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වසර කිහිපයක් පූර්ණ කාලීනව මණ්ඩලයේ කාර්යාල පරිශ්‍රයේ සක්‍රීයව සේවය කළ යුතු බව, (ඒ අනුව සැපයුම්කරුගේ ඉන්ජිනේරු කාර්යය මණ්ඩලයේ දෙදෙනකු අවම වශයෙන් වසර 02ක කාලයක් සේවයේ යෙදවීමට අපේක්ෂා කෙරේ).<br><br>iii. මණ්ඩයේ ලොතරැයි මෙහෙයුම් ක්‍රියාවලිය තුළ නිතරම පාහේ විශේෂ ලොතරැයි ටිකට්පත් හඳුන්වාදීමේ විශේෂ ප්‍රවර්ධන වැඩසටහන් පවතින බැවින් මෘදුකාංග නවීකරණ කටයුතු නිරන්තරයෙන්ම සිදු වන බව හා ඊට අනුකූලව change request, enhancement, Bug Fixing සහ තොරතුරු ආරක්ෂණය හා සම්බන්ධ යාවත්කාලීන කිරීම් ඉටු කරගන්නා ආකාරය හා ඒ සඳහා මූලික කොන්ත්‍රාත්තුවට පරිබාහිරව ගෙවීම් සිදු කරනු ලබන ක්‍රමවේදය,<br><br>iv. එවන් අවස්ථා වළදී මණ්ඩලයේ සේවය කරනු ලබන කාර්යය මණ්ඩලයට ඊට ක්ෂණිකව අනුගත විය නොහැකි වන අවස්ථාවල දී මෘදුකාංග පද්ධතිය නිර්මාණය කළ සැපයුම්කරුගේ සේවය ලබා ගැනීම මෙන්ම ඊට අදාලව සැපයුම්කරු හා මණ්ඩලය අතර සේවා ගිවිසුමකට එළඹීමේ අවශ්‍යතාවය,<br><br>v. මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු එලෙස මතුවිය හැකි නවීකරණය කටයුතු ඉටු කර ගැනීම හා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පද්ධතිය ක්‍රියාත්මක කිරීමට හුරු වනතෙක් වසර 02කින් හෝ ඊට වඩා වැඩි කාලයක් මාසික පාරිශ්‍රමික ගෙවීමේ පදනම මත සැපයුම්කරුගේ සම්පූර්ණ සහය අවශ්‍ය වන අතර මේ සඳහා මෘදුකාංග සංවර්ධනය කරනු ලබන කණ්ඩායමේ සේවය අවශ්‍ය වන අතර එම කණ්ඩායම සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා සහ හදිසි තත්ත්ව වලදී අවශ්‍ය කටයුතු කිරීම සඳහා ඉංජිනේරුවන් දෙදෙනෙකු මණ්ඩලය තුළ සිටිය යුතු බව.<br><br>vi. ඒ අනුව ස්ථිර පූර්ණ කාලීනව කාර්ය මණ්ඩලයක් මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී සිටම සේවයේ යෙදවීමට මණ්ඩලයට හැකියාවක් නොමැති නම් මෙම ප්‍රසම්පාදනය ආරම්භ කිරීම නුසුදුසු බව,<br><br>vii. ඒ අනුව යෝජිත මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමට ලංසු කැඳවීමට පෙර මෙම කාර්යයට අදාල තොරතුරු තාක්ෂණ මානව සම්පත් අවශ්‍යතාවය අනුමත කර ගැනීමට ක්‍රියා කිරීම,<br><br>viii. දැනටමත් වෙනත් රාජ්‍ය ආයතනවල මෙවැනි ඉහළ තත්ත්වයේ තොරතුරු තාක්ෂණ කාර්යයන් පුද්ගලික අංශය වෙතින් ඉටු කරගෙන යාම සහ ඒ තුළින් මෙහෙයුම් ක්‍රියාවලියේදී පැන නැඟිය හැකි අවධානම් තත්ත්වයන් මඟ හරවා ගැනීමට වැඩි හැකියාවක් පවතින බව, |

| විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු | කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර |
|---|---|
| | ix. එසේම ඉහත සඳහන් පරිදි සැපයුම්කරුගේ කාර්ය මණ්ඩලයක් මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ කාර්ය මණ්ඩලය සමඟින් යම් කාලයක් තුළ සේවයේ යෙදීය යුතු වුවද ඒ සඳහා අමතර පිරිවැයක් මණ්ඩලයට දැරීමට සිදුවිය හැකි බව,<br><br>විශේෂයෙන්ම 2022 /2023 වර්ෂවල රටේ පැවති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන් තොරතුරු තාක්ෂණ අංශයේ වෘත්තිකයන්ගේ මිල ඉහළ යාම හා පලපුරුදු වෘත්තිකයන් රාජ්‍ය අංශය වෙත ආකර්ෂණය කර ගැනීම හා රඳවා තබා ගැනීමට ඇති අපහසුතාවය හඳුනා ගන්නා ලදී. එවන් තත්ත්වයක් තුළ පළමුව තොරතුරු තාක්ෂණ අංශයේ පූර්ණ මානව සම්පත් අවශ්‍යතාවය නිර්ණය කොට ඊට අදාල පුරප්පාඩු සඳහා නව සේවකයින් බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමෙන් පසු ප්‍රසම්පාදනයට අදාලව කාර්යයන් ඉටු කළ යුතු බවට තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් ප්‍රසම්පාදන අස්ථිත්වයට දන්වන ලදී.<br><br>ඒ අනුව මෙම කරුණු පිළිබඳව 2022 වර්ෂයේ දී මුදල් අමාත්‍යාංශයට වාර්තා කර ඇති අතර එම උපදෙස් ප්‍රකාරව තොරතුරු තාක්ෂණ අංශයේ සහ මානව සම්පත් අවශ්‍යතාවය හා එහි පිරිවැය මෙන්ම වර්තමානයේ මෙම සේවාව පුද්ගලික අංශයෙන් ලබා ගැනීම වෙනුවෙන් වැයවන පිරිවැයද සැලකිල්ලට ගෙන සංසන්දනාත්මක විශ්ලේෂණ වාර්තාවක් 2023.09.26 හා 2023.11.19 දිනවලදී වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.<br><br>එමෙන්ම 2023.02.14 දින මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ මූලිකත්වයෙන් ද මෙම කරුණට අදාල රැස්වීමක් පැවති අතර එහිදී මෙම කරුණු පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කර ඇත.<br><br>ඒ අනුව යෝජිත LMS පද්ධතියට අදාලව ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එම කරුණට අදාලව 2024.01.12 දින මුදල් අමාත්‍යාංශය වෙත දන්වා ඇත.<br><br>ඒ අනුව මීට අදාලව 2024.07.26 දින අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. එමෙන්ම පද්ධතිය ස්ථාපිත කිරීමට අදාලව සිදුකළ පළමු ලංසු කැඳවීමේදී අදාල විෂය පථය තුළින් ඇතුළත්ව තිබූ අයිතමයන් රාශියක් මේ වන විට සංශෝධනයට ලක්වී ඇති අතර එම කරුණු හඳුනා ගෙන ලංසු ලියවිලි කට්ටලයට ඇතුළත් කර ඇති අතර මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට යෝජිත පද්ධතිය පිළිබඳව පුහුණුව හා අවබෝධයෙන් ලැබෙන පරිදි සැපයුම්කාර ආයතනයේ ඉංජිනේරුවරුවන් දෙදෙනෙකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සමඟ සේවයේ යෙදිය යුතු බවට ලංසු කොන්දේසි ඇතුලත් කර ඇත. අනිවාර්යය වසර දෙකක් අවශ්‍යතාවය අනුව සේවා කාලය වසර 05 දක්වා එම සේවා ලබා ගතයුතු ප්‍රතිපාදන ඇතුලත් කර ඇත.<br><br>මෙම කාල සීමාව තුළ පද්ධතියේ නවීකරණ කටයුතු නව කොටස් එකතු කිරීම්, වෙනස් කිරීම් සහ දෛනික කාර්යයන් සඳහා සිදු කරන පද්ධතියේ වෙනස්කම් සිදු කිරීමට ඉතා හොඳ දැනුමැති කණ්ඩායමක් බඳවා ගත යුතුය. රජයේ වැටුප්වලට සාපේක්ෂව එය ඉතාමත් අපහසු කටයුත්තක් වන අතර, මෙම කාල සීමාව ඇතුලත සියළු කටයුතු සඳහා සූදානම් වූ පසු එම ආයතනයෙන් සම්පූර්ණයෙන්ම මෘදුකාංග සංවර්ධනය ඇතුළුව සියළුම කාර්යයන් සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් සිදු කිරීමට භාරගත හැක. |

<table>
<tr><th>විගණකාධිපති වාර්තාවේ සඳහන් කරුණු</th><th>කළමනාකරණ විසින් ගනු ලැබූ පියවර</th></tr>
<tr><td></td><td>ඒ අනුව මේ වන විට එම ප්‍රසම්පාදනයට අදාලව ලංසු කැඳවා ඇති අතර ලංසු විවෘත කිරීම 2025.07.01 දින සිදු කිරීමට නියමිතව ඇත.</td></tr>
<tr><td>(ඌ) මණ්ඩලය විසින් වොක්ෂෝල් වීදියේ අංක 234 දරන ගොඩනැගිල්ල 2006 ඔක්තෝබර් මාසයේ සිට කුලී පදනම මත ලබාගැනීම සඳහා එළඹුණු ගිවිසුම ඒකපාර්ශිකව කඩ කර තිබීම නිසා තැන්පතු මුදල ලෙස ගෙවූ රු.723,780 ක් හා එම වර්ෂයන් සඳහා ගෙවූ කුලී මුදලින් කොටසක් වන රු.4,976,220 ක් යන මුදල්වල එකතුව වන රු.5,700,000 ක් දැනට වර්ෂ 18 ක් මුළුල්ලේ අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.</td><td>වොක්ෂෝල් වීදියේ අංක 234 දරණ ගොඩනැගිල්ල කුලියට ගැනීමට අදාලව මණ්ඩලයට ලැබිය යුතු රු.5,700,000 ක මුදල අය කර ගැනීම සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ කමිටුවක් පත් කර වාර්තාවක් ලබා ගත් අතර එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඉදිරි නීතිමය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරගෙන යනු ලබයි. ඊට අදාල සියලු තොරතුරු මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. අදාල තොරතුරු ලැබුණු බවටද නීතිපති දෙපාර්තමේන්තුව සනාථ කර ඇත. නමුත් මේ සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගවල ප්‍රගතිය නීතිපති දෙපාර්තමේන්තුවෙන් නොලැබුණු බැවින් 2023/07/24 හා 2025/02/21 දිනැතිව නැවත ලිපි යොමු කරමින් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රගතිය විමසා ඇත.</td></tr>
<tr><td>(එ) 1990 වර්ෂයේ වෝඩ් පෙදෙසේ පුද්ගලයෙකු සමග ඇතිකරගෙන තිබූ කුලී ගිවිසුම ප්‍රකාරව රු.2,520,000 ක ගොඩනැගිලි කුලී තැන්පතු මුදලක් අයකර දෙන ලෙස ඉල්ලා අවුරුදු 23 කට පෙර ගොනුකර තිබූ නඩුවේ තීන්දුව 2016 ජනවාරි 11 දින ලැබී තිබුණි. අදාළ මුදල අයකර ගන්නා ලෙස නඩු තීන්දුව ප්‍රකාශ වී වර්ෂ 09 කට ආසන්න කාලයක් ගත වී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එම මුදල අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.</td><td>නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2025.02.24 දිනැතිව ලිපියක් යොමු කරමින් මෙම අධිකරණ ක්‍රියාමාර්ගය සම්බන්ධව ප්‍රගතිය විමසීමට කටයුතු කරන ලදී. එහිදී මෙම නීතිමය කටයුත්ත භාරව රාජකාරී සිදු කරන නීතිඥවරිය ප්‍රකාශ කර සිටියේ මෙම අය කර ගැනීමේ අවසන් කටයුතු වල අවසාන අදියරේ පවතින බැවින් 2025 වර්ෂය අවසන් වීමට ප්‍රථම මෙම මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරන බවයි.</td></tr>
<tr><td>(ඒ) සමාලෝචිත වර්ෂයේ වියදම් අයිතම 07 ක සංශෝධිත ප්‍රතිපාදන ඉක්මවා එකතු වටිනාකම රු.5,735,563 ක වියදම් සිදුකර තිබුණි. එක් එක් අයිතම සැලකීමේදී අයවැයගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් දැරීම 13% සිට 74% ක පරාසයක විය.</td><td>විගණන විමසුමේ පෙන්වා දී ඇති, අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරන ලද වියදම් අයිතම 07 න් වාහන අළුත්වැඩියා වියදමට අදාලව අයවැය ගත ඇස්තමේන්තුව ඉක්මවා ගොස් නොමැති අතර අයවැය ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරන ලද අනෙක් වියදම් අයිතම 06 පහත පරිදි වේ.
<table>
<tr><th></th><th>ප්‍රතිපාදන</th><th>දරන ලද වියදම</th></tr>
<tr><td>ලිපි බෙදාහැරීමේ වියදම් / මුද්දර ගාස්තු</td><td>1,088,024</td><td>1,319,381</td></tr>
<tr><td>කාර්යාල උපකරණ නඩත්තු වියදම්</td><td>2,669,038</td><td>3,253,669</td></tr>
<tr><td>A/C යන්ත්‍ර නඩත්තු වියදම්</td><td>2,628,186</td><td>4,029,404</td></tr>
<tr><td>පුවත්පත් දැන්වීම් වියදම්</td><td>2,022,955</td><td>2,274,816</td></tr>
<tr><td>GPS Tracking වියදම්</td><td>202,877</td><td>278,011</td></tr>
<tr><td>ලොතරැයි පත් පරීක්ෂා කිරීම වෙනුවෙන් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවට සිදු කළ ගෙවීම්.</td><td>150,000</td><td>261,420</td></tr>
</table>
පසුගිය වසර තුළ සේවා මිළ ගණන් නිරන්තර වෙන්ස්වීම් හේතු කොටගෙන අදාල පූර්ව ඇස්තමේන්තු සිදුකිරීමේ දුෂ්කරතාවය මත පරිපාලන වියදම්වලට අදාල ඉහත වියදම් අයිතම 06 හි ප්‍රතිපාදන ඉක්මවා යාම සිදුව ඇතත්, සමස්ථයක් ලෙස මුළු පරිපාලන වියදමේ ඇස්තමේන්තුගත වියදම ඉක්මවා ගොස් නොමැති බව දැනුම් දෙමි.</td></tr>
</table>

# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | 01 | 28,880,477,301 | 25,442,131,713 |
| ලොතරැයිපත් පිරිවැය | 02 | 832,983,406 | 1,147,660,028 |
| ත්‍යාග ගෙවීම | 03 | 15,701,451,624 | 13,450,963,612 |
| දිනුම් ඇදීමේ පිරිවැය | 04 | 910,638,754 | 826,071,896 |
| **දළ ලාභය** | | 11,435,403,517 | 10,017,436,178 |
| වෙනත් ආදායම් | 05 | 248,494,660 | 434,981,322 |
| බෙදාහැරීම් පිරිවැය | 06 | 7,320,020,849 | 6,704,738,408 |
| පරිපාලන වියදම් | 07 | 796,021,766 | 707,503,423 |
| **මෙහෙයුම් වියදම්වලින් පසු අතිරික්තය** | | 3,567,855,562 | 3,040,175,668 |
| මූල්‍ය පිරිවැය | 08 | 984,657 | 663,431 |
| ත්‍යාග ආපසු පවරාගැනීම් | | 630,219,350 | 476,784,240 |
| **බදු පෙර ලාභය** | | 4,197,090,255 | **3,516,296,477** |
| ආදායම් බදු | 09 | 111,163,568 | (106,210,247) |
| **ආදායම් බදු ගෙවීමෙන් පසු ලාභය** | 10 | 4,085,926,687 | **3,622,506,725** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | | (6,259,359) | (5,576,996) |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | (1,249,980) | 1,648,326,333 |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | | 4,078,417,348 | **5,265,256,062** |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ජේ.ඒ.ටී.කේ. ජයසූරිය**
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**නීතිඥ හේමන්ත ස්වර්ණතිලක**
සභාපති/ප්‍ර.වි.නි.

**ඒ. චානක්‍ය ලියනගේ**
අධ්‍යක්ෂ

# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | 11 | | |
| දේපළ, පිරියත සහ උපකරණ | | 2,767,895,680 | 2,703,367,049 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | 2,178,884 | 8,550,596 |
| **අස්පෘශ්‍ය වත්කම්** | 11 | 4,856,012 | 6,130,310 |
| | | | |
| **මුළු ජංගම නොවන වත්කම්** | | 2,774,930,577 | 2,718,047,956 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 54,221,755 | 56,720,455 |
| වෙළඳ ණයගැතියෝ සහ වෙනත් ලැබිය යුතු | 14 | 195,633,999 | 207,964,715 |
| පූර්ව ගෙවීම් සහ තැන්පතු | 15 | 9,494,998 | 4,748,286 |
| ස්ථාවර තැන්පතු | 12 | 1,222,751,286 | 1,710,213,172 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 1,196,185,002 | 767,981,019 |
| **මුළු ජංගම වත්කම්** | | 2,678,287,041 | 2,747,627,647 |
| **මුළු වත්කම්** | | 5,453,217,617 | 5,465,675,603 |
| **ස්කන්ධය සහ වගකීම්** | | | |
| **දායක කළ ප්‍රාග්ධනය** | | | |
| ජනාධිපති අරමුදල | | 2,200,000 | 2,200,000 |
| මහපොළ භාර අරමුදල | | 2,200,000 | 2,200,000 |
| ත්‍යාග සංචිත ගිණුම | | 340,232,474 | 139,106,256 |
| ජනාධිපති අරමුදලට ගෙවිය යුතු | | 193,438,687 | 682,730,725 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 2,267,659,447 | 2,268,909,427 |
| සේවක ප්‍රතිලාභ සැලැස්මේ නැවත මැනීමේ ලාභය/අලාභය | | - | 6,259,359 |
| **මුළු ස්කන්ධය** | | 2,805,730,608 | 3,101,405,767 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක ප්‍රතිලාභ වගකීම් | 17 | 13,363,119 | 9,081,293 |
| ගෙවිය යුතු අලෙවි නියෝජිත බෙදාහැරීමේ සහ අලෙවි නියෝජිත තැන්පතු | 18 | 40,985,881 | 39,875,881 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | 54,349,000 | 48,957,174 |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු | 19 | 833,301,365 | 690,726,582 |
| ගෙවිය යුතු ත්‍යාග | 20 | 1,611,749,784 | 1,456,785,350 |
| ගෙවිය යුතු ණය වට්ටර් | | 148,086,860 | 167,800,730 |
| **මුළු ජංගම වගකීම්** | | 2,593,138,009 | 2,315,312,663 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 5,453,217,617 | 5,465,675,603 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය කොටසක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳී සිටියි. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

**ජේ.ඒ.ටී.කේ. ජයසූරිය**
වැඩබලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**නීතීඥ හේමන්ත ස්වර්ණතිලක**
සභාපති/ප්‍ර.වි.නි.

**ඒ. චානක්‍ය ලියනගේ**
අධ්‍යක්ෂ

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන් | 2024<br>රු. | 2023<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ගලනය** | | | |
| බදු පෙර ලාභය | | 4,197,090,255 | 3,516,296,477 |
| **ගැළපීම්** | | | |
| ස්ථාවර වත්කම් මත අගය ක්ෂය කිරීම | | 109,667,358 | 79,161,279 |
| ත්‍යාග සංචිත ගිණුම | | 201,126,218 | (586,850,033) |
| පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන | | 15,376,459 | 8,722,804 |
| ගෙවන ලද පාර්තෝෂික | | (4,665,373) | (6,884,568) |
| පොලී ආදායම | | (211,897,469) | (399,449,492) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබුණු ලාභය | | 445,128 | (354,582) |
| ආදායම් බදු | | | (106,187,260) |
| ජනාධිපති අරමුදලට ගෙවන ලද | | (4,575,218,725) | (3,255,567,041) |
| | | | |
| **කාරක ප්‍රාග්ධන වෙනස් වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | (268,076,148) | (751,112,417) |
| **මෙහෙයුම් වත්කම්වල වැඩිවීම/අඩුවීම** | | | |
| බඩු තොග වැඩිවීම/අඩුවීම | | 1,722,950 | (10,749,844) |
| ණය ගැතියන් වැඩිවීම/අඩුවීම | | 4,545,434 | (57,711,291) |
| තැන්පතු හා පෙරගෙවුම් වැඩිවීම/අඩුවීම | | (4,746,712) | 1,475,142 |
| **මෙහෙයුම් වගකීම් වැඩිවීම/අඩුවීම** | | | |
| ණය හිමියන් වැඩිවීම/අඩුවීම | | 31,472,953 | 124,681,357 |
| ගෙවිය යුතු ත්‍යාග වැඩිවීම/අඩුවීම | | 154,964,434 | 453,478,836 |
| ණය වවුචර් වැඩිවීම/අඩුවීම | | (19,713,870) | 44,447,170 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලනය** | | (99,830,960) | (195,491,046) |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් මුදල් ගලනය** | | | |
| කාර්ය මණ්ඩලයට ලබා දුන් ණය ලැබීම් | | 20,158,556 | 21,169,588 |
| කාර්ය මණ්ඩලයට ණය ලබාදීම් | | (12,373,274) | (7,288,747) |
| ස්ථාවර වත්කම් එකතු කිරීම් (දේපළ, පිරියත සහ උපකරණ) | | (167,553,921) | (46,909,193) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ ලාභය | | 22,847 | 437,053 |
| පොලී ආදායම | | 211,897,469 | 399,449,492 |
| ස්ථාවර තැන්පත්වල ආයෝජන | | 474,773,267 | 38,216,505 |
| අලෙවි නියෝජිත/බෙදාහැරීමේ නියෝජිත තැන්පතු වල වැඩි වීම | | 1,110,000 | 1,157,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල් ගලනය** | | 528,034,944 | 406,231,698 |
| | | 428,203,984 | 210,740,651 |
| ශුද්ධ මුදල්, මුදල් සහ මුදල් හා සමාන දෑ වැඩිවීම/අඩුවීම | | 428,203,984 | 210,740,651 |
| වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | | 767,981,019 | 557,240,367 |
| වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ | 16 | 1,196,185,002 | 767,981,019 |
| බැංකුවේ ඇති මුදල් ලංකා බැංකුව | | 482,924,160 | 342,627,989 |
| මහජන බැංකුව | | 710,987,703 | 424,314,375 |
| හැටන් නැෂනල් බැංකුව | | 2,263,735 | 1,029,250 |
| | | | |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආපදා අරමුදල | | 9,404 | 9,404 |
| | | 1,196,185,002 | 767,981,019 |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

**2024 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා**

| | ජනාධිපති අරමුදල සහ මහපොළ භාර අරමුදල | තක්සේරු සංචිත ගිණුම | රඳවාගත් ඉපැයීම් | ප්‍රත්‍යාගණන සංචිතය | සේවක ප්‍රතිලාභ සැලසුම් නැවත මිනුම් කිරීම මත ලාභ/පාඩු | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2023.01.01 දිනට ශේෂය | 4,400,000 | 725,956,289 | 315,791,041 | 620,583,095 | 11,836,354 | 1,678,566,779 |
| 2023 වර්ෂය තුළ එකතු කිරීම් | | (586,850,033) | 3,622,506,725 | 1,648,326,333 | (5,576,996) | 4,678,406,029 |
| ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කිරීම 2023 | | | (3,255,567,041) | | | (3,255,567,041) |
| **2023.12.31 දිනට ශේෂය** | **4,400,000** | **139,106,255** | **682,730,725** | **2,268,909,427** | **6,259,359** | **3,101,405,767** |
| 2024 වර්ෂය තුළ එකතු කිරීම් | | 201,126,218 | 4,085,926,687 | (1,249,980) | (6,259,359) | 4,279,543,566 |
| වර්ෂය සඳහා ජනාධිපති අරමුදලට ගෙවීම් | | | (4,575,218,725) | | | (4,575,218,725) |
| **2024.12.31 දිනට ශේෂය** | **4,400,000** | **340,232,474** | **193,438,687** | **2,267,659,447** | **0** | **2,805,730,608** |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 1. වාර්තාකරණ ආයතනය

1997 අංක 20 දරණ සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත යටතේ සංස්ථාගත කරන ලද සංවර්ධන ලොතරැයි මණ්ඩලය, අංක 356, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා මාවත, යූනියන් පෙදෙස, කොළඹ 02 යන ලිපිනයෙහි ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහිතව මෙහෙයුම් සිදු කරයි. ලොතරැයි අලෙවි කිරීම මෙම වර්ෂය තුළ දී මණ්ඩලයේ ප්‍රධානතම ක්‍රියාකාරකම විය.

### 2. සකස් කිරීමේ පදනම

#### 2.1. අනුකූලතා ප්‍රකාශනය

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද, මෙහි මින් මතු SLFRS/LKAS යනුවෙන් හඳුවන්වනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වල සහ පරිපාලන රෙගුලාසි වල සඳහන් නියමයන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

#### 2.2. මිනුම් කිරීමේ පදනම

ස්ථාවර තැන්පතු මත ආයෝජන (සාධාරණ වටිනාකමට මිනිනු ලබන), ඉඩම් සහ ගොඩනැගිලි (ප්‍රත්‍යාගණනය කළ වටිනාකමට) සහ පාරිතෝෂික සඳහා වෙන්කිරීම් (පාරිතෝෂික සූත්‍රය සහ නිර්වචිත ප්‍රතිලාභ බැඳීමෙහි වර්තමාන වටිනාකමට) හැරෙන්නට මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමින් සකස් කරනු ලැබේ.

#### 2.3. ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මෙම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, සියලුම මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.

#### 2.4. නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට 2025 පෙබරවාරි 18 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවසර දී ඇත.

#### 2.5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහ වාර්තා කරනු ලබන වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කළ යුතු වේ. විනිශ්චයන් සහ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ පවතින වාතාවරණයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අපේක්ෂාවන් ද ඇතුළු අනෙකුත් සාධක මත පදනම්ව සිදු කර ඇත. එබැවින් සැබෑ ප්‍රතිඵල මෙම විනිශ්චයන් හා ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වී ඇති උපකල්පන අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරනු ලබන කාල පරිච්ඡේදය තුළ සහ එය බලපාන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයක් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගනු ලැබේ.

#### 2.6. ප්‍රමාණවත් බව හා සමූහනය

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ට අනුකූලව සෑම සමාන අයිතම වර්ගයක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ කාර්යයෙන් අසමාන අයිතම ද ප්‍රමාණාත්මක නම් ඒවා වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. හඳුනාගන්නා ලද ප්‍රමාණයන් හිලව් කිරීම සඳහා නෛත්‍යානුකූලව හිලව් කළ හැකි අයිතියක් ඇති විට සහ ශුද්ධ පදනමකින් පියවීම සඳහා හෝ එක විට වත්කම උපලබ්ධි කර වගකීම පියවීමට අභිප්‍රායයක් ඇති විට පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් හිලව් කර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරනු ලැබේ. කිසියම් ගිණුම්කරණ ප්‍රමිතියක් හෝ අර්ථ නිරූපණයක් මගින් නියම කර හෝ අවසර දී ඇත්තේ නම් මිස, සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල විශේෂිත වශයෙන් අනාවරණය කර ඇති පරිදි, ආදායම සහ වියදම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි හිලව් නොකරනු ලැබේ.

#### 2.7. ආදායම් බදු

මණ්ඩලය ආදායම් බදු වලට සහ එකතු කළ අගය මත බද්ද හා සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සහ රඳවා ගැනීමේ බද්ද ඇතුළු අනෙකුත් බදු වලට යටත් වේ. මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අනුගත කර ගැනීම පිළිපැදීම පිළිබඳ බදු මාර්ගෝපදේශ නිකුත් කරන තුරු ප්‍රවර්තන සහ අනෙකුත් බදු සඳහා වන මුළු ප්‍රතිපාදන පිළිබඳව සහ බදු පැනවීමේ කාර්යය සඳහා බදු අය කළ හැකි ලාභය පිළිබඳව තීරණය කිරීම සඳහා සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේ දී බදු නීති අදාළවීම පිළිබඳ අර්ථ නිරූපණයට අදාළ අවිනිශ්චිතතාවයන් පවතී. 2024 දෙසැම්බර් 31 වන විට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ආදායම් බදු සහ වැට් බදු තක්සේරු 17 ක් ඇත. මණ්ඩලය විසින් අභියාචන ඉදිරිපත් කර විරෝධය දක්වා ඇත. එකී තක්සේරු කිරීම් වලින් විශාල වගකීමක් පැන නොනගිනු ඇති බව මණ්ඩලයේ මතය වේ.

#### 2.8. අඛණ්ඩ භාවය

පූර්වේක්ෂ අනාගතයේදී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මණ්ඩලය සතුව සම්පත් ඇති බවට මණ්ඩලය සෑහීමකට පත්වේ. තවද, ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස මණ්ඩලයට අඛණ්ඩව පැවතීමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳව මණ්ඩලය නොදන්නා අතර, මණ්ඩලය ඈවර කිරීමට හෝ එහි මෙහෙයුම් නතර කිරීමට මණ්ඩලය අදහස් නොකරයි. එම නිසා, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අඛණ්ඩ භාවය පදනම් කර ගෙන අඛණ්ඩව සිදු කරනු ලැබේ.

### 3. වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 3.1. දේපළ, පිරියත සහ උපකරණ

#### 3.1.1. හඳුනා ගැනීම සහ මැනීම

දේපළ, පිරියත සහ උපකරණ යනු සේවා සැපයීම සඳහා හෝ පරිපාලන කාර්යයන් සඳහා තබා ඇති ස්පෘශ්‍ය අයිතම වන අතර ඒවා එක් කාල පරිච්ඡේදයකට වඩා වැඩි ගණනක් තුළ භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

**(අ). හඳුනා ගැනීම**

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලය වෙත ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් ඒවා දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ.

**(ආ). දේපළ, පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ජීවිත කාලය සහ ප්‍රත්‍යාගණනය**

සෑම වාර්තාකරණ දිනයක දී ම මණ්ඩලය වත්කම්වල අවශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ජීවිත කාල සහ අගය ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කරයි. මෙම අගයන්, අනුපාත සහ ක්‍රම තක්සේරු කිරීමේදී කළමනාකාරිත්වයේ

විනිශ්චය ක්‍රියාත්මක කරනු ලබන අතර, එබැවින් ඒවා අවිනිශ්චිතතාවයකට භාජනය වේ. 2024 වර්ෂයේ දී මණ්ඩලය පරිපූර්ණ සමාලෝචනයක් සිදු කළේ ය.

**(ඇ). මැනීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතම සමුච්චිත ක්ෂයවීම් අඩු කර පිරිවැයට හෝ තක්සේරු කළ අගයට සඳහන් කරනු ලැබේ.

වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් පිරිවැය යන්නට ඇතුළත් වේ. ස්වයංව ඉදිකරන ලද වත්කම්වල පිරිවැයට එම ඉදිකිරීම සඳහා යොදා ගත් ද්‍රව්‍යවල සහ සෘජු ශ්‍රමයෙහි පිරිවැය, එම වත්කම එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාත්මක තත්වයකට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි අනෙකුත් වියදම් සහ භාණ්ඩ කොටස් වලට ගලවා ඉවත් කර ඒවා පිහිටා තිබූ භූමිය යළි යථා තත්ත්වයට පත් කිරීමේ පිරිවැය ඇතුළත් වේ.

වත්කම් වලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ යථා තත්ත්වයට පත් කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා දේපළ, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම හෝ නඩත්තු කිරීම සඳහා දරනු ලබන වියදම් එම වියදම් දරනු ලැබූ විට වියදමක් ලෙස හඳුනා ගෙන ඇත.

**(ඈ) පසුකාලීන වියදම්**

ප්‍රධාන පරීක්ෂා කිරීමේ සහ අලුත්වැඩියා වියදම් ද ඇතුළුව වෙන වෙනම ගිණුම් ගත කර ඇති දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක උපාංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරනු ලබන වියදම ප්‍රාග්ධනිත කරනු ලැබේ. යම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒමේ හැකියාව තිබේ නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකි නම්, එම අයිතම කොටස ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය අයිතමයේ ධාරණ අගයෙහි හඳුනාගෙන ඇත. ප්‍රතිස්ථාපනය කරනු ලැබූ කොටසෙහි ධාරණ අගය ඉවත් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල එදිනෙදා සේවා පිරිවැය දරන ලද පිරිවැයක් ලෙස ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගෙන ඇත.

**(ඉ) අගය ක්ෂය කිරීම**

දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල සෑම කොටසකම ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය මත අගය ක්ෂය කිරීම සරල රේඛීය පදනමක් මත ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනා ගනු ලැබේ. වත්කම්වල ඇස්තමේන්තු කළ ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත සඳහන් පරිදි වේ:

| | |
|---|---|
| ගොඩනැගිලි/මැදිරිය | 10% |
| ලිඛඩු සහ සවිකිරීම් | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| යන්ත්‍රසූත්‍ර | 12.5% |
| මෝටර් වාහන/ත්‍රීරෝද රථ | 20% |
| පරිගණක සහ උපාංග සන්නාම කරන ලද | 33.33% |
| අලෙවි කුටි | 16.66% |
| යතුරුපැදි | 25% |
| යෙදවුම් මෘදුකාංග | 33.33% |
| ජංගම දුරකථන | 50% |

වත්කමක් භාවිතයට ගත හැකිවන පරිදි මණ්ඩලය සතුව තිබෙන දිනයේ සිට එම වත්කම බැහැර කරන දිනය දක්වා හෝ එම වත්කමෙහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා මණ්ඩලය එම වත්කමෙහි අගය ක්ෂය කිරීම සිදු කරයි.

යම් අස්පෘශ්‍ය වත්කමකට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ මණ්ඩලයට ගලා ඒම සිදු විය හැකි නම් සහ එම වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් එවැනි අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලැබේ. අදාළ දෘඩාංගයට සංකලිත ලෙස සම්බන්ධ නොවන, පැහැදිලිව හඳුනාගත හැකි, විශ්වාසනීය ලෙස මැනිය හැකි සහ අනාගත ආර්ථික ප්‍රතිලාභ ගෙන දීමට හේතු විය හැකි, මණ්ඩලය විසින් භාවිතා කරනු ලැබීමට බලය ලබා දී ඇති සියලුම පරිගණක මෘදුකාංග වල පිරිවැය ශේෂ පත්‍රයේ අස්පෘශ්‍ය වත්කම් කාණ්ඩය යටතේ ඇතුළත් කර, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ පාඩු අඩු කළ පිරිවැයට ඉදිරියට ගෙන යනු ලැබේ.

**(ඊ). දේපළ, පිරියත සහ උපකරණ පොත්වලින් ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ බැහැර කරනු ලැබූ විට හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කරනු ලැබීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ කිසිවක් ලැබෙතැයි අපේක්ෂා නොකර විට දේපළ, පිරියත සහ උපකරණ පොත් වලින් (දේපළ, පිරියත සහ උපකරණ වලින්) ඉවත් කළ යුතු ය. බැහැර කිරීමෙන් ලැබෙන ආදායම සහ බැහැර කරනු ලබන දිනය වන විට වත්කමෙහි ධාරණ අගය අතර වෙනස බැහැර කිරීමෙන් ලැබුණු ලාභය හෝ පාඩුව ලෙස හඳුනා ගනු ලැබේ. මෙම ලාභය හෝ පාඩුව ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබන අතර, බැහැර කිරීමෙන් උපයා ගන්නා මුදල ආදායම ලෙස හඳුනා නොගත යුතු ය.

### 3.2. බඩු තොග

බඩු තොගවල පිරිවැයට එම තොග අත්පත් කර ගැනීම සඳහා දරන ලද වියදම් සහ ඒවා පවතින ස්ථානයට හා තත්වයට ගෙන ඒම සඳහා දරන ලද අනෙකුත් වියදම් ඇතුළත් වේ. ඒ අනුව, බඩු තොග වල පිරිවැය පහත දක්වා ඇති පරිදි ගණනය කරනු ලැබේ:

| | |
|---|---|
| ලග්න වාසනා | සත්‍ය පිරිවැයට |
| ශනිදා | සත්‍ය පිරිවැයට |
| ජයෝදා | සත්‍ය පිරිවැයට |
| ක්ෂණික | සත්‍ය පිරිවැයට |
| කප්රුක | සත්‍ය පිරිවැයට |
| සුපිරි ධන සම්පත | සත්‍ය පිරිවැයට |
| සුපර් බෝල් | සත්‍ය පිරිවැයට |
| අද කෝටිපති | සත්‍ය පිරිවැයට |
| සසිරි | සත්‍ය පිරිවැයට |

අනෙකුත් තොග අයිතම පිරිවැය කිරීම සඳහා පෙර පිවිසි පෙර නිකුතු පදනම යොදා ගෙන ඇත.

2024 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී රු. 443,609 ක් වටිනා ක්ෂණික ටිකට්පත් බඩු තොග වල භෞතිකව නොතිබූ අතර ශුද්ධ උපලබ්ධි අගයක් නොතිබුණි. මෙම ටිකට්පත් පෙර අවසාන තොග ශේෂයන්හි ඇතුළත්ව තිබුණි. ඒ අනුව, එහි ශුද්ධ උපලබ්ධි අගයට බඩු තොග ගැළපීම පිණිස කපා හැරීමක් වාර්තා කරන ලදී. මෙම ගැළපීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 2 (LKAS 2) සමග අනුකූලතාවය සහතික කරන අතර මණ්ඩලයේ බඩු තොග වල තත්ත්වය නිවැරදිව පිළිබිඹු කරයි.

### 3.3. වගකීම් සහ ප්‍රතිපාදන

#### 3.3.1. වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ ඉල්ලූ විට ගෙවීමට නියමිතව ඇති හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඇතුළත ගෙවිය යුතු වන වගකීම් වේ. ජංගම නොවන වගකීම් වන්නේ ශේෂ පත්‍ර දිනයේ සිට වසරකට පසු ගෙවිය යුතු ශේෂයන් වේ.

#### 3.3.2. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි වර්තමාන නෛතික හෝ සම්මුතික බැඳීමක් ඇත් නම්, සහ එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි නම් ඒ සඳහා ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ.

**මණ්ඩලය විසින් පවරන ලද නඩු**

(අ). WP/HCCA/COL/160/2004/F1 - මණ්ඩලය විසින් එම්.ඒ.එම්. අමීන් මහතාට එරෙහිව නඩුවක් ගොනු කර ඇත. අධිකරණය මණ්ඩලයට පක්ෂව තීන්දුවක් ලබා දී ඇත. එම පුද්ගලයාගෙන් රුපියල් 2,520,000 ක මුදලක් අය කර ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. මෙම විත්තිකරු මිය ගොස් ඇති බැවින්, මියගිය පුද්ගලයා වෙනුවට ඔහුගේ පුත්‍රයා සහ බිරිඳ ආදේශ කිරීම සඳහා අධිකරණයට ලේඛන ගොනු කර ඇත. මෙම නඩුව දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි.

(ආ) නඩු අංකයː DMR/04781/2021 - PB-6024 අංක දරණ වාහනය නැතිවීම හේතුවෙන් වන්දි ඉල්ලා සිටීමට නීතිපති දෙපාර්තමේන්තුව නීතිමය කටයුතු ආරම්භ කර ඇත. මෙම නඩුව දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි. මණ්ඩලය PB-6024 අංක දරන වාහනය රුපියල් 8,095,000 ක වටිනාකමකින් යුත් හිමිකාරිත්වය පිළිබඳ පැහැදිලි සාක්ෂි සහිතව මණ්ඩලයේ නමින් ලියාපදිංචි කර ඇති බැවින් එය එහි ගිණුම්වල සටහන් කර ඇත. පවතින නීතිමය කටයුතු සැලකිල්ලට ගෙන, මණ්ඩලයේ මූල්‍ය වාර්තාවල වාහනය සටහන් කිරීම වඩාත් සුදුසු ක්‍රියාමාර්ගයයි. මෙම අවස්ථාවේදී වාහනය පොත් වලින් කපා හැරිය නොහැකි අතර, අවසාන අධිකරණ තීන්දුව මත කාරණය සමාලෝචනය කර නැවත තක්සේරු කරනු ලැබේ.

